මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

පිටුව

ගිණුම් හා බැංකු කටයුතු	I
ව්‍යවහාර මුදල් නිකුතුව	VI
බැංකු සංවර්ධන	VI
බැංකු අධීක්ෂණය	VIII
බැංකු නොවන මූල්‍යආයතන	IX
සංවර්ධන මුදල්	X
ග්‍රාමීය ණය	XVII
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු	XX
ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය	XXI
සේවක අර්ථසාධක අරමුදල	XXII
විනිමය පාලන	XXII
රාජ්‍ය ණය	XXII
ප්‍රාදේශීය කාර්යාල - මාතර, අනුරාධපුර සහ මාතලේ	XXV
ලේකම් දෙපාර්තමේන්තුව	XXVI
ප්‍රවෘත්ති සහ ප්‍රකාශණ	XXVI
පර්යේෂණ කටයුතු	XXVI
සමීක්ෂණ හා දත්ත එක් රැස් කිරීම	XXVII
දත්ත සැකසුම්	XXVII
පුහුණු කිරීම්	XXVIII
කළමණාකාරීත්ව විගණන	XXVIII
පරිශ්‍ර	XXVIII
සුභසාධනය	XXIX
ආරක්ෂක සේවා	XXIX
කාර්ය මණ්ඩල පුවත්	XXIX

මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

ගිණුම් හා බැංකු කටයුතු

1995 වර්ෂය අවසානය වන විට මහ බැංකුවේ මුළු වත්කම්/ වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 173,505 ක් වී පෙර වර්ෂයට වඩා සියයට 11.3 ක වර්ධනයක් වාර්තා කළේය. 1995 දෙසැම්බර් මස 31 දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා 1995 දෙසැම්බර් මස 31 න් අවසන් වූ වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම II.1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

වත්කම් අංශයෙහි බැංකුවේ ජාත්‍යන්තර සංචිත රුපියල් දශලක්ෂ 95,282 සිට රුපියල් දශලක්ෂ 105,647 දක්වා සියයට 10.9 කින් ඉහළ ගියේය. මුළු වත්කම්වල ජාත්‍යන්තර සංචිත දැරූ කොටස 1994 දී සියයට 61.1 සිට 1995 දී 60.9 දක්වා අඩු වුවද තවදුරටත් විශාලතම වත්කම් කාණ්ඩය ලෙස පැවතුනි. බැංකුවේ දේශීය වත්කම් රුපියල් දශලක්ෂ 31,755 සිට රුපියල් දශලක්ෂ 39,950 දක්වා සියයට 25.8 කින් වැඩිවිය.

දේශීය වත්කම් අතර රජයට දුන් ණය හා අත්තිකාරම් සහ රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් පිළිවෙලින් සියයට 5.9 කින් හා සියයට 145.6 කින් ඉහළ ගියේය. ශුද්ධ ආපසු ගෙවීම් හා අක්‍රිය ණය සඳහා වූ ප්‍රතිපාදන හේතුකොටගෙන වාණිජ බැංකු හා අනෙකුත් ණය දෙන ආයතනවලට වූ මධ්‍යම හා දිගුකාලීන ණය පහසුකම් සියයට 16.8 කින් පහත වැටුණි. 1995 වර්ෂයේදී වාණිජ බැංකුවලට වූ කෙටිකාලීන අත්තිකාරම්ද සියයට 15.1 කින් පහත වැටුණි.

වගකීම් අංශයෙහි, සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් රුපියල් දශලක්ෂ 43,081 සිට රුපියල් දශලක්ෂ 46,685 දක්වා සියයට 8.4 කින් ඉහළ ගියේය. බැංකුවේ වත්කම් හා වගකීම්වල ප්‍රධාන අංශ සැසඳීමක් II..2 සංඛ්‍යා සටහනෙහි දැක්වේ. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය යටතේ තැන්පතු වගකීම් වෙනුවෙන් වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු සහ ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන විසින් කරන ලද තැන්පතු වලින් සමන්විත මුළු තැන්පතු රුපියල් දශලක්ෂ 61,023 සිට රුපියල් දශලක්ෂ 73,020 දක්වා සියයට 20.2 කින් ඉහළ යැමක් වාර්තා කළේය. තැන්පතු, වගකීම්වල විශාලතම කාණ්ඩය වී මුළු වගකීම්වලින් සියයට 42.3 ක් විය. මෙම කාණ්ඩය තුළ, වාණිජ බැංකුවල තැන්පතු සියයට 28.3 කින් වැඩි වූ අතර, එයට වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම්වල ඉහළයාම හේතු විය. ජාත්‍යන්තර ආයතන, විදේශ රාජ්‍ය හා විදේශීය බැංකු ආයතනවල තැන්පතු සියයට 13.3කින් ඉහළ ගියේය.

1994 දී රුපියල් දශලක්ෂ 25,680ක් වූ බැංකුවේ මුළු දළ ආදායම 1995 දී රුපියල් දශලක්ෂ 22,502ක් විය. එමෙන්ම 1994 දී රුපියල් දශලක්ෂ 24,280 ක්වූ බැංකුවේ මුළු දළ වියදම, 1995 දී රුපියල් දශලක්ෂ 20,802ක් විය. බැංකුවේ මුළු ආදායමෙන් සියයට 85.4 ක් පමණ විදේශීය සංචිත ආයෝජනය තුලින් ඉපැයූ අතර, දේශීය ගණුදෙනු වලින් ඉපැයූ පොළී ආදායම මුළු ආදායමෙන් සියයට 7.4 ක් පමණ විය. වියදම් සංචිත ගිණුම් සඳහා වෙන් කිරීම් සහ ක්ෂය සඳහා වෙන්කිරීම් හා අනෙකුත් අය කිරීම් වෙනුවෙන් ප්‍රතිපාදන ද වෙන් කළ පසු ශේෂ වූ ශුද්ධ ලාභය වන රුපියල් දශලක්ෂ 1,700 මුදල් නීති පනතේ 39(ඇ) වගන්තිය අනුව ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා රජයට ගෙවීම පිණිස වෙන් කෙරුණි.

ගණකාධිකරණ ප්‍රතිපත්ති

පොදු

ඓතිහාසික පිරිවැය පදනම මත හා පොදුවේ පිළිගැණුන ගණකාධිකරණ මූලධර්මයන්ට අනුකූලව මේ සමග ඇති ශේෂ පත්‍රය හා ලාභාලාභ ගිණුම පිළියෙල කර ඇත.

විදේශීය ව්‍යවහාර මුදල් පරිවර්තනය

විදේශීය ව්‍යවහාර මුදල් වලින් පවත්වාගෙන යනු ලබන වත්කම් හා වගකීම්, ශේෂ පත්‍ර දිනට බලපැවැත්වුනු මධ්‍ය විනිමය අනුපාතිකයට අනුව පරිවර්තනය කර ඇත.

ආයෝජන

සියලුම ආයෝජන පිරිවැය අනුව අගය කර ඇත.

අත්තිකාරම්

ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති අත්තිකාරම්, මූල්‍ය සමාගම් වලින් අය විය යුතුව ඇති අක්‍රිය ණය වෙනුවෙන් ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසුව වන ශුද්ධ ශේෂය වේ.

ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් දක්වා ඇත්තේ ඒවායෙහි පිරිවැය වටිනාකමෙන් ක්ෂය කිරීම් අඩු කිරීමෙනි. පහත දැක්වෙන අනුපාතිකයනට අනුකූලව හීනවන ශේෂ ක්‍රමය යටතේ ක්ෂය කිරීම් ගිණුම් ගත කර ඇත.

අයිතමය	ප්‍රතිශතය
ගොඩනැගිලි	සියයට 2
සවිකිරීම් සහ උපකරණ	සියයට 10
කාර්යාලීය ලී බඩු සහ උපකරණ	සියයට 10
මෝටර් රථ	සියයට 10
කුඩා පරිගණක	සියයට 25

වර්ෂය තුලදී මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂයටම ක්ෂය සඳහා ප්‍රතිපාදනය කරනු ලබන අතර, වර්ෂය තුලදී ස්ථාවර වත්කම් විකුණනු ලබන හෝ ඉවත් කරනු ලබන අවස්ථාවන්හි එකී වත්කම් සඳහා එම වර්ෂය වෙනුවෙන් ක්ෂය සඳහා ප්‍රතිපාදනයන් සලසා නැත.

තොග

ලිපි ද්‍රව්‍ය හා ඉංජිනේරු ගබඩා අයිතම වෙනුවෙන් වර්ෂය තුලදී දරනු ලැබූ සම්පූර්ණ පිරිවැය ලාභාලාභ ගිණුමට හර කර ඇති අතර, වර්ෂය අවසානයේ ඇති තොග සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර නොමැත.

අයහාර ගණනය

මුදල් පදනමක් මත ගණනය කර ඇති අක්‍රිය ණය වෙනුවෙන් වූ පොළී හැරුණ විට අනෙකුත් පොළී හා ආදායම් උපචිත පදනමක් මත පොත්වල සටහන් කර ඇත.

මහ බැංකු සුරැකුම්පත් මත වූ වට්ටම් හා අධි මිල

වර්ෂය තුල නිකුත් කරන ලද මහ බැංකු සුරැකුම්පත් සම්බන්ධව දුන් වට්ටම් හා ලැබූ අධිමිල එම සුරැකුම්පත්

11-1 සංඛ්‍යා සටහන
1994.12.31 වැනි දින හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ

වගකීම්

1994 දෙසැම්බර් මස 31 දින			1995 දෙසැම්බර් මස 31 දින	
		ප්‍රාග්ධන ගිණුම		
1,50,00,000		ප්‍රාග්ධනය	1,50,00,000	
98,50,00,000	100,00,00,000	අතිරික්තය	98,50,00,000	100,00,00,000
		සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්		
4,149,61,02,836		නෝට්ටු	4,488,61,01,205	
158,49,59,668	4,308,10,62,504	කාසි	179,84,01,234	4,668,45,02,439
		තැන්පතු		
		රජය	303,93,94,202	
281,23,22,857		රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන	4,88,79,581	
14,16,39,414		වෙළෙඳ බැංකු	3,185,268,5,006	
2,483,21,27,774		ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා බැංකු		
3,243,01,15,310		ආයතන	3,67,42,536,986	
		භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු: 37,064,000/-		
11,99,835		හැර අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල	7,39,368	
80,52,89,256	6,102,26,94,446	අනෙකුත්	163,54,64,646	7,331,96,99,789
		මධ්‍යම හා දීර්ඝ කාලීන		
	492,50,00,000	ණය අරමුදල		492,50,00,000
	56,02,50,000	ප්‍රාග්ධන දායක දීමනා ගිණුම		560,190,000
	374,00,00,000	ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්		-
	4,162,84,92,604	අනෙකුත් වගකීම් හා ගිණුම්		4,701,61,55,976
	15,595,74,99,554			17,350,55,48,204

1995 දෙසැම්බර් මස 31 දිනෙන්

1994		1995
2,427,98,78,851	සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂය කිරීම් ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන් කිරීම්	2,080,24,18,205
1,40,00,00,000	**වර්ෂයේ ශුද්ධ ලාභය** මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට	1,70,00,00,000
2,567,98,78,851		2,250,24,18,205

ඒ.එස්. ජයවර්ධන
අධිපති

එම්. බී. දිසානායක
ප්‍රධාන ගණකාධිකාරී

1995.12.31 දිනවල
ශේෂ පත්‍රයන් සැසඳීම

රුපියල්

වත්කම්

1994 දෙසැම්බර් මස 31 දින			1995 දෙසැම්බර් මස 31 දින	
		ජාත්‍යන්තර සංචිතය		
1,261,76,30,949		පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂ	3,968,19,17,863	
8,264,75,83,119*		විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත්	6,591,63,11,198*	
1,65,41,327	9,528,17,55,395	විශේෂ ආපසු ගැනීම් හිමිකම්	486,29,262	10,564,68,58,323
		දේශීය වත්කම්		
2,271,88,99,947		ණය සහ අත්තිකාරම් රජයට	2,405,30,99,947	
330,41,88,300		අනෙකුත් අයට මධ්‍යම හා දීර්ඝ කාලීන	275,01,93,526**	
7,22,30,621		කෙටි කාලීන	6,13,26,176	
509,95,46,732		රජයේ සහ රජය සහතික කල සුරැකුම් පත්	1,252,51,89,273	
56,02,50,000	3,175,51,15,600	මූල්‍ය සහ අනෙකුත් ආයතන වලට දායක දීමනා	56,01,90,000	3,994,99,98,922
	2,892,06,28,559	**අනෙකුත් වත්කම් හා ගිණුම්**		2,790,86,90,959
	15,595,74,99,554			17,350,55,48,204

*1964 පෙබරවාරි මස 01 දින රුː 55,27,675/- ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 දින රුː57,450/- ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතන වලින් ලබාගත් සුරැකුම්පත් ඇතුලත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙළින් රුː29,33,697/- ක් සහ රුපියල් 34,340/- ක් විය.)

** රුපියල් දශලක්ෂ 100.0 ක විශේෂ ණයමුදලින් පියවා නොමැති ප්‍රමාණය ඇතුලත් වෙයි. පියවිය යුතුව ඇති ණය ප්‍රමාණයෙන් අයකරගත නොහැකි ණය සඳහා රුපියල් 89,04,56,091 ක් ප්‍රතිපාදන අඩුකර ඇත.

අවසන් වූ වර්ෂයේ ලාභා ලාභ ගිණුම

රුපියල්

1994		1995
2,567,98,78,851	පොළී ආදිය	2,250,24,18,205
2,567,98,78,851		2,250,24,18,205

විගණකාධිපති සංඥාපනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ 1995 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 42 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. එකී මුදල් නීති පනතේ 42 (2) වගන්තිය ප්‍රකාර මුදල් අමාත්‍යවරිය වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

1996 අප්‍රේල් මස 23 දින.
කොළඹ 7.
විගණකාධිපති දෙපාර්තමේන්තුව

එස්. සී. මායාදුන්න
වැඩබලන විගණකාධිපති

II - 2 සංඛ්‍යා සටහන
1994 සහ 1995 මුදල් වර්ෂයන්ගේ අවසාන දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් හා වගකීම්වල වූ ප්‍රධාන අයිතමයන් සැසඳීම

අයිතමය	වගකීම්				අයිතමය	වත්කම්			
	1994		1995			1994		1995	
	රුපියල් දශලක්ෂ	%	රුපියල් දශලක්ෂ	%		රුපියල් දශලක්ෂ	%	රුපියල් දශලක්ෂ	%
ප්‍රාග්ධනය සහ අතිරික්තය	1,000	0.6	1,000	0.6	ජාත්‍යන්තර සංචිතය	95,282	61.1	105,647	60.9
සංසරණයේ පවත්නා ව්‍යවහාර මුදල්	43,081	27.6	46,685	26.9	දේශීය වත්කම්	31,755	20.4	39,950	23.0
තැන්පතු	61,023	39.1	73,320	42.3	අනෙකුත් වත්කම්	28,921	18.5	27,909	16.1
මධ්‍යම හා දිගු කාලීන ණය අරමුදල	4,925	3.2	4,925	2.8	1. නිකුත් කරන ලද ඇපකර				
ප්‍රාග්ධන දායක දිමනා ගිණුම	560	0.4	560	0.3	වෙනුවෙන්				
මහ බැංකු සුරකුම්පත්	3,740	2.4	-	-	තැන්පත්කරුවන්ගේ වගකීම්	17,307	11.1	16,255	9.4
අනෙකුත් වගකීම්	41,629	26.7	47,016	27.1	2. වෙළෙඳ බැංකුවල විදේශීය				
1. නිකුත් කරන ලද ඇපකර	17,307	11.1	16,255	9.4	ව්‍යවහාර මුදල්				
2. පාලන ගිණුම් සංචිත	9,178	5.9	11,623	6.7	තැන්පතු ගිණුම	2,776	1.8	3,040	1.8
3. විශේෂ හැර ගිණුම් හිමිකම් ලැබීම්	4,939	3.2	5,547	3.2	3. ලැබිය යුතු මුදල් (පූර්ව				
4. ජාත්‍යන්තර සංචිත ප්‍රත්‍යා ගණනය					ගෙවීම් සහ ලැබීමට				
ගිණුම	1,940	1.2	2,583	1.5	ඇති පොලී)	1,884	1.2	2,146	1.2
5. ලාභාලාභ ගිණුම	2,554	1.6	4,444	2.6	4. හුවමාරුවෙමින්				
6. ආසියානු නිෂ්කාෂණ සංගම් ගිණුම	3,228	2.1	1,511	0.9	පවතින මුදල්	1,517	1.0	646	0.4
7. වෙනත්	2,482	1.6	5,053	2.8	5. වෙනත්	5,438	3.4	5,823	3.3
එකතුව	**155.958**	**100.0**	**173.506**	**100.0**	**එකතුව**	**155.958**	**100.0**	**173.506**	**100.0**

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පරිණත වීමේ දිනය සැලකිල්ලට නොගෙන වර්ෂය සඳහා වූ ලාභාලාභ ගිණුමෙහි ඇතුලත් කර ඇත.

ශුද්ධ ලාභය

ලාභාලාභ ගිණුමෙහි පෙන්වා ඇති ශුද්ධ ලාභය සියලුම වියදම් හර කිරීමෙන් හා පහත සඳහන් අයිතම සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් අනතුරුව වේ.

1. අක්‍රිය ණය සඳහා ප්‍රතිපාදන
11. ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන
111. අනෙකුත් අවශ්‍ය ප්‍රතිපාදන සහ මුදල් නීති පනතේ 38 වන වගන්තිය අනුව සංචිත සඳහා වෙන් කිරීම්.

මහ බැංකු පොළී අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී අනුපාතිකය, වර්ෂයකට සියයට 17 ක් වශයෙන් නොවෙනස්ව පැවැතිණි.

කෙටිකාලීන ණය

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය හා අපනයන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ වාණිජ බැංකු වෙත ලබා දුන් ප්‍රතිමූල්‍ය ණය පිළිවෙලින් 1994 අප්‍රේල් සහ මැයි මාසවල සිට නවතා දමන ලදී. එසේ වුවද, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය නවතා දැමීමට පෙර වාණිජ බැංකු විසින් එම ක්‍රමය යටතේ ගොවීන්ට දුන් උපලේඛනගත ණය සඳහා එම උපලේඛනගත ණය මත, ප්‍රතිමූල්‍ය පහසුකම් වාණිජ බැංකුවලට තවදුරටත් සලසන ලදී. මෙම පහසුකම් යටතේ, 1994 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 72.2 ක්වූ නොපියවා පැවැති ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය, 1995 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 61.3 ක් විය.

මැදි හා දිගුකාලීන ණය

1995 වර්ෂය තුලදී මැදි හා දිගුකාලීන ණය අරමුදල, රුපියල් දශලක්ෂ 4,925ක් වශයෙන් නොවෙනස්ව පැවැතිණ. මුදා හරින ලද ණය අඩු කළ පසු, වර්ෂය තුලදී ආපසු ගෙවන ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 214 ක් විය.

මූල්‍ය සමාගම් සඳහා පහසුකම්

1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනතේ 20(4) (අ) සහ 21(1) වගන්ති ප්‍රකාර දුෂ්කරතාවයකට පත් මූල්‍ය සමාගම් සඳහා ණය පහසුකම් සැලසීම මහ බැංකුව විසින් නොකඩවා කර ගෙන යන ලදී. 1995 දී මෙම පහසුකම් යටතේ මුදා හරින ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 172 ක් වූ අතර, 1995 වර්ෂය අවසාන වන විට නොපියවා පැවැති මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2,472 ක් විය.

සංචිත අවශ්‍යතා

වාණිජ බැංකුවල තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව වර්ෂය මුළුල්ලේම නොවෙනස්ව පැවතිණ. වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් සඳහා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සියයට 15ක් වූ අතර, වාණිජ බැංකු ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කර ඇති විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු වගකීම් වෙනුවෙන් සංචිත අවශ්‍යතා අනුපාතය සියයට 5 ක් විය. වාණිජ බැංකුවල අනෙකුත් විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු වගකීම් සඳහා වන සංචිත අවශ්‍යතා අනුපාතය සියයට 15 ක් විය.

විවිට වෙළඳපොළ කටයුතු

ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ

ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළෙහි 1994 වර්ෂය තුළදී රුපියල් බිලියන 21.2 ක්වූ භාණ්ඩාගාර බිල්පත් අලෙවිය 1995 වර්ෂය තුළදී රුපියල් බිලියන 17 දක්වා අඩුවිය. එම කාලය තුළදීම මෙම වෙළඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම් රුපියල් බිලියන 18.9 සිට රුපියල් බිලියන 35.3 දක්වා වැඩි විය. ද්විතියික වෙළඳපොළෙහි අලෙවිය පහළ මට්ටමක පැවැතිමට මූලික වූයේ, කෙටිකාලීන ආයෝජන, භාණ්ඩාගාර බිල්පත්, ද්විතියික වෙළෙඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම් වෙළඳපොළට මාරු වීම සහ මහ බැංකු සුරැකුම්පත් අලෙවිය වේ.

වර්ෂය තුළදී, මාස තුනකින් කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් සඳහා වන ද්විතියික වෙළෙඳපොළෙහි පැවති ඵලදායිතා අනුපාතය වර්ෂයකට සියයට 12.99 සහ 19.66 අතර පැවතුණි.

භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රතිමිලදී ගැනීම් වෙළෙඳපොළ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ, භාණ්ඩාගාර බිල්පත් අලෙවිය, 1995 වර්ෂය තුළදී තවදුරටත් කරගෙන යන ලදී. මෙම ක්‍රමය යටතේ 1995 වර්ෂයේ විකුණනු ලැබූ භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම රුපියල් බිලියන 197.6 කි. ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම යටතේ, එක් දිනක ප්‍රතිමිලදී ගැනීම් ඵලදා අනුපාතය, වර්ෂය මුලදී සියයට 19 ක් වූ අතර, එය මාර්තු මාසය අවසානය වන විට සියයට 12 ක් දක්වා ක්‍රමයෙන් පහත වැටුණි. කෙසේ වෙතත් වර්ෂය අවසානය වන විට වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයෙහි හිඟයක් ඇතිවීමත් සමඟ එක් දින මිලදී ගැනීමේ අනුපාතය, 1995 දෙසැම්බර් වන විට සියයට 16.5 දක්වා ඉහළ ගියේය.

භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකිණුම් ගිවිසුම්

ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පොළී අනුපාතිකයන්ගේ අවිධිමත් උච්චාවචනයන් පාලනය කිරීම පිණිස, 1995 නොවැම්බර් 10 දින සිට භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකිණුම් පහසුකම් හඳුන්වා දෙන ලදී. මේ මගින් ඒක්ෂණ වෙළඳපොළේ දැඩි ද්‍රවශීලතා ඌනතාවයක් ඇති අවස්ථාවක, ප්‍රමාණවත් මුදල් වෙළඳපොළට යොමු කිරීමක් අපේක්ෂා කෙරේ. ස්ථාවර භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් ගණුදෙනු කිරීමේ නියැලී සිටින, ප්‍රාථමික වෙළඳුන් වන වාණිජ බැංකු වලින් මිල කැඳවීම් ලබා ගැනීම තුලින් භාණ්ඩාගාර බිල්පත් ප්‍රති විකුණුම් පහසුකම ක්‍රියාත්මක වූ අතර එසේ ප්‍රතිවිකුණුම් සඳහා යොමුකරන ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ මහ බැංකුවේ විවෘට වෙළෙඳපොළ කටයුතු පිළිබඳ මෙහෙයුම් කමිටුව විසිනි.

මහ බැංකුව නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුළ, රුපියල් බිලියන 11 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් මෙම ක්‍රමය යටතේ ඉදිරිපත් කරනු ලැබූ අතර, රුපියල් බිලියන 7.6 සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන් පිළිගන්නා ලදී. කෙසේ වුවද වෙළඳපොළෙහි ලාභ අපේක්ෂාවෙන් කරන ගණුදෙනු සහ ව්‍යුහගත කරුණු නිසා ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි 1995 අගභාගයේදී දක්නට ලැබුණු පොළී අනුපාතිකයන්ගේ දැඩි විචලතාවය සමනය කිරීමට මෙම ක්‍රමය ප්‍රමාණවත් නොවිය. මෙම කාලය තුළ මිල ගණන් පිළිගන්නා ලද නිකුතුවලට අදාල බර තබන ලද සමාන්‍ය ඵලදා අනුපාතිකය විශාල වශයෙන් උච්චාවචනයට භාජනය විය. මෙය මූල්‍ය වෙළඳ පොළේ ඇති දැඩි චංචලතාවය නිරූපනය කරයි. දෙසැම්බර් මස අවසාන භාගයේ දී, බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය කැපී පෙනෙන ලෙස වැඩි වූ අතර, 1995 දෙසැම්බර් 22 වන දින එය සියයට 50 ක් විය. රජය විසින් ගෙවීම් ප්‍රමාද කිරීම හේතු කොටගෙන රාජ්‍ය බැංකු දෙක මගින් සපයන ලද මුදල් අඩුවීම සහ වණික් බැංකු හා දිගුකාලීන ණය දෙන ආයතනවල ඉහළ ණය ගැනීම මූල්‍ය වෙළඳපොළේ ඌණ ද්‍රවශීලතාවයට ප්‍රධාන වශයෙන් හේතු විය.

මෙරට හැර යන ඉන්දියානුවන් සඳහා වූ සහනාධාර සහ කරුණාසහගත ගෙවීම්

1964 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සම්භවයෙන් පැවත එන වතු කම්කරුවන් ආපසු යැවීම සම්බන්ධ ගෙවීම් ක්‍රම රජය වෙනුවෙන් මහ බැංකුව විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. 1994 රුපියල් 112,786 හා සසඳා බලන කල 1995 දී මෙම යෝජනා ක්‍රමය යටතේ වූ මුළු සහනාධාර ගෙවීම් රුපියල් 323,232 ක් විය. මේ අතර 1994 දී වූ රුපියල් 32,175 හා සසඳන විට 1995 දී කරන ලද කරුණාසහගත ගෙවීම් ප්‍රමාණය රුපියල් 39,600 ක් විය.

අපනයනකරුවන් සම්බන්ධයෙන් වූ ආනයන තීරුබදු ප්‍රතිදාන

අපනයනකරුවන්ට ගෙවන ලද ආනයන තීරුබදු සඳහා වාණිජ බැංකු මගින් ඉදිරිපත් කරන ලද හිමිකම් ප්‍රතිපූර්ණය කිරීම රජය වෙනුවෙන් මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. 1994 දී ගෙවූ රුපියල් දශලක්ෂ 840 හා සසඳා බලන කළ 1995 දී ප්‍රතිපූර්ණය කරන ලද මුළු මුදල රුපියල් දශලක්ෂ 923 ක්විය.

විදේශ විනිමය කටයුතු

මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රුපියලට එරෙහිව ඇ.එ.ජ. ඩොලරයට සම්බන්ධ ඉදිරි විනිමය මිලට ගැනීම් ඇතුළුව එතැන් ගැණුම් සහ විකුණුම් මගින් විදේශ විනිමය ගණුදෙනු කටයුතු වර්ෂය තුළදී කරගෙන යන ලදී. එමෙන්ම බැංකුව විසින් සිය විදේශ විනිමය සංචිත ජාත්‍යන්තර මුදල් සහ ප්‍රාග්ධන වෙළෙඳපොළවල ආයෝජනය කිරීමද තවදුරටත් කරගෙන යන ලදී.

1995 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු වලින් මිලදී ගන්නා ලද විදේශ මුදල්වල මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 19,187ක් වූ අතර, වාණිජ බැංකුවලට විකුණන ලද විදේශ මුදල්වල වටිනාකම් රුපියල් දශලක්ෂ 436ක් විය. 1994 වර්ෂයේදී මිලදී ගන්නා ලද හා විකුණන ලද මුළු විදේශීය මුදල් ප්‍රමාණයන්හි වටිනාකම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 31,452ක් හා රුපියල් දශලක්ෂ 615ක් විය.

රන් සහ රිදී අලෙවිය

මහ බැංකුව විසින් සිය ප්‍රධාන කාර්යාලයෙහි රන් සහ රිදී අලෙවිය තවදුරටත් කරගෙන යන ලදී. 1994 වර්ෂයේ

II-3 සංඛ්‍යා සටහන
විදේශීය විනිමය ගණුදෙනු 1995
(රුපියල් දශලක්ෂ)

මාසය	එතැන් ගැනුම්	එතැන් විකුණුම්	ඉදිරි විනිමය ගැනුම්
ජනවාරි	1,257	-	-
පෙබරවාරි	2,355	-	-
මාර්තු	2,905	-	-
අප්‍රේල්	1,367	-	-
මැයි	1,589	-	-
ජූනි	-	-	-
ජූලි	532	438	
අගෝස්තු	3,551	-	-
සැප්තැම්බර්	811	-	-
ඔක්තෝබර්	1,242	-	-
නොවැම්බර්	2,231	-	-
දෙසැම්බර්	1,348	-	-
එකතුව	**19.187**	**438**	-

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් දශලක්ෂ 12.1ක් වූ ප්‍රධාන කාර්යාලය විසින් අලෙවි කරන ලද රන්වල වටිනාකම හා සසඳා බලන කල 1995 වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 9.6ක් විය. 1995 වර්ෂයේදී රිදී අලෙවියෙහි මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 0.4ක් වූ අතර, 1994 වර්ෂය සඳහා එය රුපියල් දශලක්ෂ 0.2ක් විය.

ආසියානු නිෂ්කාශණ සංගමය

ආසියානු නිෂ්කාශණ සංගමය තුලින් කෙරුනු ගණුදෙනු ප්‍රමාණයේ මුළු වටිනාකම පසුගිය වර්ෂයේ පැවැති රුපියල් දශලක්ෂ 37,195 හා සසඳා බලන කල 1995 දී රුපියල් දශලක්ෂ 39,030ක් විය. 1994 වර්ෂයේ විදේශීය මුදල් වලින් කෙරුණු ශුද්ධ පියවීම්වල රුපියල් වටිනාකම වන රුපියල් දශලක්ෂ 13,834ක් හා සසඳන විට 1995 දී රුපියල් දශලක්ෂ 18,028ක් විය. 1996 ජනවාරි මස සිට සාමාජික රටවල් අතර සිදුවන ගණුදෙනු, ඇ.එ.ජ.ඩොලරය මගින් නිරවුල් කිරීමේ නව ක්‍රියාමාර්ගයක් සාමාජික රටවල බලධාරින්ගේද කැමැත්ත මත ආසියානු නිෂ්කාශණ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල

දයකයන් 4 දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා රුපියල් දශලක්ෂ 0.06ක් (පොළිය ඇතුළුව) බැංකුව විසින් වර්ෂය තුලදී ගෙවන ලදි.

රජයේ ගිණුම්

1994 වර්ෂය තුළ ක්‍රියාත්මක වෙමින් පැවති ගිණුම් සංඛ්‍යාව 178 ක් වූ අතර 1995 දෙසැම්බර් වන විට එය 164 ක් විය.

විදේශීය මූල්‍ය

සමාලෝචිත වර්ෂය තුලදී මහ බැංකුව විසින් රජය වෙනුවෙන් විවිධ විදේශ ණය සහ ප්‍රදාන යටතේ මුදා හරින ලද ණය මුදල් ලබා ගැනීම සහ විදේශීය ණය ආපසු ගෙවීම් තවදුරටත් කරගෙන යන ලදී.

ව්‍යවහාර මුදල් නිකුතුව

ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් ඉටු කළ කාර්යභාරය 1995 වර්ෂය තුලදී ද මහ බැංකුව තව දුරටත් ඉටු කරන ලදී. 1994 වර්ෂය අවසානය වන විට රුපියල් දශලක්ෂ 43,081ක්ව පැවති ව්‍යවහාර මුදල් ප්‍රමාණය 1995 වර්ෂය අවසානය වන විට රුපියල් දශලක්ෂ 46,685ක් දක්වා ඉහළ ගියේය. සංසරණයෙහි පැවති මුළු ව්‍යවහාර මුදල් ප්‍රමාණයෙන් සියයට 96ක් නෝට්ටු වලින් සමන්විත විය.

සංසරණයෙහි පවතින ව්‍යාවහාර මුදල් නෝට්ටුවල ප්‍රමිතිය උසස් කිරීම සඳහා පිරිසිදු මුදල් නෝට්ටු නිකුත් කිරීමේ වැඩපිළිවෙල 1995 වර්ෂයේදී තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. ව්‍යවහාරයට නුසුදුසු නෝට්ටු සංසරණයෙන් ඉවත් කර ඒ වෙනුවට නව නෝට්ටු නිකුත් කිරීමේ ක්‍රියාවලිය වර්ෂය මුළුල්ලේම ක්‍රියාත්මක විය. 1992 දී ආරම්භ කරන ලද මුදල් පරීක්ෂා කිරීමේ, ගණනය කිරීමේ සහ තේරීමේ ක්‍රමය, පිරිසිදු මුදල් නෝට්ටු නිකුත් කිරීමේ වැඩපිළිවෙල කඩිනම් කිරීම සඳහා, 1995 වර්ෂය මුළුල්ලේම ක්‍රියාත්මක විය. පරණ සහ අළුත් මෝස්තරවල ශ්‍රී ලංකා මුදල් නෝට්ටු නිකුත් කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර දෙකක් 1995 වර්ෂයේදී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවට ලැබුණි.

ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ පනස්වෙනි සංවත්සරය සැමරීම සඳහා බැංකුව විසින් රුපියල් දෙකක වටිනාකමෙන් යුතු වූ සාමාන්‍ය සංසරණය සඳහා වන කාසියක්, 1995 ජූලි මාසයේදී නිකුත් කරන ලදී. එසේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පනස්වෙනි සංවත්සරය සැමරීම සඳහා ද රුපියල් පහක වටිනාකමෙන් යුතු වූ සමරු කාසියක් 1996 වර්ෂයේදී නිකුත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු පිළියෙල කරන ලදී.

1992 දී ආරම්භ කරන ලද ජංගම මුදල් ප්‍රදර්ශණය 1995 දී තවදුරටත් පවත්වාගෙන යන ලදී. ශ්‍රී ලංකාවේ කාසි සහ නෝට්ටු ද වෙනත් විවිධ රටවල මුදල් නෝට්ටුවල ප්‍රදර්ශණ ද මෙම ජංගම ප්‍රදර්ශණවල දී ප්‍රදර්ශණය කරනු ලැබිය.

බැංකු සංවර්ධන

බැංකු ක්‍රමයට අදාල ප්‍රතිපත්ති සහ වාණිජ බැංකු, වාණිජ බැංකුවල ශාඛා හා විශේෂිත බැංකු පිහිටුවීම සම්බන්ධයෙන් බැංකු පණතේ විධිවිධාන ක්‍රියාවට නැංවීම හා මූල්‍ය උපකරණ හඳුන්වා දීම සඳහා වන යෝජනා ඇගයීමද බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට ඇතුළත් වේ. තවද, මෙම දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු අධීක්ෂණයටත් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට අදාල ප්‍රතිපත්ති සම්පාදනයටත් දායක වෙයි. එමෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ ඒවායේ කටයුතු අධීක්ෂණයද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

1995 වර්ෂය තුළ වාණිජ බැංකු අංශයේ ඇති වූ සංවර්ධනයෙහිලා කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ නව දේශීය වාණිජ බැංකු දෙකක් හා විදේශීය බැංකුවක ශාඛාවක් ආරම්භ කරනු ලැබීමය. 1988 දී සී/ස සෙලාන් බැංකුව පිහිටුවීමෙන් වසර 7 කට පසුව මෙසේ ස්ථාපනය කරන ලද දේශීය වාණිජ බැංකු දෙක වූයේ සී/ස කොළඹ යූනියන් බැංකුව හා පැන්ඒෂියා බැංකුවයි. කොරියානු එක්ස්චේන්ජ් බැංකුවේ කොළඹ ශාඛාව ආරම්භ කිරීම ද මෙම වසරේදී සිදු වූ අතර, එය පබ්ලික් බෑන්ක් බර්හාඩ් බැංකුවෙහි කොළඹ ශාඛාව 1992 දී ආරම්භ කිරීමෙන් වසර තුනකට පසුව දිවයින තුළ පිහිටුවන ලද

විදේශීය බැංකු ශාඛාව විය. මෙසේ වාණිජ බැංකු අළුතින් ආරම්භ කිරීමෙන් පිළිඹිබු වනුයේ රට තුළ සිදුවන ආර්ථික වර්ධනයත්, ඉදිරි ආර්ථික වර්ධනය පිළිබඳව හා දළ දේශීය නිෂ්පාදිතය තුල බැංකු අංශයේ දායකත්වය වර්ධනය වීම මෙන්ම බැංකු අංශයේ ඉදිරි වර්ධනය සඳහා පවතින විභවතාවයන් පිළිබඳව ඇති විශ්වාසයත්ය.

1994 වර්ෂය අවසානයේදී සංවර්ධන බැංකු හා ඉතිරි කිරීමේ බැංකුද ඇතුලත්ව මුළු බැංකු ආයතන සංඛ්‍යාව 44ක් වූ අතර, 1995 දී නව වාණිජ බැංකු ඇරඹීමත් සමග එය 47 දක්වා වර්ධනය විය. ඒ අනුව, 1995 වර්ෂය අවසානයේදී සමස්ථ බැංකු ක්‍රමය, වානිජ බැංකු 26 කින් (දේශීය වාණිජ බැංකු 8 කින් හා විදේශීය වාණිජ බැංකු 18 කින්), ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැ.) 17 කින්, සංවර්ධන බැංකු තුනකින් හා එක් ඉතිරි කිරීමේ බැංකුවකින් සමන්විත විය.

බැංකු ශාඛා පද්ධතිය පුළුල්වීම

1995 වර්ෂය තුල මුදල් මණ්ඩලයේ අනුමැතිය ඇතිව බැංකු ශාඛා පද්ධතිය, 1,199 දක්වා (සියයට 4 කින්) ප්‍රසාරණය විය. බැංකු ශාඛා පද්ධතියේ ප්‍රසාරණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

1995 දී, ලංකා බැංකුව විසින් අහුන්ගල්ල හා අනුරුගිරිය යන ස්ථානවල, නව ශාඛා දෙකක් ආරම්භ කරන ලදී. එමෙන්ම ගලෙන්බිදුණුවැව, හොරොව්පතාන, ඉපලෝගම, මැදවච්චිය, තිරප්පනේ, යටවත්ත, පදවිපරාක්‍රමපුර, මීගල්ලැව සහ දොඩංගොඩ පිහිටි කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා "සී" ශ්‍රේණියේ බැංකු ශාඛා තත්ත්වයට උසස් කෙරුණි. තවද, ලංකා බැංකුව විසින් කොළඹ පිහිටි ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවෙහි හා ආයෝජන මණ්ඩල කාර්යාලයන්හි නව අනුබද්ධිත කාර්යාල දෙකක් ආරම්භ කරන ලදී. මේ අතර, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ පිහිටි අපනයන වෙළඳ මධ්‍යස්ථානයේ පවත්වාගෙන ගිය

II- 4 සංඛ්‍යා සටහන
බැංකු ආයතන පද්ධතියේ සංයුතිය සහ ශාඛා වර්ගීකරණය 1990-1995

වර්ගීකරණය	1990	1991	1992	1993	1994	1995*
1. ආයතන සංඛ්‍යාව	40	42	43	44	44	47
1.1 වාණිජ බැංකු	24	23	23	23	23	26
1.1.1 දේශීය	6	6	6	6	6	8
1.1.2 විදේශීය	18	17	17	17	17	18
1.2 ප්‍රා.ග්‍රා.සං.බැං. (අ)	12	15	16	17	17	17
1.3 ඉතිරිකිරීම් බැංකු	1	1	1	1	1	1
1.4 සංවර්ධන බැංකු (සං.බැං.)	3	3	3	3	3	3
2. බැංකු ශාඛා සංඛ්‍යාව (ආ)	924	973	1,058	1,102	1,150	1,199
2.1 වාණිජ බැංකු ශාඛා	747	768	818	854	891	932
2.1.1 දේශීය වාණිජ බැංකු ශාඛා	724	743	789	821	855	895
(i) ප්‍රධාන ශාඛා	638	656	699	733	763	796
(ii) කෘෂිසේවා මධ්‍යස්ථාන ශාඛා	38	36	34	29	28	19
(iii) කච්චේරි ශාඛා	23	24	24	24	23	23
(iv) අනුබද්ධිත කාර්යාල/ගෙවීම් කාර්යාල/උකස් මධ්‍යස්ථාන**	23	25	30	33	39	51
(v) විදේශීය ශාඛා (ඇ)	2	2	2	2	2	4
2.1.2 විදේශීය බැංකු ශාඛා	23	25	29	33	36	37
2.2 ප්‍රා.ග්‍රා.සං.බැංකු ශාඛා	101	124	156	163	169	171
2.3 ජා.ඉ.බැං. ශාඛා	76	81	84	85	90	96
3. සංවර්ධන බැංකු ආයතන ශාඛා/කාර්යාල (ඈ)	6	7	7	6	7	7
3.1 ලංකා සංවර්ධන මූදල් සංස්ථාව	3	3	3	3	4	4
3.2 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	2	3	3	2	2	2
3.3 ජාතික සංවර්ධන බැංකුව	1	1	1	1	1	1

(අ) 1985 අංක 15 දරණ ප්‍රා.ග්‍රා.සං.බැං. පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රා.ග්‍රා.සං. බැංකු

(ආ) සමූපකාර ග්‍රාමීය බැංකු ඇතුලත් නොවේ.

(ඇ) ලංකා බැංකුවේ විදේශ ශාඛා 4 (ලන්ඩන්, මාලේ, මදුරාසිය සහ කරච්චි)

(ඈ) සංවර්ධන බැංකු ආයතනවල මූලස්ථාන කාර්යාල සහ ශාඛා ඇතුලත් වේ.

** මහජන බැංකුව, ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව සහ සම්පත් බැංකුවේ අනුබද්ධිත කාර්යාල/ගෙවීම් කාර්යාල සහ උකස් මධ්‍යස්ථාන ඇතුළුව සංශෝධනය කරන ලදී.

* තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බැංකුවේ අනුබද්ධිත කාර්යාලය මෙම වර්ෂය තුලදී වසා දැමූ අතර, ලංකා බැංකුව විසින් මදුරාසියේ හා කරච්චියේ සිය විදේශීය ශාඛා දෙකක් ආරම්භ කරන ලදී.

1995 වර්ෂයේදී, මහජන බැංකුව විසින් නව ශාඛාවක් දෙහිවලදී ආරම්භ කරනු ලැබිය. එමෙන්ම කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පිවිසුම් ප්‍රදේශයෙහි, ගාලු මුවදොර පිහිටි හමුදා මූලස්ථානයෙහි, ජාවත්තේ පිහිටි ශ්‍රී ලංකා විදේශීය සේවා නියුක්ති කාර්යාංශයෙහි සහ අළුත්කඩේ පිහිටි නීති සංගම් ගොඩනැගිල්ලෙහි මහජන බැංකුවේ නව සේවා කවුන්ටරයන් විවෘත කෙරුණි. තවද බැංකුව විසින් ස්වර්ණාභරණ උකස් මධ්‍යස්ථාන 08ක් බලවන්තලාව, ඉඹුල්දෙණිය, කොටුවේගොඩ (මාතර), කහතුඩුව, ගොනටුව, තලවතුගොඩ, පොල්පිතිගම සහ අනුරාධපුර යන ස්ථානවල අළුතින් ආරම්භ කරන ලදී.

සී/ස හැටන් නැෂනල් බැංකුව විසින් 1995 වර්ෂයේදී නව ශාඛා 7ක් මඩකලපුව, පංචිකාවත්ත, අම්පාර, ගල්කිස්ස, මහරගම, පින්නවල සහ සූරියවැව යන ස්ථානවල විවෘත කරණු ලැබිය. එමෙන්ම වර්ෂය තුලදී නවලෝක රෝහලෙහි ද බැංකුවේ ගෙවීම් කාර්යාලයක් විවෘත කෙරුණි. සී/ස සෙලාන් බැංකුවේ නව ශාඛාවන් 7 ක් වත්තල, වවුනියාව, මඩකලපුව, කාත්තන්කුඩි, අවිස්සාවේල්ල, නාවලපිටිය, කැකිරාව යන ස්ථානවල මෙම වර්ෂය තුලදී විවෘත කරන ලදී. අළුත්ගම හා කඩුවෙල නව ශාඛා දෙකක් අරඹමින්, සී/ස ලංකා වාණිජ බැංකුවෙහි ශාඛා පද්ධතිය තවදුරටත් පුළුල් කරන ලදී. සම්පත් බැංකුවද, 1995 වර්ෂයේදී අනුරාධපුර, කුලියාපිටිය හා අවිස්සාවේල්ල යන ස්ථානවල නව ශාඛා අරඹමින් සිය ශාඛා ප්‍රමාණය වර්ධනය කරනු ලැබිය.

1995 වර්ෂය තුලදී මීරිගම (ගම්පහ ප්‍රා.ග්‍රා.සං.බැං.)හා නාවලපිටිය (මහනුවර ප්‍රා.ග්‍රා.සං.බැං.) යන ස්ථානවල ශාඛා ඇරඹීමත් සමඟම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා පද්ධතියටද නව ශාඛා දෙකක් එක්විය.

මෙම වර්ෂය තුළ, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ නව ශාඛා 6 ක් තිස්සමහාරාමය, කඩුවෙල, වේයන්ගොඩ, ඇල්පිටිය, කටුබැද්ද හා දිවුලපිටිය යන ස්ථානවල ආරම්භ කෙරුණි.

ජංගම බැංකු මධ්‍යස්ථාන

බැංකු සේවා පහසුකම් නොමැති හෝ එවැනි සේවාවන් ප්‍රමාණවත් නොවන ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ බැංකුමය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හා රාජ්‍ය බැංකු දෙක විසින්ද පුද්ගලික වාණිජ බැංකු විසින්ද 1995 වර්ෂයේදී ජංගම බැංකු සේවා නොකඩවා පවත්වාගෙන යනු ලැබිය.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිහිටුවීම

වාණිජ බැංකු විසින් සිය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පද්ධතිය පුළුල් කිරීම 1995 වර්ෂයේදීද නොකඩවා සිදුකරන ලදී. ලංකා බැංකුවෙහි මාතර, ගාල්ල, ගාල්ල කඩවීදිය සහ අනුරාධපුර ශාඛාවල හා ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පරිශ්‍රයෙහි පිහිටි අනුබද්ධිත කාර්යාලයෙහිද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සවිකිරීම මේ වර්ෂයේදී සිදුවිය. මහජන බැංකුව විසින් ප්‍රධාන කාර්යාලයේ හා පිළියන්දල ශාඛාවෙහි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිහිටුවනු ලැබුණි. හැටන් නැෂනල් බැංකුව විසින් සිය මහරගම ශාඛාවෙහි සහ මැජස්ටික් වෙළඳ සංකීර්ණයෙහි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම් සපයන ලදී. අළුත්ගම, කඩුවෙල, පිටකොටුව, කුරුණෑගල සහ මෝදර පිහිටි සී/ස ලංකා කොමර්ෂල් බැංකුවේ ශාඛාවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සවිකිරීමද මෙම වර්ෂයේදී සිදු කෙරිණි. සී/ස සම්පත් බැංකුව සිය අනුරාධපුරය, අවිස්සාවේල්ල සහ කුලියාපිටිය ශාඛාවලට ස්වයංක්‍රීය ටෙලර් සේවා පහසුකම් සපයන ලදී. සී/ස සෙලාන් බැංකුව ගල්කිස්ස, මහනුවර, කිරිබත්ගොඩ සහ ගම්පහ පිහිටි සිය ශාඛාවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 4ක් සවිකරන ලදී. කොළඹ කොටුව, කොල්ලුපිටිය, කිරුළපන හා මහනුවර පිහිටි සිය ශාඛාවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සවිකරමින් අදාල ශාඛාවල ගණුදෙනුකරුවන්ට ටෙලර් සේවා පහසුකම් සැපයීමට ඒ එන් ඉසෙඩ් ග්‍රින්ලේස් බැංකුව විසින් පියවර ගනු ලැබිණි.

බැංකු අධීක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බැංකු ආයතන පාලනය සහ අධීක්ෂණය කිරීමේලා මහ බැංකුව උසුලන කාර්යභාරය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබයි. දිවයිනේ සියළුම වාණිජ බැංකු කාලීනව පරීක්ෂා කිරීමෙන් සහ අඛණ්ඩව අධීක්ෂණය කිරීමෙන් මෙම කාර්යය ඉටු කෙරේ. අධීක්ෂණ කාර්යයේ ප්‍රධාන අරමුණ වන්නේ බැංකු ක්‍රමයෙහි සුරක්ෂිත බව සහ ස්ථාවරත්වය ඇති කිරීම තුලින් තැන්පත් කරුවන්ගේ අයිතීන් ආරක්‍ෂා කිරීම සහ මහජන විශ්වාසය තහවුරු කිරීමය.

මෙකී වගකීම් සමුදාය ක්‍රියාවට නැංවීම ස්ථානීය හා ස්ථානීය නොවන පරීක්ෂණයේ දී කටයුතු තුලින් ක්‍රියාත්මක කෙරේ. ස්ථානීය අධීක්ෂණයේ දී මෙම දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ නිලධාරීන් අදාල බැංකුව වෙත ගොස් එහි වත්කම් සංයුතිය, වැඩ කටයුතු, කළමණාකරණය, ප්‍රාග්ධන අවශ්‍යතා, ද්‍රවශීලතාවය සහ පාලන ක්‍රම තක්සේරු කිරීම තුලින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ඇගයීමක් කෙරේ. ව්‍යවස්ථාපිත අවශ්‍යතා වලට අනුකූලව බැංකු විසින් කටයුතු කරන්නේදැයි වගබලා ගැනීම ද බැංකු අධීක්ෂණයෙහි විශේෂිත කාර්ය භාරයකි. විමසුමට ලක්වන වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව මගින් වාණිජ බැංකු 11 ක ද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 1 ද එවැනි පරීක්ෂණ කටයුතු ආරම්භ කෙරිණි. මේවායින් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවෙහි සහ වාණිජ බැංකු 07 ක පරීක්ෂන කටයුතු ද, 1995 වර්ෂයේදී නිම කෙරිණි. 1994 වර්ෂයේදී ආරම්භ කරන ලද වාණිජ බැංකු 7 ක අධීක්ෂණ කටයුතු ද, 1995 වර්ෂයේදී නිම කෙරිණි.

ස්ථානීය නොවන අධීක්ෂණ කටයුතු යටතේ දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු වලත්, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වලත් මූල්‍ය තත්ත්වය එම බැංකු මගින් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මාසික වත්කම් හා බැරකම් ප්‍රකාශ මත අඛණ්ඩව නිරීක්ෂණය කෙරිණි. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය යටතේ පිහිටුවන ලද විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල කටයුතුද, මාසික පදනමක් මත නිරීක්ෂණය කෙරිණි. වාණිජ බැංකුවල අත්තිකාරම්වල ප්‍රමාණය සහ එහි තත්ත්වය අධ්‍යයනය සඳහා අවිධිමත් සහ විශාල ප්‍රමාණයේ අත්තිකාරම් පිළිබඳ තොරතුරු ද කාර්තුමය පදනමක් මත ලබා ගැනේ. එක් එක් වාණිජ බැංකුවේ මෙන්ම සමස්ත බැංකු අංශයේම ලාභදායිත්වය සහ මූල්‍යමය ශක්තිය, බැංකු මගින් සපයන ලද මාසික වත්කම් හා බැරකම් ප්‍රකාශන සහ ආදායම් හා වියදම් පිළිබඳ වාර්ෂික ප්‍රකාශන උපයෝගී කරමින් ගණනය කොට අගයනු ලැබිණි.

බැංකු පනත යටතේ අදාල ව්‍යවස්ථාපිත නියමයන් සහ බැංකුවල විධිමත් අවශ්‍යතා පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අනෙකුත් උපදෙස් වාණිජ බැංකු මගින් තරයේ ක්‍රියාත්මක කරන බවට වග බලා ගැනීම දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණි. මේවාට අවම ද්‍රවශීල වත්කම් සහ අවදානම් මත බර තබන ලද වත්කම් පදනම් වූ අවම ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගෙන යාම, එක් ණය කරුවෙකුට දිය හැකි උපරිම ණය සීමා පිළිපැදීම, අධ්‍යක්ෂවරුන්ට සහ ඔවුන්ට සම්බන්ධ අයට අත්තිකාරම් සැපයීම පිළිබඳ සීමාවන්

අනුගමනය කිරීම, ව්‍යවස්ථාපිත කාලය තුළ නිර්දේශිත ගිණුම් ආකෘති අනුව වාර්ෂික මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම, අක්‍රිය ණය සඳහා පොලී වෙන් කිරීම සහ බොල් හා අඩමාන ණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කිරීම යානාදිය ඇතුළත් විය. අදාල වර්ෂය තුලදී වාණිජ බැංකු වලින් වැඩි ප්‍රමාණයක ද්‍රවශීල වත්කම් මට්ටම, විශේෂිත බැරකම් වලින් සියයට 20 (අවමය) සිට සියයට 30 දක්වා වූ පරාසයක් තුළ පවත්වා ගැනිණි. බාසල් (BASLE) කමිටුවෙහි නිර්දේශිත නියමයන් මත පදනම්වූ මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් ද මෙකී බැංකු විසින් පවත්වා ගෙන යන ලදී. අවදානම් මත බර තබන ලද මුළු වත්කම් වලින්, වාණිජ බැංකු විසින් පවත්වා ගත යුතු මූලික ප්‍රාග්ධනය (ගෙවා නිමි ප්‍රාග්ධනය හා පොදු සංචිත) සහ මුළු ප්‍රාග්ධනය පිළිවෙලින් සියයට 4 හා සියයට 8 කට නොඅඩු මට්ටම් දෙකකින් පවත්වා ගත යුතුය යන්න මෙකී අවශ්‍යතාවයේදී ඇතුළත් වේ.

1987 සිට ක්‍රියාත්මක වන තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය දෙපාර්තමේන්තුව මගින් නොකඩවා පරිපාලනය කරන ලදී. මෙකී යෝජන ක්‍රමය යටතේ ලියාපදිංචි ආයතන සංඛ්‍යාව 8 ක් වන අතර, ගෙවිය යුතු රක්ෂණ වාරිකය එක් කාර්තුවකට රුපියල් සියයකට ශත 3.75 ක් වශයෙන් තවදුරටත් පැවතිනි.

බැංකු පනත සංශෝධනය කිරීම.

ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අත්‍යාවශ්‍ය වූ, බැංකු පනතට අදාළ සංශෝධන 1995 නොවැම්බර් මස දී පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරිණි. මෙම සංශෝධනයන් තුළ සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සමාන පදනමක් ඇති කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණ බලතල පුළුල් කිරීමේ විධිවිධාන අඩංගුවේ. මෙකී සංශෝධන මගින් ඇති කරන ලද ප්‍රධාන වෙනස්කම් පහත දැක්වේ.

- බලපත්‍රලාභී වාණිජ බැංකුවල අංකිත ගිණුම් පවත්වාගෙන යාම සඳහා වූ විධිවිධාන අවලංගු කරන ලදී. කෙසේ වෙතත්, දැනටමත් විවෘත කර ඇති ගිණුම් සඳහා පොළිය හැර, වෙනත් බැර කිරීමක් නොකර පනත් සංශෝධන බලපවත්වන දිනයේ සිට වර්ෂ දෙකක් යනතුරු පවත්වා ගෙන යාමට හැකියාව ඇත.
- විදේශීය ව්‍යාවහාර මුදල් බැංකු ඒකක සඳහා වන මුදල් නීති පනතේ සහ බැංකු පනතෙහි විධිවිධානයන් පුළුල් කිරීම තුලින් බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් පවත්වා ගෙන යනු ලබන අක් වෙරළ බැංකු ඒකකයන් පාලනය කිරීම අවශ්‍ය යයි හැඟේ නම්, ඒ සඳහා මුදල් මණ්ඩලයට ඉඩ සැළසුනි.
- මූල්ම බැංකු පනතේ රෙගුලාසි වලට යටත් නොවූ සංවර්ධන බැංකු සහ ඉතිරි කිරීමේ බැංකු වැනි විශේෂිත බැංකු ආයතනයන් ආරම්භ කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ඒවායේ ක්‍රියාකාරීත්වය පාලනය කිරීම සහ විධිමත් කිරීමේ කටයුතු ස්ථාපිත කෙරිණි. මෙම විශේෂිත බැංකු මගින් සිදු කළහැකි ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර සංශෝධිත පනතෙහි දැක්වේ.
- බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකු වලට බල කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුවට හිමි විය.
- බලපත්‍රලාභී වාණිජ බැංකු තම අරමුදල් මූලික බැංකු කටයුතු වලින් බැහැරව යෙදවීම වැළැක්වීමේ අරමුණ ඇතිව කොටස් සහ නිශ්චල දේපළවල ආයෝජනයන් සීමා කෙරිණි.
- බැංකු කටයුතු වලින් පරිබාහිර නොවන කටයුතුවල යෙදෙන්නාවූ සමාගමක් තම පාලිත සමාගමක් ලෙසින් පවත්වා ගෙන යාමට බලපත්‍රලාභී වාණිජ බැංකු වලට අවසර දීමට මුදල් මණ්ඩලයට හැකියාව ලැබිණි.

මෙම සංශෝධන අනුව වාණිජ බැංකුවල සාංගමික ව්‍යවස්ථාවලිය සහ සංස්ථා පත්‍රවල වෙනස්කම් සිදුකිරීම, මුදල් මණ්ඩලයේ අනුමැතිය යටතේ පමණක් සිදු කළ යුතු බවට අවශ්‍යතාවන් පනවන ලදී. තවද, වාණිජ බැංකු සඳහා වූ අවම ප්‍රාග්ධන අවශ්‍යතාව මෙම සංශෝධන මගින් රුපියල් දශලක්ෂ 100 දක්වා ඉහළ නංවනු ලැබ ඇත.

මෙම සංශෝධන යටතේ සංවර්ධන බැංකු හා ඉතිරිකිරීමේ බැංකු ඇතුලත් විශේෂිත බැංකු සඳහා බලපත්‍ර ලබාදීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ විධිවිධාන ඇතුලත් ix අ යනුවෙන් බැංකු පනතට නව කොටසක් හඳුන්වාදෙන ලදී. ජාතික සංවර්ධන බැංකුව, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විශේෂිත බැංකු වශයෙන් නිශ්චිත ලෙස නම් කරනු ලැබිණි. ix අ කොටසෙහි සඳහන් විධිවිධාන මගින් රුපියල් දශලක්ෂ 50 ට නොඅඩු හිමිකම් ප්‍රාග්ධනයක් සහිත හා මුදල් මණ්ඩල විසින් නිකුත් කරන ලද බලපත්‍රයකින් අධිකාරී බලය ලැබූ සමාගම්වලට පමණක් නිශ්චය කල දිනක සිට මුදල්මය තැන්පතු භාරගැනීම, ආයෝජනය සහ මුදල් ණයට දීම යන ව්‍යාපාර පවත්වාගෙන යාමට ඉඩකඩ සලසා ඇත. මෙසේ බලපත්‍ර ලත් ආයතන බලපත්‍රලාභී විශේෂිත බැංකු වශයෙන් වර්ගීකරණය කොට ඇත. බැංකු පනතේ ix අ කොටස යටතේ සඳහන් බලපත්‍ර ලබාගැනීම සඳහා වූ අවශ්‍යතාවයෙන් මුදල් සමාගම්, සමූපකාර සංගම් වැනි ඇතැම් ආයතන නිදහස් කොට ඇත. මෙම පනත බලපත්‍රයක් ලබාගැනීමේ කාර්යපටිපාටිය නිශ්චය කර ඇති අතර, බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සිය ව්‍යාපාර පවත්වාගෙන යායුතු ආකාරය සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට අවස්ථාව සලසා ඇත.

බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු කරන බාහිර විගණන නිලධාරීන්ගේ ක්‍රියාදාමය සහ වගකීම පිළිබඳවද දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කෙරිණි. බාහිර විගණන නිලධාරීන් විසින් කරනු ලබන සාමාන්‍ය විගණන කටයුතු වලට අමතරව ඔවුන් විසින් කළ යුතු විශේෂිත ක්‍රියාකාරකම් පිළිබඳව උපදෙස් මාලාවක් සකස් කෙරෙමින් පවතින අතර, එය යථා කාලයේදී නිකුත් කෙරෙනු ඇත.

බැංකු නොවන මූල්‍ය ආයතන

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීමේ දෙපාර්තමේන්තුව මූල්‍ය සමාගම්වල කටයුතු සුපරීක්ෂණය සහ අධීක්ෂණය කිරීමේ කාර්යයන්හි නොකඩවා නියැලිණි. 1995 දී මෙම දෙපාර්තමේන්තුව මූල්‍ය සමාගම් පිළිබඳ ස්ථානීය පරීක්ෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ අතර පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමය තුළින් කරනු ලබන ස්ථානීය නොවන සුපරීක්ෂණයෙහි තවදුරටත් නියැලිණි.

මහ බැංකුවේ ලියාපදිංචි වූ මූල්‍ය සමාගම් 24 හි ඒකාබද්ධ ශේෂ පත්‍රවල දැක්වෙන පරිදි 1993/94 මුදල් වර්ෂයේ සියයට 18.5 කින් වර්ධනය වූ තැන්පතු වගකීම් ප්‍රමාණය 1995

II - 5 සංඛ්‍යා සටහන
ක්‍රියාත්මක වන මූල්‍ය සමාගම්වල ඒකාබද්ධ ශේෂ පත්‍ර

(රුපියල් දහස්)

	94.03.31 දිනට	95.03.31 දිනට	වෙනස ප්‍රතිශතයක් වශයෙන්
වගකීම්			
1. ප්‍රාග්ධන අරමුදල්			
නිකුත් කළ ප්‍රාග්ධනය	270,819	382,586	
කොටස් අධිමිල	-	223,043	
ප්‍රාග්ධන සංචිතය	571,541	488,948	
පොදු සංචිතය	335,542	453,099	
සංචිත අරමුදල	204,293	245,588	
වෙනත් සංචිත	213,812	165,219	
ලාභාලාභ ගිණුමේ ශේෂය	41,994	65,351	
දළ ප්‍රාග්ධන අරමුදල්	1,638,001	2,023,834	
අඩු කළා: විලම්බිත ගෙවුම්	124	28,445	
ශුද්ධ ප්‍රාග්ධන අරමුදල	1,637,877	1,995,389	21.8
2. බොල් හා අඩමාණ ණය වෙන්කිරීම	702,791	855,155	21.7
3. මහජන තැන්පතු	5,907,935	7,185,813	21.6
4. ණය			
බැංකු	610,530	823,067	
වෙනත්	170,899	152,073	
මුළු ණය	781,429	975,140	24.7
5. වෙනත් වගකීම	1,150,360	1,347,041	17.1
මුළු එකතුව	10,180,392	12,358,538	21.4
වත්කම්			
1. ද්‍රවශීල වත්කම			
අතැති මුදල් හා බැංකු ශේෂය	167,097	194,052	
ස්ථාවර තැන්පත්	290,061	367,748	
භාණ්ඩාගාර බිල්පත්	682,848	790,727	
මුළු ද්‍රවශීල වත්කම	1,140,006	1,352,527	18.6
2. ආයෝජන			
ආශ්‍රිත සමාගම් හා පාලිත සමාගම්වල කොටස්	188,043	280,477	
වෙනත් සමාගම්වල කොටස්	802,539	632,385	
අනුබද්ධ සමාගම්වල කොටස්	500	500	
ණයකර	200	200	
කොටස් ආයෝජනය	-	112,660	
මුළු ආයෝජන	991,282	1,026,222	3.5
3. අත්තිකාරම්			
ණය	604,318	606,773	
කුලී සින්නක්කර ණය	2,349,637	2,197,391	
බදු සින්නක්කර ණය	2,622,855	3,592,979	
ඉඩකඩම් ණය	263,528	395,965	
වෙනත් අත්තිකාරම්	279,952	626,186	
මුළු අත්තිකාරම්	6,120,290	7,419,294	21.2
4. පාලිත හා ආශ්‍රිත සමාගම්වලින් ලැබිය යුතු මුදල්	1,844	-	
5. ස්ථාවර වත්කම			
ඉඩම් හා ගොඩනැගිලි	777,723	818,695	
ලී බඩු හා සවිකිරීම්	-	84,870	
අනෙකුත් උපකරණ	161,652	39,234	
මෝටර් රථ	66,222	102,286	
යන්ත්‍ර සූත්‍ර	12,460	44,130	
බදු වත්කම්	-	436,556	
වෙනත්	1,808	8,800	
මුළු ස්ථාවර වත්කම	1,019,871	1,534,571	50.5
6. වෙනත් වත්කම	907,099	1,025,924	13.1
මුළු එකතුව	10,180,392	12,358,538	21.4
වාර්තා කළ සමාගම් ගණන	24	24	

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මාර්තු 31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය තුළදී සියයට 21.6 කින් වැඩි විය. පසුගිය වර්ෂයේ සියයට 47.5 කින් ඉහළ ගිය මෙම සමාගම්වල ප්‍රාග්ධන අරමුදල් මෙම වර්ෂයේදී සියයට 21.8 කින් වර්ධනය විය. පසුගිය මුදල් වර්ෂයේ සියයට 171.5 වර්ධනය හා සසඳන කල 1994/95 මූල්‍ය වර්ෂයේ මෙම සමාගම් විසින් බොල් හා අඩමාණ ණය සඳහා කළ ප්‍රතිපාදනයන් සියයට 21.7 කින් වර්ධනය විය. 1991 වර්ෂයේදී මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද අංක 2 දරණ මූල්‍ය සමාගම් බොල් සහ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන විධානයන් ක්‍රියාත්මක කිරීම 1993/94 මූල්‍ය වර්ෂයේ බොල් හා අඩමාණ ණය සඳහා වෙන් කිරීම්වල කැපී පෙනෙන වැඩි වීමක් පෙන්නුම් කිරීමට හේතු විය.

1995 මාර්තු 31 වන දිනට මූල්‍ය සමාගම්වල මුළු වත්කම් රුපියල් දශ ලක්ෂ 12,359 දක්වා සියයට 21 කින් වර්ධනය විය. 1994/95 මුදල් වර්ෂය තුල මුළු ද්‍රවශීල වත්කම් සියයට 18.6 කින් වැඩි වූ අතර, අත්තිකාරම් සියයට 21.2 කින් වර්ධනය විය. 1994 මාර්තු 31 වන දිනට රුපියල් දශලක්ෂ 991.3 ක්ව පැවති මූල්‍ය සමාගම්වල ආයෝජනයන්, 1995 මාර්තු 31 වන විට රුපියල් දශලක්ෂ 1,062.2 දක්වා ඉහළ ගියේය.

දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම්වල තැන්පතුකරුවන් සඳහා 1989 දී ආරම්භ කරන ලද සහන යෝජනා ක්‍රමය මෙම වර්ෂය තුළදිද අඛණ්ඩව ක්‍රියාත්මක විය. දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම් 7ක තැන්පතුකරුවන් වෙනුවෙන් වර්ෂය තුලදී කරන ලද සහන ගෙවීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 11.9 ක් වූ අතර, 1995 වර්ෂය අවසානය දක්වා තැන්පත්කරුවන් වෙනුවෙන් කරන ලද මුළු සහන ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 523.5 ක් විය. 1992 පෙබරවාරි මස මුදල් මණ්ඩලය විසින් පරිපාලනය හා කළමණාකරණය පවරා ගනු ලැබූ එක් ලියාපදිංචි මූල්‍ය සමාගමකට, එහි තැන්පතු වගකීම් ගෙවීම් සඳහා වසර තුළදී රුපියල් දශලක්ෂ 171.5 ක ණය මුදලක් ලබා දෙන ලදී. 1995 දෙසැම්බර් අවසානය වන විට මෙම සමාගමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,417.6 ක්විය.

මූල්‍ය සහ බැංකු කටයුතු පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශයන් සහ 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනතේ විධි විධානයන් ක්‍රියාත්මක කිරීම තුළින් ලබා ගත් පළපුරුද්ද සැලකිල්ලට ගනිමින්, 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනතට සංශෝධනයන් කිහිපයක් සකස් කිරීමේ කටයුතුවල දෙපාර්තමේන්තුව නියැලුණි.

සංවර්ධන මුදල්

1995 වර්ෂය තුළදී, සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවේ වගකීම් වූයේ, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක) ණය යෝජනා ක්‍රමය හා, බස්රථ මිලදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය (බමිණ), සඳහා වන ණය ආවරණ ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ පිළිවෙලට, හා එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (එ.ජ.ජා.සං.ආ.) යටතේ වන අඩු ආදායම් නිවාස වැඩ සටහනෙහි IV වැනි අදියර සඳහා වන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යනාදියට අදාල වැඩ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීමයි. මැදි හා දිගුකාලීන ණය අරමුදලෙහි (මැ.දි.ණ.අ) පරිපාලනමය කටයුතු, 1991 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ප්‍රතිමූල්‍ය පහසුකම් අත්හිටුවීමට පෙර එම පහසුකම් සපයන ලද ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරීත්වය (මූල්‍ය සමාගම් සඳහා ප්‍රදානය කළ ප්‍රතිමූල්‍ය හැර) පසු විපරම් කිරීමට පමණක් සීමා විය.

ණය ආවරණ සහතික ක්‍රමයන්හි ක්‍රියාකාරීත්වය

1995 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරන ලද ණය ආවරණ යෝජනා ක්‍රම යටතේ සුළු පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය, සුමක I, II, III, හා IV සඳහා වූ ණය ආවරණ සහතික ක්‍රමයන්හි සහ බස් රථ මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය යටතේ වූ ණය ආවරණ කටයුතුවල සාරාංශයක් පිළිවෙලින් අංක II-6 හා II-8 දරණ සංඛ්‍යා සටහන්හි දැක්වේ. සුමක II, III, හා IV යන යෝජනා ක්‍රමයන් යටතේ මූල්‍ය පහසුකම් ලබාගත් ව්‍යාපෘතීන්හි කර්මාන්ත අනුව කරන ලද වර්ගීකරණයක් අංක II-7 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

සුළු පරිමාණ කර්මාන්ත (සු.පරි.ක.) ණය යෝජනා ක්‍රමය.

මෙම යෝජනා ක්‍රමය යටතේ සහතික කරන ලද මුළු ණය මුදල් සංඛ්‍යාව 767 කි. 1995 වර්ෂය අවසානයේදී මෙයින් ක්‍රියාත්මකව පැවැතියේ රුපියල් දශලක්ෂ 0.3 ක ණය ආවරණ වගකීමකින් සහ රුපියල් දශ ලක්ෂ 0.4 ක වටිනාකමකින් යුත් ණය මුදල් 8 ක් පමණි. මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශලක්ෂ 1.7 ක වටිනාකමින් යුත් හිමිකම් පෑම් මහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලදී. දැනට නොපියවා ඇති ණය මුදල් 8 හා සම්බන්ධ මුළු වගකීම රුපියල් දශ ලක්ෂ 0.3 කි.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත - I යෝජනා ක්‍රමය.

සුමක 1 ණය යෝජනා ක්‍රමය 1979 වර්ෂයේ සිට 1982 වර්ෂය දක්වා ක්‍රියාත්මක විය. මෙම කාල පරිච්ඡේදය තුළදී ණය මුදල් 1,670 ක් සඳහා ණය ආවරණ සපයන ලදී. මෙම ණය මුදල් සංඛ්‍යවට අදාල මුළු ණය ආවරණ වගකීම රුපියල් දශ ලක්ෂ 286 ක් විය. 1995 වර්ෂය අවසාන වන විට නොපියවා පැවැති ණය මුදල් සංඛ්‍යාව 40 ක් වූ අතර එහි ණය ආවරණ වගකීම රුපියල් දශ ලක්ෂ 4.6 ක් විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රැස්කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය හා පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකිරීම් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 12.2 ක් හා රුපියල් දශ ලක්ෂ 19.9 ක් විය. වාරික මුදල් ලැබීම් හා පශ්චාත් හිමිකම් පෑම් ආපසු අය කිරීම්වලින් සමන්විත වූ රුපියල් දශ ලක්ෂ 32.7 ක් වන මුළු සම්පත් ප්‍රමාණය මෙම යෝජනා ක්‍රමය යටතේ වූ වගකීම් පියවීම සඳහා ප්‍රමාණවත් විය. මේ සඳහා දෙපාර්තමේන්තුව විසින් පශ්චාත් හිමිකම් පෑම් ආපසු අයකිරීම් සම්පව පසුවිපරම් කිරීම බෙහෙවින් ඉවහල් විය.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත - II ණය යෝජනා ක්‍රමය.

1982 වර්ෂයෙහි ඇරඹුණු සුමක II ණය යෝජනා ක්‍රමය 1989 වර්ෂය දක්වා ක්‍රියාත්මක විය. රුපියල් දශලක්ෂ 714 ක උපරිම ණය ආවරණ වගකීමක් සහිත ණය අවරණ සහතික 2,531 ක් මෙම කාලපරිච්ඡේදය තුළදී නිකුත් කර ඇත. 1995 වර්ෂය අවසානය වන විට එයින් රුපියල් දශ ලක්ෂ 702 ක වටිනාකමක් ඇති ණය මුදල් 1,564 ක් සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති අතර, සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් රුපියල් දශ ලක්ෂ 168 ක වටිනාකමකින් යුතු ණය ආවරණ 353 ක් ඉවත් කර ගෙන හෝ අවලංගු වී හෝ තිබුණි. 1995 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 59 ක වගකීමක් සහිත හිමිකම් පෑම් 226 ක් ලැබුණු අතර, එයින් රුපියල් දශ ලක්ෂ 30 ක වටිනාකමක් ඇති හිමිකම්පෑම් 125 ක් සම්පූර්ණයෙන්ම සමථයකට පත්කරන ලදී. දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත් වලින් ඉදිරිපත් කරන ලද හිමිකම් පෑම් සඳහා ගෙවීම් කිරීම පිළිබඳව ගනු ලැබූ තීරණයකට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමෙන් සියයට 50 ක් නොඉක්මවන පරිදි හිමිකම්පෑම් 4 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 0.7 අතුරුදීමනාවක් ගෙවන ලද අතර, සහභාගිත්ව ණයදෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් රුපියල් දශලක්ෂ 12 ක් වටිනා හිමිකම්පෑම් 45 ක් ප්‍රතික්ෂේප කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව හිමිකම්පෑම් 5 කට අදාල ණය මුදල් ණය කරුවන් විසින් ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශ ලක්ෂ 3.6 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 7ක් සහභාගීත්ව ණය දෙන ආයතන විසින් ඉවත්කර ගන්නා ලදී.සහභාගීත්ව ණය දෙන ආයතන විසින් පුනරුත්ථාපන වැඩසටහන් දියත් කිරීම හේතුකොට ගෙන ණය උපලේඛනගත කිරීම නිසාහෝ හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව ණයකරුවන් විසින් ණය මුදල් ගෙවීම යළි ඇරඹීම හේතුවෙන් හෝ 1995 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 8.2 ක වටිනාකමින් යුත් හිමිකම්පෑම් 26 ක් සලකා බැලීම පසුවට කල්තබන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු වගකීම රුපියල් දශ ලක්ෂ 66 ක සහිත වූ, රුපියල් දශලක්ෂ 111 ක වටිනාකමකින් යුත් ණය මුදල් 440 ක් 1995 වර්ෂය අවසානයේදී ක්‍රියාත්මකව පැවතුණි. එයින් රුපියල් දශලක්ෂ 86.7 ක වගකීමකින් යුක්ත ණය මුදල් 326 ක් හිඟහිටි ණය වශයෙන් වාර්තා වී ඇත.

මෙම යෝජනා ක්‍රමය යටතේ 1995 වර්ෂය අවසාන වනවිට රැස්කර ගන්නාලද වාරික මුදල් ප්‍රමාණය වන රුපියල් දශලක්ෂ 29.4 හි සහ ශ්‍රී ලංකා මහ බැංකුවට පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකර ගැනීම් වශයෙන් ලැබුණු රුපියල් දශලක්ෂ 29.7 හි එකතුව රුපියල් දශලක්ෂ 59.1 කි.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත - III ණය යෝජනා ක්‍රමය.

සුමක III ණය යෝජනා ක්‍රමය 1988 සිට 1991 දක්වා ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 1,956 ක වටිනාකමක් ඇති ණය මුදල් 3,130 කට ණය ආවරණ ලබාදී ඇත.

1995 අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 607.8 ක් වටිනාකමක් ඇති ණය මුදල් 1339 ක් සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශලක්ෂ 212.6 ක වටිනාකමකින් යුත් ණය මුදල් 280 ක් ඉවත් කර ගෙන හෝ අහෝසි වී හෝ තිබුණි. 1995 වර්ෂයේදී අවසානය වනවිට රුපියල් දශලක්ෂ 35.5 ක ශ්‍රී ලංකා මහ බැංකු ණය ආවරණ වගකීමක් සහිත හිමිකම්පෑම් 146 ක් ලැබුණි. එයින් මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 22.9 ක් වූ හිමිකම්පෑම් 83 ක් සමථයකට පත්කරන ලැබ අතර, රුපියල් දශ ලක්ෂ 12.1 ක මුළු වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 41 ක් ප්‍රතික්ෂේප කරන ලදි. හිමිකම්පෑම් ඉදිරිපත් කිරිමෙන් පසුව ණයකරුවන් විසින් ඔවුන්ට අදාල ණය ගෙවීම් විධිමත් කිරිම හේතුවෙන් හිමිකම් පෑම් 4 ක් සලකා බැලීම පසුවට කල්තබන ලදි. 1995 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසානයේදී රුපියල් දශලක්ෂ 280.7 ක උපරිම ණය ආවරණ වගකීමක් සහිත රුපියල් දශ ලක්ෂ 433.7 ක වටිනාමකින් යුත් ණය මුදල් 1,387 ක් ක්‍රියාත්මකව පැවතුණි. එයින් රුපියල් දශ ලක්ෂ 143.2 ක වගකීමක් සහිත වූ ණය මුදල් 621 ක් හිඟ හිටි ණය මුදල් ලෙස වාර්තා වී ඇත. 1995 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස්කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 42 ක් වූ අතර, පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකර ගැනීම් වශයෙන් මහ

II-6 සංඛ්‍යා සටහන
1995.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ

යෝජනා ක්‍රම සහ වර්ෂ / ශීර්ෂය	සුළු පරිමාණ කර්මාන්ත		සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සු.ම.ක)					
			සුමක 1		සුමක 11			
	1995		1995		1994		1995	
	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම
1.1 ප්‍රදානය කරන ලද ණය	767	31.20	1,670	286.10	2,531	1,392.54	2,531	1,392.54
1.2 සහතික කරන ලද ණය	767	23.40(ආ)	1,670	157.50(ඇ)	2,531	713.63(ඈ)	2,531	713.63(ඈ)
2.1 සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය	598	23.06	1,230	183.93	1,497	677.84	1,564	702.22
2.2 ඉවත්කර ගන්නා ලද ණය හෝ අවලංගු වූ ණය සහතික	90	4.89	113	31.38	341	167.90	353	168.00
3.1 ලැබූ හිමිකම්පෑම්	88	4.32(උ)	338	75.89(උ)	225	115.51(උ)	226	70.04
3.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම්		2.42		33.89		58.63		58.63
3.3 හිමිකම්පෑම් සමථයකට පත්කිරීම්								
3.3.1 සම්පූර්ණයත් ගෙවීම් කළ හිමිකම්පෑම්	63	1.68	230	19.07	124	30.33	125	30.58
3.3.2 අර්ධ ගෙවීම් කළ හිමිකම් පෑම්	1	0.00(ඌ)	27	2.11	4	0.67	4	0.67
3.3.3 ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම්	7	0.22	30	5.50	44	11.67	45	11.74
3.3.4 හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණයෙන් ගෙවා නිමකරන ලද ණය (එ)	16	0.24	37	2.03	5	1.10	5	1.10
3.3.5 සලකා බැලීම කල්තබන ලද හිමිකම්පෑම් (ඒ)	1	0.27	11	2.64	26	8.17	26	8.17
3.3.6 තීරණ ගෙන නොමැති හිමිකම්පෑම් (ඒ)			3	0.51	15	4.80	14	4.38
3.3.7 ඉවත්කර ගන්නා ලද හිමිකම්පෑම් (ඒ)					7	3.62	7	3.62
4.1 නොපියවන ලද ණය මුදල් (ඔ)	8	0.42	40	4.56	520	146.31	440	110.74
4.2 හිඟ ණය	8	0.42	40	4.56	394	68.17	326	86.73
4.3 ක්‍රියාත්මක ණය සහතික මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම්	8	0.30(ආ)	40	2.92(ඇ)	520	84.31(ඈ)	440	66.44(ඈ)
5 රැස්කර ගන්නා ලද වාර මුදල්		1.00		12.23		29.21		29.44
6 පශ්චාත් හිමිකම් අයකර ගැනීම්		0.61		19.88		13.99		29.67

(අ) ජාතික සංවර්ධන බැංකුව විසින් සුමක IV යෝජනා ක්‍රමයට මාරු කරන ලද ණය මුදල් හැර.
(ආ) නොපියවූ ණය ශේෂයන්ගෙන් සියයට 75 ක ප්‍රමාණය.
(ඇ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 0.4 ක උපරිමයකට යටත්ව නොපියවූ ණය ශේෂයෙන් සියයට 60 ක ප්‍රමාණය.
(ඈ) රුපියල් දශ ලක්ෂ 2.0 දක්වා වූ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 0.8 ක් උපරිමයකට යටත් වූ හිඟ ණය මුදල්හි සියයට 60 ක ප්‍රමාණය සහ රුපියල් දශ ලක්ෂ 2.0-4.0 දක්වා වූ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 1.2 ක්
(ඉ) ව්‍යාපෘතියක් සඳහා රුපියල් දශ ලක්ෂ 1.6 උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 2.0, රුපියල් දශ ලක්ෂ 2.0-3.0 සහ රුපියල් දශ ලක්ෂ 3.0-4.0 කවූ ණය සඳහා පිළිවෙලින් සියයට 80, 60 සහ 40 ක ප්‍රමාණයන්.
(ඊ) ව්‍යාපෘතියක් සඳහා රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 0.5, රුපියල් දශ ලක්ෂ 0.5-1.0 රුපියල් දශ ලක්ෂ 1.0-2.0 සහ රුපියල් දශ ලක්ෂ 2.0-8.0 කවූ ණය සඳහා පිළිවෙලින් සියයට 90, සියයට 80 සියයට 70 සහ සියයට 60 ක ප්‍රමාණයන්.
(උ) එකතු වූ පොළියත් සමඟ ගෙවීම් පැහැර හැර ඇති ණය මුදල් .
(ඌ) රුපියල් 4,504.75 ක හිමිකම්පෑම් ගෙවා ඇත.
(එ) 2.1 යටතේ අඩංගු වී ඇත.
(ඒ) 4.1 යටතේ අඩංගු වී ඇත.
(ඔ) අයකරගත් ණය වාරික හැර.

බැංකුවට ගෙවන ලද ප්‍රමාණය රුපියල් දශලක්ෂ 20 විය.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත - IV ණය යෝජනා ක්‍රමය.

1992 වර්ෂයේ මාර්තු මාසයේ දී ඇරඹුණු සුමක IV ණය යෝජනා ක්‍රමය දැනුදු ක්‍රියාත්මක වේ. 1995 වර්ෂය අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 6,057 ක වටිනාකමකින් යුත් ණය මුදල් 7,382ක් සඳහා ණය ආවරණ සහතික නිකුත් කර ඇත. මෙම ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ආවරණ වගකීම රුපියල් දශලක්ෂ 4,176ක් විය. මෙම වර්ෂය තුලදී රුපියල් දශලක්ෂ 264.3 ක වටිනාකමක් ඇති ණය මුදල් 542 ක් සම්පූර්ණයෙන් ගෙවා නිම කර ඇති අතර, සහභාගීත්ව ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් ණය ආවරණ 238ක් ඉවත්කර ගැනීම හෝ අහෝසි වීම හෝ සිදුවිය. 1995 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 3,747 ක මුළු වටිනාකමකින් යුත් ණය මුදල් 6,553 ක් ක්‍රියාත්මක තත්ත්වයෙහි පැවතුණි. එම ණය මුදල් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු වගකීම රුපියල් දශලක්ෂ 2,588 කි. රුපියල් දශලක්ෂ 53 ක වටිනාකමක් ඇති හිමිකම්පෑම් 87 ක් 1995 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසාන වන විට ලැබී තිබුණු අතර, එයින් රුපියල් දශ ලක්ෂ 7ක වටිනාකමිකින් යුත් හිමිකම්පෑම් 26 ක් සමථයකට පත් කරන ලදි. 1995 වර්ෂය අවසානයේදී මුළු ණය ආවරණ වාරික රැස්කිරීම රුපියල් දශලක්ෂ 84 ක් විය. මෙම වර්ෂය අවසානයේදී පශ්චාත් හිමිකම්පෑම් අයකිරීම් වශයෙන් රුපියල්

ණය සහතික ක්‍රමයන්හි සාරාංශය.

(රුපියල් දශලක්ෂ)

පුමක 111				පුමක 1v			
1994		1995		1994		1995	
සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම
3,130	1,955.59(අ)	3,130	1,955.59(අ)	6,270	4,735.90	7,382	6,056.84
3,130	1,312.62(ඉ)	3,130	1,312.62(ඉ)	6,270	2,855.77(ඊ)	7,382	4,176.68(ඊ)
1,000	439.89	1,339	607.77	253	125.52	542	264.28
267	202.09	280	212.56	169	103.76	238	144.96
124	61.55(උ)	146	50.66	40	25.54(උ)	87	53.04
	42.02		35.46		20.42		42.43
69	19.90	83	22.90	16	3.64	26	6.96
24	7.43	41	12.11	3	0.43	23	10.60
	1	1.60			1	0.51	
4	4.63	4	4.63	2	1.64	2	1.64
25	10.83	13	3.68	18	12.86	34	28.87
2	1.70	4	2.48	1	1.63	1	1.63
1,770	585.85	1,387	433.68	5,829	2,999.54	6,553	3,747.67
567	108.00	621	143.18	509	51.47	1,339	43.74
1,770	386.81(ඉ)	1,387	280.74(ඉ)	5,829	1,951.68(ඊ)	6,553	2,588.34(ඊ)
	39.59		42.47		61.78		84 94
	5.64		20.13		0.26		6.54

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දශලක්ෂ 6.5 ක් ලැබී තිබුණි.

බස් රථ මිලදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය (බමිණ)

සහභාගිත්ව ණය දෙන ආයතන මගින් පෞද්ගලික බස්රථ ධාවකයින්ට පොදු මගී ප්‍රවාහනය සඳහා බස්රථ මිලදී ගැනීමට ප්‍රදානය කරන ලද ණය මුදල් ආවරණය කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම ණය ආවරණ සහතික ක්‍රමය 1990 වර්ෂයේ නොවැම්බර් මස හඳුන්වා දෙන ලදී. ජාතික සංවර්ධන බැංකුව විසින් මෙම ණය සඳහා ප්‍රතිමූල්‍ය සැපයූ අතර මහ බැංකුව විසින් ණය ආවරණ ලබා දුණි. 1992 වර්ෂය අවසාන වන විට ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදීම සඳහා ජාතික සංවර්ධන බැංකුව වෙත තිබූ සම්පත් සියල්ල ප්‍රයෝජනයට ගෙන තිබුණු හෙයින්, එතැන් සිට මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක වීම අවසන් විය. මෙම ණය ආවරණ සහතික ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 1,099 ක වටිනාකමකින් යුත් ණය මුදල් 1,932 ක් සඳහා ණය ආවරණ ලබාදුණි. මෙම ණය මුදල් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු වගකීම රුපියල් දශ ලක්ෂ 871 ක් විය.

බස්රථ මිලදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය, නව බස් රථ 1,911 ක් පොදු මගී ප්‍රවාහනය සඳහා වන බස්රථ සමූහයට අළුතින් එක්කිරීමට උපකාරී විය. එක් බස් රථයක් පමණක් හිමි බස් රථ හිමියන් විශාල ප්‍රමාණයක් නියෝජනය කරමින් ණය කරුවන්, 1,816 දෙනෙකු සිටීම, මෙම යෝජනා ක්‍රමයෙහි එක් ලක්ෂණයක් විය.

1995 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 325 වටිනාකමකින් යුත් ණය මුදල් 596 ක් සම්පූර්ණයයෙන් ආපසු ගෙවා නිමකර තිබුණු අතර, සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් රුපියල් දශලක්ෂ 69.2 ක වටිනාකමකින් යුත් ණය ආවරණ 117 ක් අහෝසි වීම හෝ ඉවත්කර ගැනීම හෝ සිදු විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ආවරණ වගකීම රුපියල් දශලක්ෂ 6.9 ක් වූ, රුපියල් දශලක්ෂ 9.8 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 18 ක්, 1995 වර්ෂය අවසාන වනවිට ලැබී තිබුණි. එයින් හිමිකම්පෑම් 9 ක් සඳහා රුපියල් දශලක්ෂ 2.1 ක් වන සියයට 50 ක අතුරු ගෙවීමක් කරන ලදී. 1995 වර්ෂය අවසාන වනවිට, රුපියල් දශලක්ෂ 2.8 ක වටිනාකම්කින් යුත් හිමිකම්පෑම් 5 ක් සලකා බලමින් පැවති අතර, රුපියල් දශ ලක්ෂ 1 ක වටිනාකමකින් යුත් හිමිකම් පෑම් 2 ක් ප්‍රතික්ෂේප කරනු ලැබීය.

1995 වර්ෂය අවසාන වනවිට මෙම ණය ආවරණ සහතික ක්‍රමය යටතේ රැස්කර ගන්නා ලද මුළු වාරික ප්‍රමාණය රුපියල් දශලක්ෂ 21.2 ක් වූ අතර, පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකර ගැනීම් වශයෙන් රුපියල් දශලක්ෂ 1.7 ක් ලැබී තිබුණි. II-8 වැනි සංඛ්‍යා සටහන මගින් මෙම ණය ආවරණ සහතික ක්‍රමයෙහි ක්‍රියාකාරිත්වය සැකෙවින් දක්වා තිබේ.

II-7 වැනි සංඛ්‍යා සටහන
සුමක - II, III සහ IV ණය සහතික ක්‍රම කර්මාන්ත අනුව වර්ගීකරණය - 1995.12.31 දිනට

කර්මාන්ත	සුමක - II, III සහ IV 1982 - 1995						සුමක - IV 1995					
	ප්‍රදානය කරන ලද ණය		ණය ප්‍රමාණය		සහතික කරන ලද ණය ප්‍රමාණය		ප්‍රදානය කරන ලද ණය		ණය ප්‍රමාණය		සහතික කරන ලද ණය ප්‍රමාණය	
	සංඛ්‍යාව	%	රු.දශලක්ෂ	%	රු.දශලක්ෂ	%	සංඛ්‍යාව	%	රු.දශලක්ෂ	%	රු.දශලක්ෂ	%
1. ආහාර වර්ග සැකසීම	2,968	22.8	1,958.0	20.8	1,148.8	19.9	146	13.1	147.7	11.1	97.4	11.0
2. වෙනත් කෘෂිකර්මාන්ත	277	2.1	136.4	1.4	86.8	1.5	6	0.5	7.5	0.6	4.7	0.5
3. රබර් නිෂ්පාදන	251	1.9	265.6	2.8	148.7	2.6	10	0.9	22.2	1.7	13.6	1.5
4. ලෝහ නිෂ්පාදන	1,136	8.7	613.8	6.5	380.9	6.6	108	9.7	82.2	6.2	56.0	6.3
5. ඉදිකිරීමේ ද්‍රව්‍ය	784	6.0	465.5	4.9	309.1	5.4	45	4.0	43.9	3.3	29.5	3.3
6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු	211	1.6	337.6	3.6	180.1	3.1	47	4.2	101.6	7.6	64.6	7.3
7. දැව කර්මාන්ත	766	5.9	375.2	4.0	255.5	4.4	44	4.0	45.8	3.4	30.0	3.4
8. ඇඟළුම්	786	6.0	693.5	7.4	391.3	6.8	26	2.3	34.2	2.6	22.1	2.5
9. රෙදිපිළි	291	2.2	297.7	3.2	162.3	2.8	18	1.6	20.1	1.5	13.3	1.5
10. අළුත්වැඩියා කිරීමේ වැඩ පොළවල්	467	3.6	244.1	2.6	162.5	2.8	26	2.3	14.6	1.1	11.0	1.2
11. වෙනත් *	5,106	39.1	4,027.9	42.8	2,538.5	44.0	636	57.2	811.3	61.0	540.2	61.2
එකතුව	13,043	100.0	9,415.2	100.0	5,764.3	100.0	1,112	100.0	1,331.0	100.0	882.4	100.0

* මගී සහ වාණිජ ප්‍රවාහනය, සම් භාණ්ඩ, සත්ව පාලනය, රසායනික ද්‍රව්‍ය, ධීවර, අවන්හල්, ෆයිබර් ග්ලාස්, ඉලෙක්ට්‍රොනික, විදුරු, පිහන් භාණ්ඩ සහ පොලිතින් කර්මාන්ත ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

II-8 වැනි සංඛ්‍යා සටහන
බස්රථ මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරිත්වයේ - සාරාංශය

(රුපියල් දශ ලක්ෂ)

ශීර්ෂය	දෙසැම්බර් 31 වන දිනට			
	1994		1995	
	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම
1.1 ප්‍රදානය කරන ලද ණය	1,932	1,098.58	1,932	1,098.58
1.2 සහතික කරන ලද ණය	1,932	871.18(අ)	1,932	871.18(අ)
2.1 සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති ණය	251	140.81	596	325.09
2.2 ඉවත්කර ගන්නා ලද හෝ අවලංගු වූ ණය සහතික	116	68.47	117	69.21
3.1 ලැබූ සම්පූර්ණ හිමිකම්පෑම්	13	7.59(ආ)	18	9.83(ආ)
3.2 මහ බැංකුවේ වගකීම	-	6.33	-	6.88
3.3 සමථයකට පත්කරන ලද				
3.3.1 අධික සමථයකට පත්කරන ලද හිමිකම්පෑම්	6	1.44(ඇ)	9	2.06
3.3.2 ප්‍රතික්ෂේප කරන ලද හිමිකම්පෑම්	2	1.00	2	1.00
3.3.3 කල්තබන ලද හිමිකම්පෑම්(ඉ)	-	-	-	-
3.3.4 තීරණයක් නොගත් හිමිකම්පෑම් (ඉ)	4	2.53	5	2.77
3.3.5 ඉවත්කරගත් හිමිකම්පෑම්	-	-	-	0.16
3.3.6 හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව සම්පූර්ණයෙන් ගෙවා නිමකරන ලද ණය (ඊ)	1	0.42	1	0.42
4.1 ගෙවා නොමැති ණය	1,557	420.53(ඈ)	1,208	218.42(ඈ)
4.2 ගෙවා නොමැති ණය මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම	1,557	333.19(අ)	1,208	171.77(අ)
5. රැස්කරන ලද වාර මුදල්		19.22		21.19
6. පශ්චාත් හිමිකම් අයකර ගැනීම්		0.52		1.74

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 2, රුපියල් දශ ලක්ෂ 2 - රුපියල් දශ ලක්ෂ 3 සහ රුපියල් දශ ලක්ෂ 3 - රුපියල් දශ ලක්ෂ 4 දක්වා වූ ණය සම්බන්ධයෙන් පිළිවෙලින් 80%, 60% සහ 40% ප්‍රමාණයන්

(ආ) එහිදී අයකරගත් පොළිය ඇතුලත්ව, නොගෙවා පැහැර හරින ලද ණය ප්‍රමාණය.

(ඇ) සම්පූර්ණයෙන් සමථයකට පත්කරන ලදැයි දැක්වූ රුපියල් දශ ලක්ෂ 0.39 ක් වූ හිමිකම්පෑම් 2 ක් අධික සමථයකට පත්කරන ලද හිමිකම්පෑම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබ ඇත.

(ඈ) අයකරගත් ණය වාරික හැර

(ඉ) අංක 4.1 යටතේ ඇතුළත් කරන ලදී.

(ඊ) අංක 2.1 යටතේ ඇතුළත් කරන ලදී.

II-9 වැනි සංඛ්‍යා සටහන
අඩු ආදායම් නිවාස වැඩසටහන - IV වැනි අදියර
ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් හා මුදාහැරීම්

(රු.'000)

උප ප්‍රධාන ණය දෙන ආයතන	අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය		මුදාහරින ලද ප්‍රතිමූල්‍ය	
	1995	1992-95	1995	1992-95
ලංකා බැංකුව	40,488	350,050	123,917	312,481
සීමාසහිත ලංකා වාණිජ බැංකුව	395	1,752	180	1,083
සීමාසහිත හැටන් නැෂනල් බැංකුව	-	5,284	918	4,724
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	92,328	165,305	60,691	85,340
මහජන බැංකුව	100,346	235,223	68,601	179,263
ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකු	42,263	66,699	18,154	32,989
සීමාසහිත සෙලාන් බැංකුව	170	4,505	75	2,430
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	28,904	60,510	4,365	18,995
එකතුව	**304.894**	**889.328**	**276.901**	**637.305**

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

අඩු ආදායම් නිවාස වැඩසටහන - IV වැනි අදියර.

1992 වර්ෂයේ ජූලි මාසයේදී ආරම්භ කරන ලද ඉහත වැඩපිළිවෙල යටතේ වූ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය 1995 වර්ෂය තුලදී ද නොකඩවා ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රධාන ණය දෙන ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාකරයි. එක්සත් ජනපද රජයේ නිවාස ණය වැඩසටහනෙහි IV වැනි අදියර මගින් ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදානය කරනු ලැබූ ණය මුදල් මගින් ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිමූල්‍ය ප්‍රදානය කරනු ලබයි. අඩු ආදායම් නිවාස වැඩසටහන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ගිවිසුමකට එළඹ ඇති උප ප්‍රධාන ණය දෙන ආයතන (උ.ප්‍ර.ණ.ආ.) හෝ සෘජු මූලික ණය දෙන්නන් (සෘ.මූ.ණ.) හෝ වශයෙන් නම් කර ඇති සහභාගිත්ව ණය දෙන ආයතන වලට මෙම අරමුදල් ලබාදෙනු ලැබේ. ලංකා බැංකුව, මහජන බැංකුව, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, සීමාසහිත සෙලාන් බැංකුව, සීමාසහිත ලංකා වාණිජ බැංකුව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ කුරුණෑගල , මහනුවර, කෑගල්ල, පුත්තලම, ගාල්ල, බදුල්ල, ගම්පහ, මාතලේ හා මාතර යන

II - 10 වැනි සංඛ්‍යා සටහන
අඩු ආදායම් නිවාස වැඩසටහන IV වැනි අදියර - ප්‍රගති සාරාංශය ණය අනුමත කිරීම්
අරමුණ, කල්පිරීම සහ ප්‍රමාණය අනුව අනුමත කරන ලද ණය

(රු. '000)

කාණ්ඩය	1995			1992-1995		
	නාගරික	ග්‍රාමීය	එකතුව	නාගරික	ග්‍රාමීය	එකතුව
අරමුණ						
නව නිවසක් ගොඩනැගීම	6,321	99,821	106,142	54,928	342,255	397,183
වැඩිදියුණු කිරීම් සහ අළුත්වැඩියා කිරීම්	7,117	65,527	72,644	47,767	210,810	258,577
ඉඩමක් හිමිකර ගැනීම	19,648	103,329	122,977	44,430	184,171	228,601
පසුතල පහසුකම් සංවර්ධනය	237	2,894	3,131	547	4,420	4,967
එකතුව	**33.323**	**271.571**	**304.894**	**147.672**	**741.656**	**889.328**
කල්පිරීම						
අවු. 5 සහ ඊට අඩු	9,428	135,335	144,763	46,118	316,322	362,440
අවු. 6 සිට අවු.10 දක්වා	7,580	37,430	45,010	43,433	213,542	256,975
අවු. 11 සිට අවු. 15 දක්වා	16,315	98,706	115,021	57,822	210,633	268,455
අවු. 16 සිට අවු. 20 දක්වා	-	100	100	299	1,159	1,458
එකතුව	**33.323**	**271.571**	**304.894**	**147.672**	**741.656**	**889.328**
ප්‍රමාණය (රුපියල්)						
0 - 2,500	2	308	310	122	9,496	9,618
2,501 - 5,000	359	3,062	3,421	3,231	32,848	36,079
5,001 - 7,500	498	7,471	7,969	5,158	60,661	65,819
7,501 - 10,000	2,118	20,503	22,621	13,659	156,083	169,742
10,001 - 15,000	4,917	17,504	22,421	46,156	58,771	104.927
15,001 - 20,000	2,199	15,250	17,449	10,544	40,681	51,225
20,001 - 25,000	2,165	32,968	35,133	13,889	63,011	76,900
25,001 - 30,000	565	11,048	11,613	2,804	23,085	25,889
30,001 - 35,000	648	7,414	8,062	2,599	16,444	19,043
35,001 - 40,000	769	9,379	10,148	3,695	21,869	25,564
40,001 - 45,000	744	3,950	4,694	3,135	11,211	14,346
45,001 - 50,000	3,131	48,022	51,153	10,180	92,602	102,782
50,001 - 100,000	12,233	65,670	77,903	29,525	125,747	155,272
100,000 ට වැඩි	2,975	29,022	31,997	2,975	29,147	32,122
එකතුව	**33.323**	**271.571**	**304.894**	**147.672**	**741.656**	**889.328**

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

II - 11 වැනි සංඛ්‍යා සටහන
අඩු ආදායම් නිවාස වැඩසටහන - IV වැනි අදියර
ණය අනුමත කිරීම් - පළාත් අනුව

(රු.'000)

පළාත	1995		1992 - 1995	
	ප්‍රමාණය	%	ප්‍රමාණය	%
1. මධ්‍යම	53,794	17.6	134,268	15.1
2. නැගෙනහිර	4,497	1.5	20,602	2.3
3. උතුරු මැද	13,865	4.6	157,208	17.7
4. වයඹ	41,547	13.6	89,704	10.0
5. උතුර	537	0.2	4,368	0.5
6. සබරගමුව	32,913	10.8	78,295	8.8
7. දකුණ	49,128	16.1	115,332	13.0
8. ඌව	4,737	1.5	21,360	2.4
9. බස්නාහිර	103,876	34.1	268.191	30.2
එකතුව	**304.894**	**100.0**	**889.328**	**100.0**

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

හෝ ඊට අඩු මාසික ආදායමක් ලබන කුටුම්භයන් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් ලබාගැනීමට සුදුසුකම් ලබයි.

1994 වර්ෂය දක්වා මෙම අඩු ආදායම් නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලද්දේ මහ භාණ්ඩාගාරයෙන් සපයන ලද රුපියල් දශලක්ෂ 150 ක අත්තිකාරම් මුදලක් පදනම් කරගෙනය. මෙම යෝජනා ක්‍රමයෙහි ණය ගිවිසුමට අදාල ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ 25 ක ණය මුදලේ පළමුවැනි කොටස වශයෙන් ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ 10 ක ණය මුදල 1994 වර්ෂයේ ඔක්තෝම්බර් මස මුදාහරින ලදී. මෙම ණයට අදාල ඉරමුදල් 1995 වර්ෂයේ අප්‍රේල් මස මුදා හරින ලදී. 1995 වර්ෂයේ ජූනි මාසයේදී රුපියල් දශලක්ෂ 150 ක තවත් අත්තිකාරම් මුදලක් මහා භාණ්ඩාගාරය විසින් සපයන ලදී.

අඩු ආදායම් නිවාස වැඩ සටහනෙහි IV වැනි අදියරෙහි ක්‍රියාකාරිත්වය අංක II.9, II.10, II.11 සහ II.12 යන සංඛ්‍යා සටහන් වලින් දක්වා ඇත.

1995 වර්ෂයේදී මෙම යෝජනා ක්‍රමය යටතේ වන ණය මුදල් සඳහා රුපියල් දශලක්ෂ 305 ක ප්‍රතිමූල්‍ය පහසුකම් අනුමත කරන ලද අතර, එයින් රුපියල් දශලක්ෂ 277 ක් මුදා හරින ලදී. 1992 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා වන කාලපරිච්ඡේදයට අදාල සමුච්චිත සංඛ්‍යා වලට අනුව, රුපියල් දශලක්ෂ 889 ක ප්‍රතිමූල්‍ය පහසුකම් අනුමත කර ඇති අතර, රුපියල් දශලක්ෂ 637 ක් මුදාහැර ඇත.

II - 12 වැනි සංඛ්‍යා සටහන
අඩු ආදායම් නිවාස වැඩසටහන IV වැනි අදියර - ණය අනුමත කිරීම් - ආංශික සංයුතිය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව. (රු.'000)

වර්ෂය	එකතුව		ග්‍රාමීය අංශය				නාගරික අංශය			
			පුරුෂ		ස්ත්‍රී		පුරුෂ		ස්ත්‍රී	
	ණය මුදල් සංඛ්‍යාව	වටිනාකම	ණය මුදල් සංඛ්‍යාව	වටිනාකම	ණය මුදල් සංඛ්‍යාව	වටිනාකම	ණය මුදල් සංඛ්‍යාව	වටිනාකම	ණය මුදල් සංඛ්‍යාව	වටිනාකම
1992	4,273	27,381	2,977	19,205	1,244	7,445	39	523	13	208
1993	23,718	218,762	13,865	123,027	6,193	51,397	2,321	28,841	1,339	15,497
1994	22,733	338,291	13,317	195,544	5,669	73,466	2,600	50,223	1,147	19,057
1995	11,960	304,894	7,511	201,022	3,154	70,548	906	24,665	389	8,659
එකතුව	**62.684**	**889.328**	**37.670**	**538.798**	**16.260**	**202.856**	**5.866**	**104.252**	**2.888**	**43.421**

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මෙම යෝජනා ක්‍රමයෙහි උප ප්‍රධාන ණය දෙන්නන් ලෙස සහභාගී වේ. 1995 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේදී හම්බන්තොට, කළුතර, රත්නපුර සහ නුවරඑළිය යන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හතර ද මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (ජා.නි.සං.අ.), ලංකා බැංකුව මගින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වේ. මෙම යෝජනා ක්‍රමය යටතේ නිවාසයක් ඉදිකිරීම සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම, තිබෙන නිවාසයක් විශාල කිරීම හෝ වැඩි දියුණු කිරීම සහ දැනට තිබෙන නිවසක් අළුත්වැඩියා කිරීම ඇතුළත්ව, අයිතිකරු පදිංචි නිවසකට සම්බන්ධ ඕනෑම කාර්යයකට ණය පහසුකම් ප්‍රදානය කෙරේ. රුපියල් 5,700 ක්

මෙම යෝජනා ක්‍රමයේ ණය කරුවන් විශාල ප්‍රමාණයක් ග්‍රාමීය අංශයෙන් විය. එහෙයින් 1993 සහ 1994 වර්ෂයන්හි සියයට 80 ක සහ 1995 වර්ෂයේ සියයට 89 ක ණය ප්‍රමාණයක් අනුමත කර ඇත්තේ ග්‍රාමීය අංශයෙහි නිවාස කටයුතු උදෙසාය. ස්ත්‍රී පුරුෂ භාවය අනුව කරන ලද ණය වර්ගීකරණයට අනුකූලව 1995 වර්ෂයේදී ග්‍රාමීය අංශයෙහි මෙන්ම නාගරික අංශයෙහි සියයට 30 ක් ණයකරුවන් කාන්තාවන් විය.

ණය ලබාගැනීමට සුදුසුකම් ලබන කාර්යයන්ට අනුව කරන ලද වර්ගීකරණයට අනුව 1995 වර්ෂය තුළදී මෙම

යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන ලද ණය සංඛ්‍යාවෙන් සියයට 35 ක් පමණ නව නිවාස ගොඩනැගීම් සඳහා ද, සියයට 24 ක් නිවාස වැඩි දියුණු කිරීම් හෝ අළුත්වැඩියා කිරීම් සඳහා ද, සියයට 40 ක් නිවාස තැනීම සඳහා ඉඩම් හිමිකර ගැනීම සඳහා ද උපයෝගී කරගෙන ඇත. 1994 වර්ෂයේදී ඉඩම් හිමිකර ගැනීම් සඳහා ප්‍රදානය කරන ලද සියයට 24 ක් වන ණය මුදල් ප්‍රමාණය හා සසඳන කල 1995 වර්ෂයෙහි දී එම කාර්යය උදෙසා උපයෝගී කර ගන්නා ලද ණය ප්‍රමාණයෙහි සියයට 40 ක විශාල වැඩිවීමක් පෙන්නුම් කරයි.

1995 වර්ෂය තුළ අනුමත කරන ලද ණය මුදල් සංඛ්‍යාවෙන් සියයට 11 ක් රුපියල් 10,000 ට හෝ ඊට වඩා අඩු ණය ප්‍රමාණයක් වූ අතර, සියයට 25 ක් රුපියල් 10,000 ත් රුපියල් 25,000 ත් අතර ණය කාණ්ඩයට අයත් විය. තවත් සියයට 53 ක ණය මුදල් සංඛ්‍යාවක් රුපියල් 45,000 ත්, රුපියල් 100,000 ත් අතර විය. පසුගිය වර්ෂය හා සසඳන කල අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, මහජන බැංකුව සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් අනුමත කර ඇති ණය කොටසෙහි සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණු අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබාදුන් ණය කොටසෙහි අඩුවීමක් පෙන්නුම් කරනු ලැබිණි. එසේවුවද, රුපියල් 25,000 ට වඩා අඩු ණය මුදල් ලබාදෙන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මුළු ණය සංඛ්‍යාවෙන් සියයට 40ක් සඳහා තවදුරටත් දායකත්වය දෙමින් මෙම යෝජනා ක්‍රමය ඉතා අඩු ආදායම් ලබන කණ්ඩායම් සඳහා ණය ලබාදීමට ඇති වැඩි නැඹුරුව පිළිබිඹු කෙරිණි. 1995 වර්ෂයේදී මෙම වැඩපිළිවෙලෙහි ක්‍රියාකාරිත්වයෙහි ප්‍රමුඛ ලක්ෂණයක් වූයේ මූල්‍ය ආයතනයන් සමබරව මෙම යෝජනා ක්‍රමයෙහිලා දැක්වූ සහභාගිත්වයයි.

මෙම යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය මුදල් සංඛ්‍යාවන්හි ණය ආපසු ගෙවීමේ කාල සීමා රටාව අනුව, සියයට 46 ක ණය මුදල් ප්‍රමාණයක් වසර 5 දක්වා වූ අතර, තවත් සියයට 15 ක් වසර 5-10 දක්වා කාලපරිච්ඡේදයක් සඳහා ද, තවත් සියයට 38 ක් වසර 10-15 දක්වා කාලපරිච්ඡේදයක් සඳහා ද විය.

සුමක සහ බ.මි.ණ. ණය සහතික අරමුදල් ආයෝජනය කිරීම

1988 වර්ෂයේ ජූලි මාසයේදී ආරම්භ කරන ලද සුමක හා බ.මි.ණ. ණය සහතික ක්‍රම යටතේ වූ අරමුදල්, ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීම 1995 වර්ෂය තුළදී ද නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. 1995 වර්ෂය අවසානයේදී අරමුදල් සම්පත් සහ ඇප ආවරණ වාරික රැස්කිරීම් වල මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 899 ක් විය.

ආයෝජනයන්ගෙන් එම කාලපරිච්ඡේදයේදී ලැබූ පොළී ආදායම රුපියල් දශලක්ෂ 120.5 කි.

ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

සුළු කර්මාන්තකරුවන්ගේ යහපත උදෙසා දිස්ත්‍රික් මට්ටමින් විශේෂයෙන් සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් මගින් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන නොකඩවා පවත්වා ගෙන යන ලදී. ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන කර්මාන්ත කරුවන්ගේ කළමනාකරණ හා තාක්ෂණික කුසලතා වයන් වැඩි දියුණු කරගැනීම සඳහා වූ ඉල්ලුම් සපුරාලීම පිණිස මෙම වැඩසටහන් සංවිධානය කර ඇත. මේ මගින් ඔවුන්ගේ නිෂ්පාදිනයන් හා සේවාවන් වැඩි දියුණු කිරීමත්, ඒවා වෙළෙඳපොළේ වඩාත් තරඟකාරී තත්ත්වයකට පත්කිරීමත් අපේක්ෂා කෙරේ. මේ සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය ලෝක බැංකුව විසින් සුමක යෝජනා ක්‍රමය සඳහා ලබාදෙන තාක්ෂනික ආධාර වැඩ පිළිවෙල යටතේ 1993 වර්ෂයේ අග භාගයේදී අනුමත කරනු ලැබිණි. පාසල් හැරයන්නන් සහ රැකියා නොමැති ග්‍රාමීය තරුණ-තරුණියන් තුළ ව්‍යවසායකත්ව හැකියාවන් පිළිබඳව අවබෝධයක් ඇති කිරීමටත්, ඔවුන්ට බැංකු සහ වෙනත් සේවා ආයතනයන් සමඟ කටයුතු කිරීම ආශ්‍රිත කරුණු පිළිබඳව උපදෙස් දීමටත් අපේක්ෂාවෙන් 1995 වර්ෂයේදී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේදී පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. දින 2 ක් තුළ පැවති මෙම පුහුණු වැඩසටහනට පුද්ගලයින් 90 දෙනෙකු සහභාගි විය. හම්බන්තොට, දඹුල්ල, කළුතර, මහනුවර සහ හබරණ පැවැත්වුණු සම්මන්ත්‍රණවලදී දෙපාර්තමේන්තු නිලධාරීන් විසින්, සුමක සහ ණය ආවරණ සහතික ක්‍රම සම්බන්ධයෙන් මහජන බැංකු ශාඛා වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද දැනුවත් කරන ලදී.

වැවිලි කාර්මාන්ත අංශයෙහි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

රජය විසින් විගැඹි දශ ලක්ෂ 40.855 ක ණය මුදලක් ආසියානු සංවර්ධන බැංකුව හා ගිවිස ගන්නා ලදී. මෙම අරමුදල් වැවිලි අංශය සංවර්ධනය කිරීම සඳහා යොදා ගනු ලැබේ. මහ බැංකුව ප්‍රධාන ණයදෙන ආයතනය ලෙස කටයුතු කරමින් සහභාගිත්ව මූල්‍ය ආයතනවල ණය සඳහා ප්‍රතිමූල්‍ය සපයනු ලබන අතර සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය පරිපාලනය කරනු ඇත.

පසුවිපරම් කිරීම් සහ ව්‍යාපෘති පරීක්ෂණ.

1995 වර්ෂය තුළදී ද, ණය ප්‍රදානය කරනු ලැබූ සුමක ව්‍යාපෘතීන්හි ශක්‍යතාවය හා ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම තවදුරටත් සිදුකරන ලදී. අවශ්‍ය අවස්ථාවන්හිදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයක් නිර්දේශ කිරීමේ අරමුණින් මෙන්ම සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ඉදිරිපත් කරන ලද හිමිකම්පෑම් සමථයකට පත්කිරීම සඳහා සුමක ණය ක්‍රමය යටතේ වූ ව්‍යාපෘති 109 ක් පරීක්ෂාවට ලක්කරනු ලැබිණි. මෙම ව්‍යාපෘති වලින් වැඩි සංඛ්‍යාවක් කොළඹ, බදුල්ල, මහනුවර, මාතර, ගම්පහ සහ ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි ස්ථානගත වී තිබුණි

ග්‍රාමීය ණය

විමසුමට ලක්වන වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ ආයතන මගින් මූල්‍යකරණය කරනු ලබන ව්‍යාපෘති කිහිපයකම මෙහෙයුම් ආයතනය වශයෙන් ක්‍රියා කළේය. මෙහෙයුම් ආයතනය වශයෙන් මහ බැංකුව විසින් කළයුතු කාර්යයන්වලට සහභාගිවන ණයදෙන ආයතන ව්‍යාපෘතිවලට (ස.ණ.ආ.) ඇතුළත් කරගැනීම, එම ආයතනවලට මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම, ව්‍යාපෘති යටතේ අනුමත වූ ණය සඳහා එම ආයතනවලට ප්‍රතිමූල්‍ය මුදාහැරීම, ණය යෝජනා ක්‍රම මෙහෙයුම හා සම්බන්ධීකරණය, ණය වාර්තා පවත්වා ගෙනයාම සහ අනෙකුත් දේශීය ආයතන හා සම්බන්ධ වී ණය යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම ඇතුළත් විය. 1995 දී මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් පහත සඳහන් වේ.

(අ) ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ව්‍යාපෘති
- (i) කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය
- (ii) කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය
- (iii) මැදරට නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය
- (iv) දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය
- (v) වයඹ පළාතේ ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

(ආ) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල

(IFAD/ඉෆාඩ්) මගින් අරමුදල් සපයන ව්‍යාපෘති

(vi) කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

(ඇ) කෘෂිකාර්මික සංවර්ධන සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD/ඉෆාඩ්)/කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (CIDA/සීඩා)/ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන ව්‍යාපෘති

(vii) සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය (ඉසුරු) ව්‍යාපෘතිය

විමසුමට ලක්වන වර්ෂයෙහි ඉහත සඳහන් ව්‍යාපෘතිවල ක්‍රියාකාරිත්වය සම්බන්ධ විස්තර පහත සඳහන් වේ.

(i) කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය

උතුරු සහ නැගෙනහිර පළාත්වල දැනට පවතින සිවිල් යුද්ධය හේතුකොටගෙන විපතට පත් පුද්ගලයන් හා හානියට පත් දේපළ පුනරුත්ථාපනය කිරීම පිණිස මූල්‍ය පහසුකම් සපයනු ලැබූ ආසියානු සංවර්ධන බැංකුවෙහි අරමුදල් මගින් ක්‍රියාත්මක වූ කෘෂිකාර්මික පුනරුත්ථාපන ණය යෝජනා ක්‍රමය මහ බැංකුව විසින් සාර්ථක ලෙස සම්පූර්ණ කොට, 1995 ජූනි 30 වන දින අවසන් විය.

උතුරු පළාතේ යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් හා වව්නියාව යන දිස්ත්‍රික්ක, නැගෙනහිර පළාතේ අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක සහ උතුරු සහ නැගෙනහිර පළාත්වලට යාබද අනුරාධපුරය, හම්බන්තොට, මොණරාගල, පොළොන්නරුව, පුත්තලම යන දිස්ත්‍රික්කද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශ විය.

මෙම ව්‍යාපෘතිය යටතේ ණය සැපයීම සඳහා 1991 වර්ෂයේදී මහ බැංකුවේ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවන ලදි. එමගින් ව්‍යාපෘතියේ අවසන් දින වන විට ණය 12,896 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 688 ක් සහභාගිත්ව ණයදෙන ආයතන වෙත ප්‍රතිමූල්‍ය වශයෙන් ලබාදී තිබුණි. ව්‍යාපෘතියේ මුළු වෙන්කිරීම් වලින් සියයට 99 කට වැඩි ප්‍රමාණයක් නියමිත කාලය තුලදී මුදාහැරීමට හැකි විය. විපතට පත් පුද්ගලයන් ගෙන් ණය සඳහා පවතින දැඩි ඉල්ලුම නිසා, ණයකරුවන් විසින් ආපසු ගෙවන ලද ණය නැවත චක්‍රීකරණය කිරීමට මහ බැංකුව විසින් කටයුතු සලසන ලදී. මහ බැංකුව විසින් සහභාගිවන ණය දෙන ආයතන මගින් දෙන ලද ණය ආපසු අයකර ගැනීම හා ආපසු ණයදීම පිළිබඳව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් තවදුරටත් මෙහෙයුම් කටයුතු කරනු ඇත.

(ii) කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය

1989 ආරම්භ වූ කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතියද මූල්‍යකරණය කරනු ලැබුවේ ආසියානු සංවර්ධන බැංකුවයි. මෙම ව්‍යාපෘතිය 1995 වර්ෂයේ අවසානයේදී අවසන්වීමට නියමිතව තිබුණද, රජයේ ඉල්ලීම පරිදි එය 1997 වර්ෂය අවසානය දක්වා දීර්ඝ කරන ලදි. කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතියේ අරමුණු වන්නේ කුඩා තේ වතු හිමියන්ගේ තේ නිෂ්පාදනය හා අපනයන ඉහළ නැංවීම, තේ වල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම හා පෞද්ගලික තේ කර්මාන්තශාලාවල ඵලදායීතාව වැඩිදියුණු කිරීමයි. මෙම ණය ක්‍රමය යටතේ මූල්‍යකරණය කරනු ලබන කාර්යයන්වලට ක්ෂේත්‍ර සංවර්ධනය, පැල තවාන් සංවර්ධනය සහ කර්මාන්තශාලා පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම ඇතුළුව කර්මාන්තශාලා සංවර්ධනය ඇතුළත් විය. ක්ෂේත්‍ර මට්ටමේ පැවති විවිධ බාධාවන් හා ආයෝජනය අධෛර්යමත් කරවීමට හේතුවූ ලෝක වෙළෙඳපොළෙහි තේ මිල ගණන් අඩුවීම නිසා මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක කළ මුල් කාලය තුලදී සැලකිය යුතු පසුබෑමකට ලක්විය. විමසුමට ලක්වූ වර්ෂය තුලදී ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්මන්ත්‍රණ හා අනෙකුත් ප්‍රචාරක වැඩසටහන් ව්‍යාපෘතිය පවතින ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීම මගින් මෙතෙක් කරනු ලබූ ණය ලබාදීම දැනුවත් කිරීමේ වැඩසටහන තවදුරටත් කරගෙන ගියේය. 1995 දී මුලින් පැවති ණය යෝජනා ක්‍රමයට නොයෙකුත් සංශෝධන ඇතුළත් කෙරිණ. ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා දෙන ණය සීමාව ඉහළ දැමීම, ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා දෙනු ලබන ණයවල පොළී අනුපාතය සියයට 16 සිට සියයට 14 දක්වා සියයට 2 කින් අඩුකිරීම, ලියාපදිංචි තේ දළු එකතුකරන්නන් හා පෞද්ගලික තේ කර්මාන්තශාලා හිමිකරුවන් සඳහා වාහන ණය ලබාගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් ලිහිල් කිරීම ඉන් සමහරකි. මෙම පියවරයන් නිසා 1994 අග භාගයේදී හා 1995 දී ණය මුදාහැරීමේ අනුපාතය කඩිනම් කිරීම මගින් සහභාගි වන ණය දෙන ආයතනවලට ආසියානු සංවර්ධන බැංකුවේ ඉලක්ක කරා ළඟාවීමට හැකි විය. මෙම වර්ෂයේදී සහභාගී වන ණය දෙන ආයතන මගින් ක්ෂේත්‍ර සංවර්ධනය හා කර්මාන්තශාලා පුනරුත්ථාපනය සඳහා ණය අනුමත කිරීම හා මුදාහැරීම සැලකිය යුතු ආකාරයෙන් වැඩිවිය. සහභාගී වන ණය දෙන ආයතන විසින් 1995 වර්ෂය අවසාන වනවිට මුදාහල මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 339 කි. මෙයින් 1995 වර්ෂයේදී මුදාහල ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 193 කි. 1995 වර්ෂයේදී ක්ෂේත්‍ර සංවර්ධනය (තේ අළුතින් වගාව සහ තේ නැවත වගාව) සඳහා රුපියල් දශ ලක්ෂ 87 ක් වටිනා ණය මුදල් ලබාදී තිබූ අතර, පැල තවාන් සහ කර්මාන්තශාලා සංවර්ධන සඳහා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 8 ක් සහ රුපියල් දශ ලක්ෂ 98 ක් දී තිබුණි. 1995 වර්ෂය තුල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතියෙහි සියළු කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 92 ක ප්‍රතිමූල්‍ය ලබාදී තිබුණි.

(iii) මැදරට නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය

ආසියානු සංවර්ධන බැංකුවෙන් සපයන අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය 1995 වර්ෂය වනවිට වර්ෂ 7 ක් සම්පූර්ණ කර ඇත. විශේෂයෙන් සුළු අපනයන බෝග හා පලතුරු බෝග ඇතුළු නිත්‍ය භෝග නිෂ්පාදන වැඩිදියුණු කිරීම හා වාණිජ භෝග බවට පත්කිරීම සඳහා සහනදායී පොළී අනුපාත යටතේ මැදිකාලීන ණය මුදල් සැපයීමට මෙම ව්‍යාපෘතිය යටතේ සැලසුම් කරන ලදී. මීට අමතරව, රට තුල පවත්නා නිත්‍ය භෝගවලට අයත් ගොවිපල අස්වනු හැසිරවීමට හා සැකසීමට නව තාක්ෂණය යොදාගැනීම කෙරෙහිද ව්‍යාපෘතියෙහි අවධානය යොමු කෙරේ. මෙම ණය යෝජනා ක්‍රමය 1995 වර්ෂයේ දෙසැම්බර් මස අගදී අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, 1995 වර්ෂය තුල ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වයෙහි වූ ප්‍රගතිය සලකා බලා, ආසියානු සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘතිය නවත් වර්ෂ 2 ක් ඉදිරියට දීර්ඝ කර ඇත.

ණය ව්‍යාපෘතියේ සිදුකල ප්‍රතිශෝධනයන් යටතේ උතුරු නැගෙනහිර ප්‍රදේශ හැර රට තුල අනෙකුත් කලාපයන් ආවරණය වන සේ ව්‍යාපෘති ප්‍රදේශය ව්‍යාප්ත කිරීම සහ ව්‍යාපෘතිය යටතේ ණය දෙන ආයතන අළුතින් ඇතුළත් කිරීම හේතුවෙන් විමසුමට ලක්වන වර්ෂයේද ව්‍යාපෘතියේ අරමුදල් මුදාහැරීමේ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. 1995 නොවැම්බර්

මස අවසන් වනවිට සහභාගිවන ණය දෙන ආයතන විසින් අනුමත කරන ලද හා මුදාහරින ලද සමුච්චිත ණය මුදල් ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 598.3 ක් හා රුපියල් දශලක්ෂ 394.0 ක් විය. ණය දෙන ආයතන වලින් මුදාහරින ලද ණය මුදල්වලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එකී ආයතනවලට ලබාදී ඇති සමුච්චිත ප්‍රතිමූල්‍ය ප්‍රමාණය 1995 වර්ෂය අවසන් වනවිට රුපියල් දශලක්ෂ 183 ක් වේ.

ණයදෙන ආයතනවලින් උප ණය ලබාගැනීම සඳහා වූ විශාල ඉල්ලුමෙහි ප්‍රතිඵලයක් ලෙස උප ණයකරුවන් විසින් ඉදිරිපත් කරන ලද සියළුම ණය අයදුම්පත් සඳහා ප්‍රමාණවත් තරම් ණය සැපයීමට නොහැකි තත්ත්වයක් ඇතිවිය. එබැවින් ආසියානු සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘතියෙහි වෙනත් වියදම් ශීර්ෂයකින් ඩොලර් දශ ලක්ෂ 1 ක් ණය පංගුව සඳහා වෙන්කිරීමට එකඟ වී ඇත. තවදුරටත් මෙම ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය බැංකු දෙක සතුව ඇති ණය අයදුම්පත් සඳහා ඔවුන්ගේ අරමුදල්වලින් වර්ෂයකට සියයට 14 පොලියට දෙනු ලබන ණය මුදල්වලට රුපියල් දශලක්ෂ 100 ක උපරිමයක් දක්වා සියයට 5 ක පොලී සහනාධාරයක් මහා භාණ්ඩාගාරයෙන් ලබාදීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමැතිය ලබාගෙන තිබේ.

සහභාගිවන ණයදෙන ආයතන වල නිලධාරීන් 20 දෙනෙකු විශේෂයෙන් සකස් කරලන ලද පුහුණු පාඨමාලාවක් යටතේ නිත්‍ය භෝග ණය යෝජනා ක්‍රමයට සම්බන්ධ මෙහෙයුම, අධීක්ෂණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව පුහුණු කිරීමට අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරන ලදී. මෙම පුහුණු කිරීමේ පාඨමාලාව, 1995 ඔක්තෝබර් මසදී ඉන්දියානු සංචිත බැංකුවට අයත් කෘෂිකාර්මික බැංකු කටයුතු විදුහලේදී පැවැත්විනි. මෙම පුහුණු පාඨමාලාව සඳහා වියදම ව්‍යාපෘති අරමුදල්වලින් දරන ලදී.

(iv) දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සපයන දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියෙහි කටයුතු 1992 වර්ෂයේදී ආරම්භ විය. ව්‍යාපෘති බලප්‍රදේශයේ ආදායම් හා රැකියා අවස්ථාවන් ජනනය කිරීම මගින් දකුණු පළාතේ ජනතාවගේ ආදායම් හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. වි.ගැ.හි. දශලක්ෂ 6.4 (ආසන්න වශයෙන් රුපියල් දශලක්ෂ 450) ක ණය මුදලක් වෙන්කර ඇති මෙම ව්‍යාපෘතියේ ණය පහසුකම් සැපයීමේ මෙහෙයුම් ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරයි. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ ගාල්ල, මාතර හා හම්බන්තොට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු, සහභාගිවන ණය දෙන ආයතන ලෙස ඇතුළත් කරගෙන ඇති අතර, දකුණු පළාත් සභාවේ පිහිටුවන ලද ව්‍යාපෘති කාර්යාලය එම බැංකුවලට අවශ්‍ය සහාය ලබා දෙයි. මෙම ව්‍යාපෘතිය යටතේ වැලිගම වාර්ලිමවුන්ට් කාර්මික ජනපදයේ සුළු/මධ්‍ය පරිමාන කර්මාන්ත පිළිබඳ ව්‍යාපෘති මූල්‍යකරණය කිරීම සඳහා ද, දකුණු පළාතේ අනෙකුත් සුළු/මධ්‍ය පරිමාන ග්‍රාමීය ව්‍යාපාර වෙනුවෙන් සැපයෙන ණය සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණයදෙන ආයතනවලට සියයට 6 ක වාර්ෂික පොලියක් යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන අතර, ණයදෙන ආයතන විසින් ණයකරුවන්ට සියයට 14 ක වාර්ෂික පොලියකට ණය පහසුකම් සපයනු ලැබේ.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම 1994 වර්ෂයේදී ආරම්භ විය. 1995 වර්ෂය තුළදී දෙන ලද ණය 1,395 ක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් දශලක්ෂ 38.1 ක් ප්‍රතිමූල්‍ය වශයෙන් සපයා ඇත. 1995 වර්ෂය අවසානය වනවිට මෙතෙක් දෙන ලද ණය 3512 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 69.6 ක මුදලක් ප්‍රතිමූල්‍ය පහසුකම් වශයෙන් සපයා ඇත.

(v) වයඹ පළාතේ ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන මෙම ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය, එහි වැඩකටයුතුවල දෙවන වර්ෂය 1995 වර්ෂයේදී සම්පූර්ණ කළේය. මේ යටතේ පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ජනතාවට කෘෂිකාර්මික ළිං ඉදිකිරීම, සුළු පරිමාන උස්සාන වාරිමාර්ග ව්‍යාපෘති, කෘෂිකාර්මික කටයුතු හා ස්වයංරැකියා සඳහා ණය පහසුකම් සැලසේ. ස්වයංරැකියා කටයුතු යටතේ ණය සැපයීමේදී කාන්තාවන් සඳහා විශේෂ අවධානයකින් යුතුව ව්‍යාපෘතිය විසින් ණය සපයනු ලැබේ. ව්‍යාපෘතිය ආරම්භයේ සිටම කුරුණෑගල සහ පුත්තලම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, සහභාගිවන ණය දෙන ආයතන වශයෙන් ක්‍රියාත්මක වූ අතර, ණය මුදාහැරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම සඳහා 1995 නොවැම්බර් මාසයේදී ලංකා බැංකුව හා මහජන බැංකුව ද ණය යෝජනා ක්‍රමයට ඇතුළත් කරගන්නා ලදී. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදාහැරීම පිණිස ආසියානු සංවර්ධන බැංකුවෙන් වි.ගැ.හි. මිලියන 1.6 ක අරමුදල් (ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 90 ක්) ලබාදී ඇත. ණය යෝජනා ක්‍රමය යටතේ ඉදිකරනු ලබන කෘෂිකාර්මික ළිං ඉදිකිරීම සඳහා ගොවීන්ට සහනාධාර මුදල් ලබාදීම මගින් ශ්‍රී ලංකා රජයද මේ සඳහා දායකවෙයි.

1995 වර්ෂය අවසන් වනවිට සහභාගිවන ණයදෙන ආයතන විසින් කෘෂිකාර්මික ළිං 200 ක් ඉදිකිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 6.6 ක්ද, වයඹ පළාතේ කාන්තාවන් සඳහා වූ ස්වයංරැකියා උප ව්‍යාපෘතීන් 550 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 6.6 ක්ද මුදාහැර ඇත. 1995 ජූලි මස 1 වන දින සිට, ව්‍යාපෘතිය යටතේ මුදාහැරෙන උප ණය සඳහා අය කෙරෙන වාර්ෂික පොලී අනුපාතය සියයට 16 සිට සියයට 14 දක්වා පහත හෙලන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගි ණය දෙන ආයතන වෙත ලබාදෙන ප්‍රතිමූල්‍ය ණය සඳහා අය කෙරෙන වාර්ෂික පොලී අනුපාතය සියයට 8 සිට සියයට 6 දක්වා පහත හෙලනු ලැබිය.

(vi) කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

කෘෂිකර්මාන්තය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD/ඉෆාඩ්) මගින් මූල්‍යකරණය කරනු ලබන කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට කෘෂිකර්මය හා ස්වයංරැකියා කටයුතු සඳහා ණය ලබාදීමට ඇති ණය පංගුව වි.ගැ.හි. දශ ලක්ෂ 1.55 ක් වෙයි. මෙම ව්‍යාපෘතිය එහි කටයුතු 1987 ඔක්තෝබර් මසදී ආරම්භ කොට 1995 දෙසැම්බර් මසදී අවසන් කළේය. කෙසේ වුවද සහභාගිවන ණයදෙන ආයතන විසින් ව්‍යාපෘතිය අවසන් කිරීමට පෙර මුදාහළ ණය සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීමට 1996 ජූනි මස අග දක්වා මෙම ව්‍යාපෘතියේ ගිණුම් විවෘතව පවතිනු ඇත. 1995 අවසන් වනවිට සියළුම අංශ සඳහා මුදාහල ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 147 ක් වූ අතර, මෙය මුලින් වෙන්කරන ලද රුපියල් දශලක්ෂ 90 ක් (වි.ගැ.හි.1.55 ක්) අභිබවා යැමකි. කෙටිකාලීන වගා ණය මෙන්ම මැදිකාලීන කෘෂිකාර්මික හා කර්මාන්ත කටයුතු සඳහා ද ණය ලබාදී ඇත. 1995 දී කෙසෙල් වගාව, කිරිපට්ටි සංවර්ධනය හා ස්වයංරැකියා ව්‍යාපෘති සඳහා රුපියල් දශලක්ෂ 19.3 ක් මුදාහැර ඇත. ව්‍යාපෘතිය අවසන් වන අවස්ථාවේදී එම මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 8,471 ක් විය. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ව්‍යාපෘතිය

මගින් දෙන ලද ණය ආපසු අයකරගැනීම පිළිබඳ මෙහෙයුම් හා අධීක්ෂණය නොකඩවා කරනු ඇත.

(vii) සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය (ඉසුරු) ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා මහ බැංකුව මෙහෙයුම් ආයතනය වශයෙන් 1995 වර්ෂයේදීද ගාල්ල, මාතර, මහනුවර හා පුත්තලම දිස්ත්‍රික්කවල ඉසුරු ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය. ඉහතින් සඳහන් දිස්ත්‍රික්කවල දිළිඳුභාවය තුරන් කිරීම හා දිළිඳු ජනතාවගේ ජන ජීවිතය යහපත් කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වෙයි. මෙම කටයුතු සඳහා කෘෂිකර්මාන්තය සඳහා වන ජාත්‍යන්තර අරමුදලින් වි.ගැ.හි. දශලක්ෂ 4.8 ක ණය මුදලක් සහ කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනයෙන් (සීඩා) වි.ගැ.හි. දශලක්ෂ 4.7 ක ආපසු නොගෙවිය යුතු ආධාරත් ලැබී ඇති අතර, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට වි.ගැ.හි. 2.9 ක මුදලකින් ශ්‍රී ලංකා මහ බැංකුව දායක වනු ඇත. 1990 දී ආරම්භ වූ මෙම ව්‍යාපෘතියේ කටයුතු 1995 දී වර්ෂ 6 ක් සම්පූර්ණ කළේය.

1995 වර්ෂය අවසානයේදී මහනුවර හා පුත්තලම දිස්ත්‍රික්ක (ඉෆාඩ් දිස්ත්‍රික්ක) වෙනුවෙන් අනුමත කරනු ලැබූ ණය මුදල් සංඛ්‍යාව 19,700 ක් වන අතර, එහි වටිනාකම රුපියල් දශලක්ෂ 168 කි. ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක (සීඩා දිස්ත්‍රික්ක) වෙනුවෙන් අනුමත මුළු ණය මුදල් සංඛ්‍යාව 10,166 ක් වූ අතර, එහි වටිනාකම රුපියල් දශලක්ෂ 79.5 කි. ව්‍යාපෘතියෙන් ලබාදී ඇති ණය මුදල්වල ණය ආපසු ගෙවීම් සතුටුදායක අන්දමකින් පවත්වාගෙන යාමට හැකිව ඇති අතර, එම ණය අයකර ගැනීමේ ප්‍රතිශතයන් පිළිවෙලින් ඉෆාඩ් දිස්ත්‍රික්කවල සියයට 87 ක්වන අතර, සීඩා දිස්ත්‍රික්කවල සියයට 86 ක් වේ.

ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගේ ප්‍රගතිය ඇගයීම සඳහා අධ්‍යයනයක් ස්වාධීන ආයතනයක් විසින් 1995 වර්ෂයේ මැද භාගයේදී කරන ලදී. එම අධ්‍යයනයට අනුව ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගෙන් සියයට 85 ක් ඉලක්ක කණ්ඩායමට අයත් වන බවත්, මුළු ප්‍රතිලාභීන්ගෙන් සියයට 66 ක් ව්‍යාපෘතියෙන් ණය මුදල් ලබාගෙන ආරම්භ කරන ලද කටයුතුවලින් පසු දරිද්‍රතා ඉම් පසුකොට ඇති බවත් හෙළිවිය. එම අධ්‍යයනයෙන් පැහැදිළි වූ තවත් කරුණක් වූයේ ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබාදී ඇති ප්‍රතිලාභීන්ගෙන් සියයට 63 ක් පමණ කාන්තාවන් වන බවයි.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැං.)

ග්‍රාමීය ආර්ථිකයේ සංවර්ධන ක්‍රියාවලියට සහාය වෙමින් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල වැඩකටයුතු, 1995 වර්ෂය තුලදී තවදුරටත් පුළුල් විය.

ප්‍රා.ග්‍රා.සං. බැංකුවල ශාඛා ව්‍යාප්තිය

1995 වර්ෂය අවසානය වන විටද ක්‍රියාකාරිව පැවති මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 17 ක් ලෙස නොවෙනස්ව පැවතිනි. ප්‍රා.ග්‍රා.සං. බැංකුවල සමස්ත ශාඛා ප්‍රමාණය 171 දක්වා නංවාලමින් මෙම වර්ෂය තුලදී නව ශාඛා 2 ක් ප්‍රා.ග්‍රා.සං. බැංකු පද්ධතියට එක්කරනු ලැබිණි. (සංඛ්‍යා සටහන II-13)

තැන්පතු සංචලනය

වඩාත් ආකර්ශණීය තැන්පතු යෝජනා ක්‍රම හඳුන්වා දෙමින් සහ බැංකු පහසුකම් නොමැති හෝ එවැනි පහසුකම් අඩු ප්‍රදේශ වෙත ජංගම බැංකු සේවා සපයමින් ග්‍රාමීය අංශයේ ඉතිරි කිරීම් සංචලනය කිරීමේලා ප්‍රා.ග්‍රා.සං. බැංකු සැලකිය යුතු දායකත්වයක් දරා ඇත. 1994 අවසානයට පැවති තත්ත්වය

II - 13 සංඛ්‍යා සටහන
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා පද්ධතිය

නම	ආරම්භ කළ දිනය	ප්‍රධාන කාර්යාලය	විවෘත කරන ලද ශාඛා සංඛ්‍යාව											1995 අවසානයට එකතුව
			1985	1986	1987	1988	1989	1990	1991	1992	1993	1994	1995	
1. කළුතර	85.07.13	බුලත්සිංහල	4	3	4	1	-	-	1	2	-	-	-	15
2. මාතර	85.07.28	මාතර	5	2	-	1	-	-	-	4	-	-	-	12
3. කුරුණෑගල	85.08.10	කුලියාපිටිය	6	4	2	1	1	1	-	2	-	-	-	17
4. අනුරාධපුර	85.08.12	අනුරාධපුර	2	4	1	-	-	-	3	1	-	-	-	11
5. හම්බන්තොට	86.12.13	අම්බලන්තොට	-	2	2	2	-	1	-	1	-	-	-	8
6. කෑගල්ල	87.02.08	කෑගල්ල	-	-	8	1	2	1	1	1	1	1	-	14
7. පුත්තලම	87.07.11	හලාවත	-	-	5	1	-	2	1	1	-	-	-	10
8. ගාල්ල	87.08.17	ඇල්පිටිය	-	-	1	7	1	-	-	3	-	-	-	12
9. මහනුවර	87.10.13	මහනුවර	-	-	6	3	-	2	-	2	-	-	-	13
10. නුවරඑළිය	88.10.10	නුවරඑළිය	-	-	-	1	3	2	-	2	-	-	1	9
11. මොණරාගල	88.10.11	බුත්තල	-	-	-	1	2	1	2	-	-	-	-	6
12. බදුල්ල	90.10.13	බදුල්ල	-	-	-	-	-	4	2	3	-	4	-	13
13. පොළොන්නරුව	91.05.17	පොළොන්නරුව	-	-	-	-	-	-	4	2	1	-	-	7
14. මාතලේ	91.06.21	මාතලේ	-	-	-	-	-	-	5	1	-	-	-	6
15. රත්නපුර	91.09.30	රත්නපුර	-	-	-	-	-	-	4	2	1	-	-	7
16. අම්පාර	92.02.24	අම්පාර	-	-	-	-	-	-	-	5	2	-	-	7
17. ගම්පහ	93.06.07	ගම්පහ	-	-	-	-	-	-	-	-	2	1	1	4
එකතුව			**17**	**15**	**29**	**19**	**9**	**14**	**21**	**32**	**7**	**6**	**2**	**171**

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

හා සැසඳීමේදී මුළු තැන්පතු වටිනාකමෙහි සියයට 17 ක හා ගිණුම් සංඛ්‍යාවේ සියයට 8 ක වර්ධනයක් පෙන්නුම් කරමින්, 1995 සැප්තැම්බර් මාසය අවසානයට ප්‍රා.ග්‍රා.සං. බැංකුවල සමස්ත තැන්පතු ප්‍රමාණය ගිණුම් 902,996 කට අදාලව රුපියල් දශ ලක්ෂ 1760 ක් දක්වා ඉහළ නැංවිණි. මෙම තැන්පතු වලින් වැඩි ප්‍රමාණය සාමාන්‍ය ඉතුරුම් තැන්පතු විය. ගිණුම් 894,659 ක් යටතේ තැන්පතු වී තිබූ සාමාන්‍ය ඉතුරුම් තැන්පතු වල මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 1,439 ක් විය. 1994 වර්ෂයේදී රුපියල් 1534 ක් වූ සාමාන්‍ය ඉතුරුම් ගිණුමක තැන්පතු වටිනාකමෙහි සාමාන්‍ය ශේෂය, 1995 දී රුපියල් 1,608 දක්වා සුළු වැඩිවීමක් පෙන්විය. ස්ථාවර තැන්පතු ගිණුමක සාමාන්‍ය අගය 1994 දී රුපියල් 30,370 ක් වූ අතර, එය 1995 දී රුපියල් 39,541 දක්වා ඉහළ නැගිණි.

ණය දීම්

රන් සහ රන් භාණ්ඩ උගස මත ලබා දෙන අත්තිකාරම්ද ඇතුළුව, 1995 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් මුදාහරින ලද ණය සංඛ්‍යාව 258,547 ක් වූ අතර, ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,481 ක් විය. 1994 වර්ෂය තුලදී ණය 327,187 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 1,808 ක් මුදාහරින ලදී. 1994 වර්ෂයේදී රුපියල් 5,526 ක් වූ ණය මුදලක (රන් භාණ්ඩ උගස් ණයද ඇතුළුව) සාමාන්‍ය වටිනාකම 1995 වර්ෂයේදී රුපියල් 5,728 දක්වා ක්‍රමික වැඩිවීමක් පෙන්විය.

ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් 1995 දී හඳුන්වාදෙන ලද නව ණය යෝජනා ක්‍රම අතර, විදේශ රැකියාලාභීන් සහ ගුරුවරුන් සඳහා වූ ණය යෝජනා ක්‍රමද විය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ත කාර්යාංශයේ සහයෝගය ඇතිව ප්‍ර..ග්‍රා.සං. බැංකු විසින් හඳුන්වාදෙන ලද විදේශ රැකියාලාභීන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය යටතේ, දකුණු කොරියාවේ රැකියාවන් සඳහා තෝරාගන්නා පුද්ගලයින්ට ඔවුන් විදේශගත වීමට පෙර ණය පහසුකම් ලබා දීමට කටයුතු කරන ලදී. වර්ෂය තුලදී ප්‍රා.ග්‍රා.සං. බැංකු ණය ආපසු අයකර ගැනීම කෙරෙහිද සිය අවධානය යොමු කරන ලදී.

අනෙකුත් කටයුතු

ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් සිය ගනුදෙනුකරුවන් සඳහා උපකාරක සේවාවක් සැපයීමට හා ග්‍රාමීය ආර්ථිකයේ සංවර්ධනය සඳහා වන සිය කාර්යභාරය ඉටු කිරීමට තවදුරටත් පියවර ගන්නා ලදී. තවද, සිය ගනුදෙනුකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමේ කටයුතු සම්බන්ධීකරණය කරමින් ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් උපදේශාත්මක සහායන්ද ලබා දුණි. ගම්මානවල ජනහමු පැවැත්වීමේ කටයුතු මෙම බැංකු විසින් තවදුරටත් පවත්වා ගෙන යන ලද අතර, එමගින් ප්‍රා.ග්‍රා.සං, බැංකුවලින් ලබාගත හැකි බැංකු සේවා පහසුකම් පුළුල් කිරීමට ඉඩකඩ සැලසිණි. එමෙන්ම ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් කෘෂිනිෂ්පාදන සැකසීම හා අලෙවිකරණ කටයුතු වැඩි දියුණු කිරීමට තවදුරටත් පියවර ගන්නා ලදී.

කුඩා තේ වතු සංවර්ධන ණය යෝජනා ක්‍රමය, බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය, කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමෙරිකා එක්සත් ජනපද නියෝජ්‍යායතනයෙහි අඩු ආදායම් නිවාස වැඩසටහන, දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය, සුළු හා මධ්‍යම පරිමාන කර්මාන්ත ණය යෝජනා ක්‍රමය සහ ඉසුරු ව්‍යාපෘතිය යන ණය යෝජනා ක්‍රමවල සහභාගිත්ව ණය දෙන ආයතනයන් ලෙස ප්‍රා.ග්‍රා.සං. බැංකු තවදුරටත් කටයුතු කරන ලදී.

ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

1995 වර්ෂය තුලදී ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ බැංකු, වෙනත් මූල්‍ය ආයතන සහ බැංකු නොවන සංවිධානවල කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතාවයන් බොහෝදුරට සලසා දෙන ලදී.

මෑත වර්ෂ වල, ක්ෂේත්‍ර නිලධාරින් සහ ආයතනික ණය ප්‍රතිලාභීන් පුහුණු කිරීමෙහි සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබේ. මෙම පුහුණු වැඩසටහන්, සංවර්ධනය පිළිබඳව අවධාරණය කරනු ලැබ ඇති අතර ජාතික ආර්ථික අවශ්‍යතාවයන් විශේෂයෙන්ම දිළිඳුකම පිටුදැකීම සහ පුනරුත්ථාපන යන ක්ෂේත්‍ර වල අවශ්‍යතාවයන් සපුරාලීමට හැකි වන පරිදි නිර්මාණය කරනු ලැබිණි.

පුහුණු පාඨමාලා සඳහා ලැබුණු ඉල්ලීම් ගණනාවක් පිළිබඳව සලකා බලා, බැංකු සහ ආර්ථික අංශවල ප්‍රගතියද සැළකිල්ලට ගනිමින් විශේෂයෙන්ම නවීන විධි සහ ක්‍රම උපයෝගී කරගත හැකි විවිධ පාඨමාලා සහ විෂය ක්ෂේත්‍රයන් ඇතුලත් වන පරිදි ඉදිරි වර්ෂය සඳහා පුහුණු පාඨමාලා නිර්මාණය කරන ලදී. මෙම පුහුණු පාඨමාලා වලින් 32 ක් විශේෂයෙන්ම මහ බැංකු නිලධාරින් වෙනුවෙන් මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු විසින් හඳුනාගන්නා ලද ක්ෂේත්‍රයන් සඳහා විය. මහ බැංකු නිලධාරීන් සඳහා වන තවත් එවැනි පුහුණු වැඩසටහන් වූයේ, ජනප්‍රිය පරිගණක මෘදුකාංග වැඩසටහන් භාවිතය පිළිබඳ ප්‍රාථමික සහ උසස් මට්ටමේ පුහුණු පාඨමාලාවන්ය. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු බල ප්‍රදේශයනට යෝග්‍ය සහ ප්‍රයෝජනවත් ව්‍යාපෘති සම්බන්ධව, ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සඳහා වන පුහුණු පාඨමාලා 19 ක් ද මේ අතර වේ. අනෙකුත් අංශ සම්බන්ධයෙන් ද කාලෝචිත විෂයයන් සහ ජනප්‍රිය අධ්‍යයන ක්ෂේත්‍ර මත විවිධ පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු නිර්මාණය කරන ලදී.

සේවා අංශයේ සංවිධාන සඳහා පූර්ණ තත්ත්ව කළමනාකරණය, ඵලදායී සම්පත් වෙන්කිරීම, ව්‍යුහගත ගැලපුම් ක්‍රියාවලිය සහ නැගී එන ලෝක වෙළෙඳපොළ ආර්ථික පාඨමාලා 1996 වර්ෂයේදී කිරීමට සැලසුම් කර ඇති නව පාඨමාලා සමහරකි.

අභ්‍යාස විද්‍යාලය මගින් 1995 ජුලි මාසයේ දී, 30 දෙනෙකුගේ සහභාගීත්වයෙන් දකුණු ආසියාතික රටවල් සඳහා කළමනාකරණ සංවර්ධනය යන මැයෙන් ඇප්‍රකා - සෙන්ට්‍රබ් ජාත්‍යන්තර පාඨමාලාව සාර්ථකව පවත්වන ලදී. ඉදිරි වර්ෂයේදී ද මීට සමාන පාඨමාලා කිහිපයක් පැවැත්වීමට බලාපොරොත්තු වේ.

1994 අප්‍රේල් මාසයේ සිට මහ බැංකු නිලධාරින් සඳහා ඉංග්‍රීසි භාෂා ස්වයං අධ්‍යයන මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක වේ. මේ මගින් අනාගතයේදී නව පාඨමාලා හඳුන්වා දීමට බලාපොරොත්තු වේ.

බැංකු සහ අනෙකුත් මූල්‍ය අංශයන්හි පුහුණු අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන ඒකකයක් පිහිටුවන ලදී. මෙම ඒකකය පාඨමාලා වල තත්ත්වය වැඩිදියුණු කිරීම, නව ආර්ථික ක්‍රියාකාරිත්වයට සරිලන නව පාඨමාලා හඳුන්වාදීම, පුහුණු වැඩකටයුතු හා සම්බන්ධ පර්යේෂණ වල නිරතවීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශවල පශ්චාත් පුහුණු ක්‍රියාකාරිත්වය ඇගයීම යන වගකීම් දරනු ලබයි. කුඩා පරිමාන ව්‍යවසායකයන්ට උපදෙස් සැපයීම සහ මගපෙන්වීම සඳහා

ව්‍යවසායකත්ව උපදේශක ඒකකයක්ද පිහිටුවන ලදී

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.)

සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධානයන්ට අනුව එම අරමුදලට කෙරෙන දායක මුදල් සහ අධිභාර මුදල් ලබා ගැනීම, අරමුදල සතු මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම් ලබා ගැනීම, අරමුදලේ ලියාපදිංචි සේවායයන්ගේ හා ඒ ඒ සාමාජිකයන්ගේ ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වාගෙන යාම, ප්‍රතිලාභ මුදල් සාමාජිකයන් වෙත ආපසු ගෙවීම් යන වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනමය කටයුතු භාරව සිටින කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය සමග සමීප සහයෝගිතාවයකින් යුතුව මෙම කටයුතු කරන ලදී.

දායක මුදල්

තාවකාලික දත්තයන්ට අනුව, 1994 වර්ෂයේදී ලැබූ රුපියල් බිලියන 7.4 හා සසඳා බලන කළ 1995 වර්ෂය තුලදී අරමුදලට ලැබුණු දායක මුදල් ප්‍රමාණය, රුපියල් බිලියන 8.2 ක් විය. මෙය පෙර වර්ෂයේ ලැබූ දායක මුදල් මට්ටමට වඩා සියයට 11 ක වැඩි වීමකි.

සාමාජිකයින්ගේ ශේෂ

විමසුමට ලක්වන වර්ෂය සඳහා පොලී එකතු කිරීමට පෙර, 1995 දෙසැම්බර් 31 වැනි දිනට සාමාජිකයින්ගේ ශේෂයන්හි මුළු වටිනාකම රුපියල් බිලියන 81.5 ක්ව පැවැති අතර, එය 1994 වර්ෂයට වඩා රුපියල් බිලියන 5.8 ක හෙවත් සියයට 8 ක වැඩිවීමකි.

ආයෝජන

විමසුමට ලක් කරන වර්ෂය තුලදී අරමුදල මගින් රජයේ සුරකුම්පත්, භාණ්ඩාගාර බිල්පත්, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි සහ රජයේ වගකීම් සහිත ණයකර වල ආයෝජනය කරන ලද මුදල රුපියල් බිලියන 45 ක් වේ. මෙය 1994 දී පැවැති ආයෝජන මට්ටමට වඩා රුපියල් බිලියන 7 ක වැඩිවීමකි. 1995 දෙසැම්බර් 31 වැනි දිනට අරමුදල සතු මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 100 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1994 දී පැවැති මුළු අයෝජන මට්ටමට වඩා රුපියල් බිලියන 19 ක වැඩි වීමකි.

ආයෝජන වලින් ලැබූ ආදායම

1989 දේශිය ආදායම් පනතේ සංශෝධනයකට අනුව සේවක අර්ථසාධක අරමුදලට ප්‍රදානය කර තිබූ ආදායම් බදු නිදහස ඉවත් කරන ලදී. මේ අනුව, 1989 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයෝජන මගින් උපයන ආදායම සියයට 10 ක රඳවා ගැනීමේ බද්දකට යටත් වේ. 1995 වර්ෂය සඳහා ආයෝජන ආදායමෙන් අඩු කරන ලද රඳවා ගැනීමේ බද්ද සහ වර්ෂය තුල ගෙවන ලද හිඟ මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 1.8 ක් විය.

1994 වර්ෂයේ ආයෝජන මගින් ලැබූ රුපියල් බිලියන 11 ක ආදායම සසඳා බැලීමේදී, 1995 වර්ෂයේදී ආයෝජන මගින් ලද ආදායම රුපියල් බිලියන 3 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් බිලියන 14 ක් විය.

ප්‍රතිලාභ ආපසු ගෙවීම

1994 වර්ෂය තුලදී සාමාජිකයන්ට සේ.අ.අ. ප්‍රතිලාභ ආපසු ගෙවීම් වශයෙන් ගෙවන ලද මුළු මුදල රුපියල් බිලියන 2.6 ක් වූ අතර, එය 1995 වර්ෂයේදී රුපියල් බිලියන 2.7 ක් විය. මෙය සියයට 4 ක වැඩි වීමක් වාර්තා කරයි. 1994 වර්ෂයේදී ගෙවා නිම කරන ලද 49,986 ක් වූ ප්‍රතිලාභ සංඛ්‍යාව හා සසඳන කළ 1995 වර්ෂය තුලදී 52,258 ක ප්‍රතිලාභ හිමිකම් පෑම් සඳහා ගෙවීම් කරන ලදී.

සේවක අර්ථසාධක අරමුදල් නිවාස ණය යෝජනා ක්‍රමය

සාමාජිකයන්ගේ ගිණුම්වල බැරට ඇති ශේෂයන්ගෙන් සියයට 75 ක් දක්වා ආවරණය වන පරිදි නිවාස නැනීමේ කටයුතු වෙනුවෙන් තෝරාගත් ණය දෙන ආයතන වලින් ණය ලබාගත හැකි වන පරිදි 1988 අංක 42 දරණ පනතින් සේ.අ.අරමුදල් පනත සංශෝධන කරන ලදි. මෙම යෝජනා ක්‍රමය සඳහා සහභාගි වන ණය දෙන ආයතන වනුයේ, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ සමූපකාර ග්‍රාමීය බැංකුවය.

1995 දෙසැම්බර් 31වන දිනට සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත ශේෂයන් නහවුරු කිරීම සඳහා ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාවෙන්, අයදුම්පත් 59,980ක කටයුතු අවසාන කොට අදාල කම්කරු කාර්යාලයන් වෙත යවන ලදී.

විනිමය පාලන

1994 මාර්තු 15 දින ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගිවිසුම් වගන්ති VIII යටතේ ඇති බැඳීම් පිළිගැනීමත් සමඟ, 1995 වර්ෂයේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ කටයුතු ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන ගිණුමේ ගණුදෙනු වලට සම්බන්ධ අයදුම්පත් අනුමත කිරීමට සහ විශාල ජංගම ජාත්‍යන්තර ගණුදෙනුවලට, විශේෂයෙන්ම ඇමෙරිකන් ඩොලර් 20,000 ට වැඩි හෝ ඊට සමාන වෙනත් විදේශ මුදල් නිදහස් කිරීම් අධීක්ෂණයට සීමාවිය.

වාසික සමාගම් විසින් එතෙර කරනු ලබන අයෝජන

1995 වර්ෂය තුලදී ශ්‍රී ලංකා සමාගම් කීපයකටම තම භාණ්ඩ අලෙවිකර ගැනීම සඳහා එම භාණ්ඩ අලෙවි කරන විදේශ රටවල් සමඟ හා අසල්වැසි රටවල් සමඟ බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවසර ලබාදෙන ලදී. මාලදිවයිනේ සහ සිංගප්පූරුවේ හෝටල් ඉදි කිරීමේ කටයුතු වල යෙදී සිටින කළමනාකරණ සමාගම්වල අයෝජනය කිරීමට අවසර දෙනු ලැබිය. තවද විදේශ රටවල අතුරු කොන්ත්‍රාත් ලබාගැනීම සඳහා සහ විදේශ ඉදිකිරීම් සමාගම් සමඟ ගිවිසුම් ඇතිකර ගැනීමටද අවසර දෙනු ලැබිය.

විදේශ ව්‍යවහාර මුදල් ණය

අපනයන ඇණවුම් සැපයීම සඳහා වටිනාකම එකතුවන දේශිය යෙදවුම් මිලදී ගැනීම සඳහා විදේශිය මුදලින් ණය ලබාගැනීමට ඉදිරිපත් කරන ලද එක් එක් අයදුම්පත් වෙන් වෙන් වශයෙන් සළකා බලා අනුමත කරන ලදී.

රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, රජය වෙනුවෙන් රාජ්‍ය ණය කළමනාකරණය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මාර්ගයෙන් කරගෙන යනු ලැබිණ. රජයේ සුරකුම්පත් (රුපියල් ණය), භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර නැත්පතු සහතික,

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් යොදා ගන්නා ලද ප්‍රධාන ණය උපකරණ විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව එහි වගකීම් ඉටුකිරීමේදී දේශීය ණය නිකුතුව හා සේවාකරණය ද, ශ්‍රී ලංකා රජයේ විදේශ ණය සේවාකරණයද, මහ බැංකු සුරැකුම්පත් සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ණයකර නිකුත් කිරීම ද කරන ලදී. ප්‍රාථමික වෙළෙඳ නියෝජිත ක්‍රමය තුලින් ණය සුරැකුම්පත් වෙළෙඳපොල දියුණු කිරීමේ පරමාර්ථය ඇතිව 1995 වර්ෂයේදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මූලික පියවර රැසක් ගෙන ඇත.

ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

රජයේ ණය උපකරණ සඳහා වූ වෙළෙඳපොල වැඩිදියුණු කිරීමේ පරමාර්ථයෙන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග රැසක් විමර්ශනයට භාජනය වූ වර්ෂය තුලදී හඳුන්වා දෙන ලදී. 1992 ජූලි මාසයේ ආරම්භ කරන ලද ප්‍රාථමික වෙළෙඳ නියෝජිත ක්‍රමය 1994 නොවැම්බර් මාසයේදී විධිමත් කරන ලද අතර, ප්‍රථම වරට එහි ක්‍රියාකාරිත්වය විමර්ශනයට භාජනය කිරීම 1995 ජූනි මාසයේදී සිදු කෙරිණි. මුදල් වෙළෙඳපොලේ, විශේෂයෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොලේ, සිදුවන වර්තමාන සිදුවීම් පිළිබඳව, වෙළෙඳපොල සහභාගිකයන් සමඟ අඛණ්ඩ සාකච්ඡා පවත්වාගෙන යාමේ අදහසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් සමඟ සතිපතා රැස්වීම් පවත්වනු ලැබිය. එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (USAID) මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධන ව්‍යාපෘතියේ, සහභාගිත්වය ඇතිව, දෙපාර්තමේන්තුව විසින් ආයෝජකයන් හා ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් සඳහා ස්ථාවර ආදායම් සහිත සුරැකුම්පත් පිළිබඳව සම්මන්ත්‍රණ/වැඩමුළු දෙකක් 1995 වර්ෂය තුලදී සංවිධානය කරන ලදී. ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන්ට ඔවුන්ගේ වෙළෙඳ ගණුදෙනු හා ඒවා සමථයකට පත්කිරීමේ කටයුතු සඳහා සහ මහ බැංකුවට තොරතුරු සැපයීමේ කටයුතු සඳහා ද පරිගණකගත කරන ලද ක්‍රම භාවිතා කිරීමට උනන්දු කරවන ලදී. ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන්ගේ වෙළෙඳපොල කටයුතු පිළිබඳ තොරතුරු පරිගණක තැටි (diskettes) මගින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් දියුණු කරන ලද පරිගණක මෘදුකාංග පද්ධතියක් ඔවුන් වෙත නිකුත් කරන ලදී. ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන්ගෙන් ලබාගත් තොරතුරු උපයෝගී කරගනිමින් ද්විතීය වෙළෙඳපොලේ කටයුතු පිළිබඳ දත්ත පදනමක් දෙපාර්තමේන්තුව තුල සකස් කරන ලදී. මෙම දත්ත ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් විසින් කරන ලද ද්විතීය වෙළෙඳ කටයුතු සුපරීක්ෂණය හා විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගැනිණ. මෙලෙස ලබාගත් තොරතුරු මත, ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් විසින් ප්‍රාථමික හා ද්විතීය වෙළෙඳපොලවල් දෙකේම කරන ලද කටයුතු පිළිබඳව වාරික ප්‍රකාශන ඔවුන් වෙත නිකුත් කිරීම ආරම්භ කරන ලදී.

රාජ්‍ය සහ මහ බැංකු සුරැකුම්පත් වෙළෙඳපොල දියුණු කිරීමේ අදහසින් මුදල් නීති පනත, ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා සුරැකුම්පත් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සංශෝධනය කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මූලිකව කටයුතු කරන ලදී. 1995 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සංශෝධන අනුව බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන්ට මහ බැංකුවෙහි ජංගම ගිණුම් විවෘත කිරීමේ පහසුකම් සැපයීම, භාණ්ඩාගාර බැඳුම්කර නමින් වූ මධ්‍යම හා දීර්ඝ කාලීන නව උපකරණයක් සහතික පත් සහිතව හෝ රහිතව වෙන්දේසි පදනමක් මත ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් මගින් මහජනයා වෙත නිකුත් කිරීම සහ භාණ්ඩාගාර බිල්පත් සහතිකපත් රහිතව නිකුත් කිරීම ඇතුලත් විය.

මෙහෙයුම් කටයුතු

1995 වර්ෂය අවසානයේදී නොපියවූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 616,382ක් විය. 1994 වර්ෂය අවසානයේදී පැවති තත්ත්වය සමඟ සංසන්දනය කරන විට එය රුපියල් දශ ලක්ෂ 77,817 ක වැඩිවීමක් පෙන්නුම්කරයි. 1995 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 344,475 ක් වූ නොපියවූ විදේශ ණය වගකීම් ප්‍රමාණය 1994 අවසානයේ පැවැති ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 42,512 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලද අතර, මෙයින් රුපියල් දශලක්ෂ 28,676 ක් විදේශ විනිමය අනුපාතවල උච්චාවචනයන් නිසා සිදු විය. රජයේ නොපියවූ මුළු ණය ප්‍රමාණයෙන් විදේශ ණය සියයට 55.9 ක් වූ අතර, ඉතිරි සියයට 44.1 දේශීය ණය නියෝජනය කෙරිණි. දළ රාජ්‍ය ණය සංයුතිය II-14 වැනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

II - 14 සංඛ්‍යා සටහන
දළ රාජ්‍ය ණය සංයුතිය

	1994 අවසානයේදී රුපියල් දශ ලක්ෂ	%	1995 අවසානයේදී රුපියල් දශ ලක්ෂ	%
දේශීය ණය	236,602	43.9	271,906	44.1
භාණ්ඩාගාර බිල්පත්	98,896		113,771	
රුපියල් සුරැකුම්පත්	137,554		157,928	
භාණ්ඩාගාර තැන්පතු				
සහතික	145		200	
බදු සංචිත සහතික	7		7	
විදේශ ණය	301,963	56.1	344,475	55.9
එකතුව	**538,565**	**100.0**	**616,382**	**100.0**

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

භාණ්ඩාගාර බිල්පත්

1995 වර්ෂයේදී රජයේ දේශීය වශයෙන් ණය ලබාගැනීමේ ප්‍රධාන උපකරණය භාණ්ඩාගාර බිල්පත් විය. 1995 වර්ෂය අවසානයේදී නොපියවූ මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 113,771 පෙර වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 98,896 සමඟ සසඳන විට රුපියල් දශ ලක්ෂ 14,875 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. මෙය විමර්ශනයට භාජනය වූ වර්ෂය තුල කරන ලද රුපියල් දශ ලක්ෂ 16,475 ක් වූ නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම්වල සහ රුපියල් දශලක්ෂ 1,600 ක් වූ භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමේදී නැවත නිකුත් නොකිරීමේ ප්‍රතිඵලයකි. භාණ්ඩාගාර බිල්පත්වල අනුදත් සීමාව 1995 වර්ෂය තුලදී රුපියල් දශ ලක්ෂ 125,000 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. භාණ්ඩාගාර බිල්පත් හා මහ බැංකු සුරැකුම්පත් ප්‍රාථමික වෙන්දේසි කටයුතු වැඩිදියුණු කිරීමේ බලාපොරොත්තුවෙන් 1995 මැයි මස ප්‍රථම සතියේ සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් ක්‍රියාමාර්ග මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

(අ) 1995 මැයි මාසයේ සිට එක් අවුරුදු කාලසීමාවක් ඇතුලත "ග්‍රහනිත ආයෝජකයන්" විසින් තරඟකාරී නොවන අයුරින් ලංසු තැබීම අනුක්‍රමයෙන් ඉවත් කිරීම.

(ආ) එකිනෙක කල්පිරෙන කාල සීමාවන් යටතේ ප්‍රාථමික වෙන්දේසි වලදී මහජනතාවට නිකුත් කෙරෙන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයන් නිශ්චය කිරීම සහ ඒවා කලින් ප්‍රකාශයට පත්කිරීම.

1994 නොවැම්බර් මස නිකුත් කරන ලද "ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් සඳහා අදාල වන වගකීම් හා වරප්‍රසාද අඩංගු ප්‍රකාශනයේ" 6.1 වැනි වගන්තියට අනුව 1995 වර්ෂයේදී ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ වාර්ෂික විමර්ශනයක් 1995 ජූනි මාසයේදී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙම විමර්ශනයේදී ලැබුණු සොයාගැනීම් පදනම් කරගනිමින්, ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් දෙදෙනෙකුගේ බලපත්‍ර මහ බැංකුව විසින් අවලංගු කරන ලද අතර, නියෝජිතයන් දෙදෙනෙකු අළුතින් පත්කර ගන්නා ලදී. ඒ අනුව ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන්ගේ මුළු සංඛ්‍යාව 22 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි.

මූල්‍ය කළමනාකරණ උපක්‍රමවල කොටසක් වශයෙන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, බැංකු කටයුතු දෙපාර්තමේන්තුව හා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සේවාකරණය කෙරෙන මූල්‍ය මෙහෙයුම් ඒකකය මගින් භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි පිළිබඳ තීරණ ගැනීම සතිපතා කර ගෙන යන ලදී. මෙම තීරණවලට වෙළෙඳපොලට ඉදිරිපත් කෙරෙන භාණ්ඩාගාර බිල්පත්වල සංයුතිය, මහ බැංකුව මිලදී ගනු ලබන භාණ්ඩාගාර බිල්පත් සඳහා කල්පිරෙන කාලසීමාවන්, වෙන්දේසිය පැවැත්වීමට කලින් මහජනතාවට ඉදිරිපත් කරන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය ආදිය ඇතුලත් විය.

සතිපතා පැවැත්වෙන ප්‍රාථමික වෙන්දේසිවලට සහභාගිවීම ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන්ට සහ මහ බැංකුව මගින් බලය දෙන ලද වෙනත් ආයතනවලට පමණක් සීමා කෙරිණි. ප්‍රාථමික වෙළෙඳපොලේ ප්‍රධාන මිලදී ගන්නන් වූයේ විශාල වශයෙන්ම වාණිජ බැංකු ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් සහ බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් කිපදෙනෙකි. ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් කිහිපදෙනෙකු ද්විතීය වෙළෙඳපොලේ ක්‍රියාකාරී ලෙස සහභාගී වන බව නිරීක්ෂණය විය. මහ බැංකුවේ ද්විතීය වෙළෙඳ කවුළුව වාණිජ බැංකුවලට පමණක් සීමා විය.

ප්‍රාථමික වෙළෙඳපොලේ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගන්නා ප්‍රධන ගැනුම් කරුවන් වූයේ ස්වකීය වත්කම් වෙනුවෙන් සහ අනෙකුත් අය වෙනුවෙන් එකී බිල්පත් මිලදී ගන්නා බැංකු කරුවන් වන ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන්ය. ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අනුමත අර්ථ සාධක අරමුදල් සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අරමුදල් වැනි" ග්‍රහනිත ආයෝජකයන්" වෙනත් ප්‍රධාන මිලදී ගන්නන් අතර විය.

ප්‍රාථමික නිකුත්කිරීම් වලින් මහ බැංකුව වෙත පැවති භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ8,979 හෙවත් සියයට 9.1 සිට 1995 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 14,984 හෙවත් සියයට 13 දක්වා වැඩි විය. මහ බැංකු නොවන ආයතන වෙත පැවති බිල්පත් වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 89,917 සිට රුපියල් දශ ලක්ෂ 98,786 දක්වා වැඩි විය. කෙසේ වුවත්, මහ බැංකු නොවන දැරීම් 1994 වර්ෂයේ වූ මුළු දැරීම් වලින් සියයට 90.9 සිට 1995 වර්ෂයේදී සියයට 86.9 දක්වා අඩු විය. ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් වෙත පැවති භාණ්ඩාගාර බිල්පත් තොගය ප්‍රාථමික වෙන්දේසි වලින් හා මහ බැංකුවේ ද්විතීය වෙළෙඳ කවුළුවලින් කරන ලද මිලදී ගැනීම් වලින්ද, ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් නොවන වාණිජ බැංකු, සංවර්ධන හා වෙනත් බැංකු, අර්ථසාධක/විශ්‍රාම අරමුදල් සහ වෙනත් අනුමත අරමුදල්, රක්ෂණ සමාගම්, මූල්‍ය සමාගම්, වෙනත් ආයතන පුද්ගලයන් ආදී වෙනත් මූලාශ්‍රයන්ගෙන් කරන ලද භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම් වලින් ද සමන්විත විය.

1995 වර්ෂය අවසානයේදී පැවැති නොපියවූ භාණ්ඩාගාර බිල්පත් වලින් සියයට 66.6 ක් මාස 12 දි කල්පිරෙන බිල්පත් විය. ඉතිරි සියයට 33.4 කල්පිරෙන කාලසීමාව මාස 3 (සියයට17.1), මාස 6 (සියයට 3.8) සහ වෙනත් (සියයට12.5) ආදියෙන් සමන්විත විය.

වර්ෂය තුලදී, මාස 3, මාස 6 සහ මාස 12 භාණ්ඩාගාර බිල්පත් වල බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකයන් පිළිවෙලින් සියයට 13.24 - 19.91, 13.14 - 20.07 සහ 13.68 - 20.54 යන පරාසයන් තුල උච්චාවචනය විය. පසුගිය වර්ෂ 5 සඳහා වූ වාර්ෂිකකරණය කරන ලද බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාත II-15 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත. 1995 වර්ෂයේදී භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම් වෙනුවෙන් ගෙවිය යුතු වන මුළු පොලී ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 18,221.4 ක් විය.

II - 15 සංඛ්‍යා සටහන
වාර්ෂිකකරණය කළ බර තැබූ සමාන්‍ය ඵලදා අනුපාත

වර්ෂය	කල් පිරීමේ කාලය			සමස්ථ සාමාන්‍ය
	මාස 3	මාස 6	මාස 12	
1991	17.15	17.45	18.16	17.62
1992	17.84	18.02	18.83	18.34
1993	19.18	19.09	20.53	20.15
1994	14.32	14.75	15.90	14.89
1995	16.31	17.43	17.63	16.84

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් ණය

1995 වර්ෂය තුලදී, රජයේ රුපියල් ණය කාණ්ඩ 10 ක් නිකුත් කරනලද අතර මේ සඳහා රුපියල් දශ ලක්ෂ 46,715 ක් දායකත්වයක් ලැබුණි. සේවක අර්ථ සාධක අරමුදල සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව මේ සඳහා ප්‍රධාන දායකයන් විය. මෙම සියළුම ණය සියයට 14 ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ නිකුත් කෙරිණි. ප්‍රථම රුපියල් ණය කාණ්ඩ 3 අභිමතය පරිදි ගෙවා නිම කළ හැකි වන අයුරින් අවුරුදු 5-6 දක්වා වූ පරිණත කාලසීමාවක් සහිතව නිකුත් කරනලද අතර, ඉතිරි ණය කාණ්ඩ 7 අවුරුදු 5-7 දක්වාවූ පරිණත කාලයකින් යුක්ත විය. 1995 වර්ෂය තුලදී රුපියල් දශ ලක්ෂ 26,350 ක වටිනාකම ඇති රුපියල් ණය 14 ක් ආපසු ගෙවා නිම කරන ලදී. මේ අනුව රුපියල් දශ ලක්ෂ 20,365 ක් වූ රුපියල් ණය වලට කරන ලද ශුද්ධ දායකවීම් හේතු කොට ගෙන නොපිය වූ මුළු රුපියල් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 157,928 ක් බවට පත්විය. මෙයට රාජ්‍ය බැංකු දෙක ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රජය විසින් 1993 දී නිකුත් කරන ලද රුපියල් දශ ලක්ෂ 24,088 ක් වටිනා දීර්ඝ කාලීන බැඳුම්කරද ඇතුලත් විය. දීර්ඝ කාලීන රජයේ සුරකුම්පත් කෙරෙහි නව ආයෝජකයන් ආකර්ශණය කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් ප්‍රචාරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී.

භාණ්ඩාගාර තැන්පතු සහතික

1990 දී ආරම්භ කරන ලද භාණ්ඩාගාර තැන්පතු සහතික නිකුත්කිරීම මහ බැංකුව විසින් නොකඩවා කරගෙන

යනු ලැබිය. පසුගිය කාලයේදී මෙන්ම මෙම සහතික මාස 6 සහ 12 යන පරිණත කාලයන් සඳහා නිකුත් කරන ලද අතර, අදාල වාර්ෂික ඵලදා අනුපාතිකයන් පිළිවෙලින් සියයට 17.15 සහ සියයට 18.06 යන මට්ටම්වල පැවතුණි. විමර්ශනයට භාජනය වූ වර්ෂය තුලදී අලෙවි කරන ලද භාණ්ඩාගාර තැන්පතු සහතික වල මුහුණත අගය රුපියල් දශ ලක්ෂ 191 ක් වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 65 ක් ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ද ශේෂය වූ රුපියල් දශ ලක්ෂ 126 ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් දෙපාර්තමේන්තුව විසින් ද අලෙවි කරන ලදී. මෙම මූලාශ්‍රයන් දෙකට අදාල ආපසු ගෙවීම්වල වටිනාකම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 66 ක් සහ රුපියල් දශ ලක්ෂ 70 ක් වූ අතර, ඒ අනුව මුළු ගෙවීම් රුපියල් දශලක්ෂ 136 ක් විය. රුපියල් දශ ලක්ෂ 21 ක් වූ පොලී ගෙවීම් ද මේ ප්‍රමාණයට ඇතුලත්ය. 1995 අවසාන වනවිට නොපියවූ භාණ්ඩාගාර තැන්පතු සහතිකවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 200.3 ක් විය.

විදේශ ණය

1995 වර්ෂය තුලදී විදේශ රාජ්‍ය ණය මුළු ආපසු ගෙවීම් ප්‍රමාණය හා පොලී සහ අනෙකුත් ගෙවීම් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 8,502 ක් හා රුපියල් දශ ලක්ෂ 6,262 ක් විය.

1995 වර්ෂය අවසන් වන විට විදේශ ණයෙහි නොපියවූ වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 344,475 ක් වූ අතර, එයින් ද්විපාර්ශවීය සහ බහු පාර්ශවීය මූලයන් වෙතින් ලබාගත් ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 189,601 හා රුපියල් දශ ලක්ෂ 144,636 ක් ලෙස වාර්තා වූ අතර වාණිජ බැංකුවලින් ණයට ගන්නා ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10,239 ක් විය.

ද්විපාර්ශවීය ණයහිමියන් අතරින් ජපාන රජය රුපියල් දශ ලක්ෂ 101,098 ක් නැතහොත් මුළු ද්විපාර්ශවීය ණය ප්‍රමාණයෙන් සියයට 53.3 ක් ප්‍රමාණයක් සපයමින් විශාලතම ණය හිමියා බවට පත්විය. බහු පාර්ශවීය ණය හිමියන් අතරින් ප්‍රමුඛ ණය දෙන්නා වූ ජාත්‍යන්තර සංවර්ධන සංගමය රුපියල් දශ ලක්ෂ 79,190 ක් නැතහොත් මුළු බහුපාර්ශවීය ණයෙන් සියයට 54.8 ක ප්‍රමාණයකට දායක විය.

මහ බැංකු සුරැකුම්පත්

වෙළෙඳපොළෙහි පවතින අධි ද්‍රවශීලතාවය ඇදගැනීමේ පරමාර්ථයෙන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 1995 වර්ෂය තුලදී ද මාස 3 ක පරිණත කාලයක් සඳහා රුපියල් දශලක්ෂ 2,820 ක වටිනාකම ඇති මහ බැංකු සුරැකුම්පත් නිකුතුන් 14 ක් පැවැත්විය. 1994 අවසානයේදී පැවැති රුපියල් දශලක්ෂ 3,740 හා සසඳන විට 1995 අවසානයේදී මහ බැංකු සුරැකුම්පත් වල නොපියවූ ශේෂයක් නොතිබුණි. 1995 වර්ෂය තුලදී කරන ලද මහ බැංකු සුරැකුම්පත් නිකුතුන් 14 න් 12ක්ම සියයට 13.0 ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ නිකුත් කරන ලද අතර, 1995 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී කරන ලද ඉතිරි නිකුතුන් 2 හි වාර්ෂික පොලී අනුපාතිකය සියයට 15.5 ක් විය. 1995 වර්ෂය තුලදී සිදුකරන ලද නිකුතුන්ට අදාල බර තබන ලද සාමාන්‍ය වාර්ෂික ඵලදා අනුපාතිකය සියයට 14.08 සිට 18.16 දක්වා වූ පරාසයක පැවතුණි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ණයකර

1995 මාර්තු මාසයේ දී වටිනාකම රුපියල් දශ ලක්ෂ 500 ක් වූ වර්ෂයකට සියයට 14.5 ක පොලී අනුපාතයක් ඇති රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ණයකර නිකුත් කරන ලද අතර, ඒවායේ පරිණත කාලය අවුරුදු 5 සිට 7 දක්වා විය. මෙම මුළු ප්‍රමාණයම ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් මිලදී ගනු ලැබිය.

ප්‍රාදේශීය කාර්යාල මාතර, අනුරාධපුර හා මාතලේ

ප්‍රාදේශීය කාර්යාලවලට පවරා ඇති සම්ප්‍රදායික මහ බැංකු කාර්යයන්ට අමතරව, 1995 වර්ෂයේදී, මාතර, අනුරාධපුර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල විසින් තවදුරටත් ඔවුන්ගේ සංවර්ධන වැඩකටයුතු නොකඩවා ක්‍රියාත්මක කරනු ලැබිණි. ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රධාන කාර්යයන් වූයේ ව්‍යවහාර මුදල් කටයුතු, චෙක්පත් නිෂ්කාෂණ කටයුතු, දත්ත රැස්කිරීම, ප්‍රතිලාභීන් පුහුණු කිරීමේ වැඩසටහන් මෙහෙයවීම, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු අධීක්ෂණය, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිවලට උපකාරවීම සහ ඒ ඒ ප්‍රදේශවල සංවර්ධන කටයුතුවල නියුතු රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන හා සංවිධාන සමග සම්බන්ධීකරණය වැනි කටයුතුය.

මාතර ප්‍රාදේශීය කාර්යාලය, සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය, දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය සහ දේශීය බිල්පත් යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවීමට අදාල වැඩ කටයුතු කරන ලදී. ප්‍රාදේශීය කාර්යාලය ඉහත සඳහන් ණය යෝජනා ක්‍රමවලට අදාලව සම්මන්ත්‍රණ පැවැත්වූ අතර, එම ව්‍යාපෘති අධීක්ෂණයට හා ණය ආපසු අයකර ගැනීමටද සහාය විය. ප්‍රදේශය තුල රාජ්‍ය දෙපාර්තමේන්තු, වාණිජ බැංකු හා වෙනත් ආයතන විසින් ක්‍රියාවට නංවනු ලැබූ වෙනත් සංවර්ධන වැඩ සටහන් සඳහා ප්‍රාදේශීය කාර්යාල විසින් සම්මන්ත්‍රණ ගණනාවක් සංවිධානය කිරීමෙන්ද, පුහුණු වැඩසටහන් වැඩමුළු මෙන්ම පාසැල් ළමුන්ට අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීමෙන් ද සහාය විය. දිප ව්‍යාප්ත ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීම සඳහා මාතර ප්‍රාදේශීය කාර්යාලය නොකඩවාම කටයුතු කළ බැවින් සියයට 83 ක සමස්ත ආපසු අයවීම් අනුපාතයක් වාර්තා කරන ලදී. වර්ෂය තුලදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු අධීක්ෂණය කිරීමේ කටයුතුද ප්‍රාදේශීය කාර්යාලය විසින් ඉටු කරන ලදී.

අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතනවල සහාය ඇතිව ප්‍රතිලාභීන් 4,106 ක් සහභාගී වූ පුහුණු පාඨමාලා 85 ක් පවත්වන ලදී. ඒ මගින් ව්‍යාපෘතීන්හි කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයට මෙන්ම හැකියාවන් ඇති ව්‍යවසායකයින්ටද අත්‍යවශ්‍ය වූ පුහුණුකිරීම් ලබා දෙන්නට යෙදුණි. අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය, එම දිස්ත්‍රික්කයේ කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුග්‍රහයෙන් ක්‍රියාවට නැංවූ නෑගම්පහ ගම්මාන සංවර්ධන වැඩසටහන සහ තිරප්පනේ හා කැකිරාවේ පශු සම්පත් සංවර්ධන වැඩසටහන් දෙකට අදාල කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. ශිල්පීය හැකියාවන් වර්ධනය කොට ග්‍රාමීය මට්ටමේ සංවිධාන ශක්තිමත් කිරීමත්, ඵලදායීතාවය නැංවීමත් තුලින් ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනයට උපකාරී වීමේ අදහසින් ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී. ප්‍රාදේශීය කාර්යාලය, අනුරාධපුර, පොලොන්නරුව සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල උසස් පෙළ සිසුන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණද පවත්වන ලදී. ප්‍රදේශයේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු අධීක්ෂණයද ප්‍රාදේශීය කාර්යාලය විසින් ඉටුකරන ලදී.

මාතලේ ප්‍රාදේශීය කාර්යාලයද, ණයලාභීන් හා බැංකු කරුවන් පුහුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. වර්ෂය තුලදී, පශු සම්පත් සංවර්ධනය, ලොකු එළු

ගබඩා කිරීම, බතික් කර්මාන්තය හා අර්තාපල් වගාව සම්බන්ධව පුහුණු පාඨමාලා පවත්වනු ලැබුණි. උසස් පෙළ සිසුන්ට ප්‍රයෝජනවත් විය හැකි විවිධ මාතෘකාවලට අදාලව සම්මන්ත්‍රණ අටක්ද, පවත්වනු ලැබුණි. මෙම වැඩසටහන්වලට පුද්ගලයින් 1,288 ක් සහභාගි වූහ. 1995 වර්ෂය තුලදී සුළු පරිමාණ නිෂ්පාදකයින්ගෙන් සත්ව පාලනය, ගොවිපල උපකරණ හා කුඩා පරිමාණ කර්මාන්ත සඳහා වූ ව්‍යාපෘති ණය යෝජනා මාතලේ ප්‍රාදේශීය කාර්යාලයට ලැබුණි. ප්‍රාදේශීය කාර්යාලය එම නිෂ්පාදකයින්ට උපකාරයක් වශයෙන් ව්‍යාපෘති ශක්‍යතා වාර්තා 97 ක් පිළියෙල කරන ලදී. එම වාර්තා සුදුසු කටයුතු සඳහා මූල්‍ය ආයතනවලට ඉදිරිපත් කරන ලදී. ත්‍රිරෝද කුලී රථ සඳහා ණය අයදුම් කළ පුද්ගලයින්ට බැංකු ණය පහසුකම් ලබා ගැනීමේ දී ප්‍රාදේශීය කාර්යාලයේ සහාය ලබා දෙන ලදී. ප්‍රාදේශීය කාර්යාලය මාතලේ ස්වයං රැකියා ලාභීන්ගේ සංගමයට වෙළෙඳ ප්‍රදර්ශන තුනක් පැවැත්වීමට ද උපකාරී විය. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ණය යෝජනා ක්‍රමය, කුඩා තේ වතු හිමියන්ගේ තේ වතු සංවර්ධන ණය යෝජනා ක්‍රමය වැනි ව්‍යාපෘති වලට සම්බන්ධ කටයුතුවලට අදාල කාර්යයන්හි තවදුරටත් නිරත විය. ප්‍රදේශයෙහි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කටයුතු අධීක්ෂණයද එම කාර්යාලය විසින් ඉටු කරන ලදී.

තවද ප්‍රාදේශීය කාර්යාල විසින් ඒ ඒ ප්‍රදේශවල වාණිජ බැංකුවලට ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශණ කටයුතු සඳහා නොකඩවා පහසුකම් සපයන ලදී.

ලේකම් දෙපාර්තමේන්තුව

මූල්‍ය කටයුතු, නෛතික සේවා සැපයුම්, ගමන් සහ අනෙකුත් පොදු සේවා ආදී අංශයනට සම්බන්ධ බැංකුවේ සියළුම පරිපාලනමය සේවාවන් ලේකම් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සපයන ලදී.

විවිධ දෙපාර්තමේන්තුවල නෛතික ගැටළු වලට උපදෙස් දීම වැනි සාමාන්‍යයෙන් සලසනු ලබන සේවා වලට අමතරව 1995 වර්ෂය තුලදී නීති අංශය විසින් පහත සඳහන් පනත් කෙටුම්පත් කිරීමේ කටයුතු වලද නිරත විය.

1. 1995 අංක 26 දරණ මුදල් නීති (සංශෝධන) පනත.
2. 1995 අංක 31 දරණ දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත.
3. 1995 අංක 32 දරණ ලියාපදිංචි කොටස් සහ සුරකුම් (සංශෝධන) පනත.
4. 1995 අංක 33 දරණ බැංකු (සංශෝධන) පනත.

ප්‍රවෘත්ති සහ ප්‍රකාශන

ශ්‍රී ලංකා මහ බැංකුව තොරතුරු එක්රැස් කරන්නකු හා බෙදා හරින්නකු වශයෙන් උසුලන කාර්යභාරය තවදුරටත් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. දේශීය හා විදේශීය සමාජ ආර්ථික සිදුවීම් ආවරණය වන පරිදි, ග්‍රන්ථ, පත්‍රිකා සහ වාර ප්‍රකාශන මහ බැංකුවේ පුස්තකාලය මගින් රැස් කරනු ලැබූ අතර, ආර්ථික සංවර්ධනය පිළිබඳ හැදෑරීමට උනන්දුවක් දක්වන ශිෂ්‍යයින්, ගුරුවරුන්, බැංකුකරුවන්, පර්යේෂකයන් සහ අනෙකුත් අය වෙනුවෙන්, ප්‍රකාශණයට පත් කර ඇති හා නොමැති විෂය කරුණු සැපයීමද කරන ලදී.

පහත සඳහන් මහ බැංකු ප්‍රකාශන ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කැරිණි.

1. වාර්ෂික වාර්තාව 1994 (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි).
2. ආර්ථික සමීක්ෂණය 1995 ප්‍රථම භාගය (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
3. ද්විමාසික ආර්ථික විවරණිකාව - ඉංග්‍රීසි
4. මාසික විවරණිකා (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
5. සමාජ ආර්ථික දත්ත බැදුම 1995 (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
6. ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය දත්ත 1995 - ඉංග්‍රීසි
7. දර්ශන කලාප 1 - (සිංහල)

මීට අමතරව දෙපාර්තමේන්තුව විසින් ස්වකීය සඟරා වන, සටහන, නිව්ස් සර්වේ හා බැංකු පුවත් නොකඩවා පළ කරන ලදී. සිංහල බසින් පළ කෙරෙන සටහන සහ ඉංග්‍රීසි බසින් පළ කෙරෙන නිව්ස් සර්වේ සඟරාව අ.පො.ස.(උසස් පෙළ) ශිෂ්‍යයන්ගේ සහ ගුරුවරුන්ගේ ඉමහත් ඉල්ලුමට ලක් විය. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද අධ්‍යාපනික වැඩ සටහන් අ.පො.ස.(උසස් පෙළ) ශිෂ්‍යයින් හා ගුරුවර ගුරුවරියන්ගේ නොමඳ උද්යෝගිමත් ප්‍රතිචාරයට යොමු විය.

මහජනතාවට තොරතුරු බෙදා හැරීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය, පුවත්පත් නිවේදන, සම්මන්ත්‍රණ සහ පොත් ප්‍රදර්ශණ උපයෝගී කර ගන්නා ලදී. දෙපාර්තමේන්තුවේ වීඩියෝ ඒකකය ශ්‍රී ලංකා මහ බැංකුවේ වැදගත් සිදුවීම් වීඩියෝ පටිගත කිරීමෙහි නියැළිණි. රූප සටහන් හා චිත්‍ර කලා ඒකකය, විෂය පත්‍රිකා, දැන්වීම්පත් සහ ප්‍රකාශණ සැලසුම් කිරීමෙහි නිරත විය.

මහ බැංකු මුද්‍රණාලය විසින් මෙම වර්ෂය තුළ මුද්‍රණ පැවරුම් 380 ක් ඉටු කරන ලද අතර බැංකුවේ මුද්‍රණ කටයුතු වලින් සියයට 90 ක් පමණ සපුරාලීමට සමත් විය.

පර්යේෂණ කටයුතු

අධිපති සහ මුදල් මණ්ඩලයට ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා මග පෙන්වීමට ද මහජනතාවට තොරතුරු සැපයීමටද අවශ්‍ය ආර්ථික හා මූල්‍යමය දත්තයන් රැස්කිරීම, විශ්ලේෂණය කිරීම සහ ආර්ථික පර්යේෂණ පැවැත්වීම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වගකීම වේ. වාර්ෂික වාර්තාව, මාසික විවරණිකාව, 1995 ප්‍රථම භාගය සඳහා වූ ආර්ථික සමීක්ෂණය සහ ආර්ථික විවරණිකාව ප්‍රකාශයට පත්කිරීම, ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් මහජනයාට මූල්‍ය තොරතුරු සතිපතා සැපයීමද මෙම දෙපාර්තමේන්තුවේ වගකීම් විය. 1995 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව මෙම කාර්යයන් සහ වගකීම් වල නිරත විය. එසේම මුදල් අමාත්‍යාංශය අයවැය සැකසීමේදී යොදා ගැනෙන සැප්තැම්බර් 15 දා වාර්තාවද මෙම දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලදී.

මෙයට අමතරව දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර වෙළෙඳ ද්‍රව්‍ය මිළ ගණන් පිළිබඳ සතිපතා සටහන, ආනයන සහ අපනයන පිළිබඳ මාසික වෙළෙඳ දත්ත, ජාත්‍යන්තර වෙළෙඳපොළ වල පවත්වනු ලබන තේ සහ රබර් වෙන්දේසි පිළිබඳ සතිපතා සහ මාසික වාර්තා, මාසික වෙළෙඳ ද්‍රව්‍ය විමසුම් සකස් කරන ලද අතර අමාත්‍යාංශ, අනෙකුත් ආයතන සහ සංවිධාන වල ඉල්ලීම් මත හා මුදල් මණ්ඩලයට තොරතුරු සැපයීම සඳහා, විවිධ ආර්ථික ප්‍රශ්ණ සම්බන්ධ නිරීක්ෂණයන් සහ නිගමනයන් ඇතුලත් වාර්තා සැකසීම ආදී කටයුතු වල ද නියැලුනි. කාර්මික නිෂ්පාදන සම්බන්ධ අර්ධ වාර්ෂික සහ වාර්ෂික සමීක්ෂණයන් ද මෙම වර්ෂය තුල දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අවශ්‍ය දත්තද ස්ථිර පදනමක සපයන ලදී. 1995 වර්ෂයේ මාර්තු සහ

දෙසැම්බර් මාසවල රජය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් සමඟ පවත්වන ලද සාකච්ඡාවන් සම්බන්ධීකරණය කිරීම ද මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන ලදී. එසේම වෙනත් ජාත්‍යන්තර සංවිධාන වලට අවශ්‍ය දත්ත සැපයීම සහ එකී ආයතන සමඟ සම්බන්ධතා සංවිධානය කිරීමද සාමාන්‍ය පරිදි තවදුරටත් කරන ලදී. දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එක්ව "මූල්‍ය වැඩසටහන් හා ප්‍රතිපත්ති" යන මැයින් කලාපීය පාඨමාලාවක් 1995 මැයි මාසයේදී කොළඹ දී පැවැත්විය.

මූල්‍ය මෙහෙයුම් ඒකකය, භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ කමිටුව, ශේෂ්ඨ(?) ගෙවුම්ශේෂ කමිටුව සහ විදේශ විනිමය අනුපාතකමිටුව වැනි ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධ අභ්‍යන්තර කමිටුවල, මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කටයුතු කරන ලදී.

සමීක්ෂණ සහ දත්ත එක්රැස් කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, සමාජ ආර්ථික දත්ත එක් රැස් කිරීමේ සහ ප්‍රකාශයට පත්කිරීමේ කාර්ය අඛණ්ඩව ඉටුකරන ලදී. වර්ෂය තුලදී මිල සහ වැටුප්, ජාතික ගිණුම්, සේවා නියුක්තිය සහ ආනයන යන විෂය ක්ෂේත්‍රයන්හි සමීක්ෂණ පවත්වාගෙන යාම දත්ත රැස්කිරීම අඛණ්ඩව කරන ලදී.

පාරිභෝගික මූල්‍ය සමීක්ෂණය 1996/97

1996/97, පාරිභෝගික මූල්‍ය සමීක්ෂණයට සම්බන්ධ ප්‍රාථමික වැඩකටයුතු දියත් කිරීමට අදාල සැලසුම් වර්ෂය තුලදී නිම කර ඇත. මෙය සමීක්ෂණ මාලාවේ හත්වැන්න වේ

යෝජිත සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ රටෙහි කුටුම්භ අංශයට අදාල සමාජ ආර්ථික තත්ත්වයන්ගේ පූර්ණ දත්ත එක්රැස් කිරීමයි. මෙම සමීක්ෂණය මගින් එක්රැස් කරනු ලබන දත්ත ජනගහනයේ සමාජ ආර්ථික දත්ත වෙනස්වීම් ඇගයීමට පදනම් කර ගැනීමට යොදාගනු ලබයි. මෙම සමීක්ෂණය ජනගහන ලක්ෂණ, සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය, පෝෂණය, ආදායම් ව්‍යාප්තිය, නිවාස සහ අධ්‍යාපනය පිළිබඳ තොරතුරු ලබාගැනීමට ප්‍රධාන මූලාශ්‍රයක් වනු ඇත.

දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල

1978 වර්ෂයේදී දියත් කළ දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල පුරා අවුරුදු 17ක් සම්පූර්ණ කරමින් 1995 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක වුණි. මෙම සමීක්ෂණය මගින් දිවයින පුරා විසිරී පවතින තෝරාගත් මධ්‍යස්ථානයන් මගින්, පාරිභෝගික අයිතමයන්ගේ හා කෘෂිකාර්මික යෙදවුම්වල මිල ගණන්, භාණ්ඩ විශාල සංඛ්‍යාවක නිෂ්පාදන මිල ගණන් සහ සංවිධානාත්මක නොවන අංශයේ වී, තේ, රබර් හා කුඩා පරිමාණ ඉදිකිරීමේ අංශයේ දෛනික වැටුප් පිළිබඳ දත්තයන් ක්‍රමානුකූල පදනමක් යටතේ එක්රැස් කිරීම නොකඩවා සිදු කෙරුණි. කල්තියා අදහසක් ලබා ගැනීමේ මූලික අරමුණෙන්, නිෂ්පාදන උපනතීන් හා නිෂ්පාදන මිල ගණන් උච්චාවචනය වීමේ හේතු සම්බන්ධ අමතර තොරතුරු එක්රැස් කිරීම සඳහා මෙම වැඩපිළිවෙලෙහි විෂය පථය පුළුල් කරන ලදී. මෙම වැඩ පිළිවෙල යටතේ රැස්කරන ලද දත්ත මත "මිල සහ වැටුප් පිළිබඳ සංඛ්‍යාන" නම් වූ වාර්ෂික ප්‍රකාශනයක් ප්‍රකාශයට පත්කරන ලදී.

ජාතික ගිණුම්

ජාතික ආදායම් ගිණුම් ඇස්තමේන්තු කිරීම සම්බන්ධ කටයුතු නොකඩවා ක්‍රියාත්මක විය. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව ප්‍රාථමික සහ ද්විතියික යන අංශ දෙකෙන්ම දත්ත එක්රැස් කිරීමේ කාර්යයෙහි නිරත විය. ජාතික ආදායම් පිළිබඳ කාර්තුගත ඇස්තමේන්තු සකස් කිරීමට නිරන්තරයෙන් දත්ත එක්රැස් කිරීම සිදුවිය. වඩාත් ආසන්න පාද වර්ෂයක් පදනම් කර, ජාතික ආදායම් ගිණුම් ඇස්තමේන්තු ක්‍රියාවලිය ප්‍රතිශෝධනය කිරීම සඳහා මූලික වැඩ කටයුතු ආරම්භ කරන්නට යෙදුණි. එක්සත් ජාතීන්ගේ සංඛ්‍යාන කාර්යාලය මගින් 1993 ප්‍රසිද්ධියට පත්කරන ලද ජාතික ගිණුම් පිළිබඳ ප්‍රතිශෝධන ක්‍රම වල දක්වා ඇති ප්‍රතිශෝධන උපදෙස් වලට අදාල වූ සංශෝධන කටයුතු 1995 වර්ෂයේදී තවදුරටත් කෙරිණ.

ආනයන සුපරීක්ෂණය

ආනයන පිළිබඳව පුරෝකථනය කිරීමේ අරමුණු ඇතිව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු වෙතින් ලැබෙන ණයවර ලිපි පිළිබඳ තොරතුරු මගින් රටෙහි ආනයන පිළිබඳ සුපරීක්ෂණය කිරීම දිගටම සිදුකරනු ලැබීය.

සේවා නියුක්ති සංඛ්‍යා

රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය සභා වල සහ සමූපකාර අංශයේ සේවානියුක්ති උපනතීන් තහවුරු කිරීමේ අරමුණෙන්, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව වූ වාර්ෂික සමීක්ෂණය දෙපාර්තමේන්තුව විසින් 1995 වර්ෂයේදී ද නොකඩවා සිදුකරනු ලැබීය. පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ ඇස්තමේන්තු ගත තොරතුරු වල හිඟය නිසා, සංවිධිත පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ උපනතීන් හා ප්‍රධාන සංවර්ධනයන් හඳුනාගැනීමේ අරමුණෙන් සේවක අර්ථ සාධක අරමුදල සහ වෙනත් අර්ථ සාධක අරමුදල්වල පාලන වාර්තා සහ වාණිජ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති ආයතනවල තොරතුරු එක්රැස් කරනු ලබීය.

ප්‍රකාශන

"ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත" සහ "ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාන" නමින් වාර්ෂික ප්‍රකාශන දෙකක් දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරන ලදි. මේ මගින් සමාජ ආර්ථික විචල්‍යයන් පිළිබඳ පූර්ණ තොරතුරු සපයනු ලබයි.

දත්ත සැකසුම්

මහ බැංකුව තුල නවීන තොරතුරු තාක්ෂණ පරිසරයක් නිර්මාණය කිරීමේ කාර්යයේ තවත් පියවරක් ඉදිරියට තබමින්, විවිධ දෙපාර්තමේන්තුවල භාවිතය සඳහා කුඩා පරිගණක 100 ක් වර්ෂය තුලදී මිලදී ගන්නා ලදී. බැංකුව තුල පරිගණක ජාලයක් බිහි කිරීම සඳහා අවශ්‍ය රාමුවක් ගොඩනැංවීමේ අරමුණින් එක් එක් පරිගනක ඒකාබද්ධ කර විමධ්‍යගත ක්‍රමයක් ඇති කිරීම සඳහා වර්ෂය තුලදී සැලසුම් සකස් කරන ලදී. දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව තුල දසක තුනක පමණ කාලයක් පුරා ගොඩනංවන ලද දැනට පවත්නා යල් පැන ගිය මධ්‍යගත ක්‍රමයෙන් කැපී පෙනෙන බැහැරවීමක් මෙම වැඩ පිළිවෙල සංස්ථාපනය කිරීමෙන් අපේක්ෂා කෙරේ.

සැලසුම් කරන ලද විමධ්‍යගත ක්‍රමය සඳහා උචිත සහ භාවිතා කරන්නාට පහසු මෘදුකාංග සකස් කිරීමේ කටයුතුවල මෙම දෙපාර්තමේන්තුව නියුක්ත විය. සූචි තොරතුරු සඳහා කඩිනම් පිවිසුමක් සැපයිය හැකි තොරතුරු සංරක්ෂණ ක්‍රමයක් පුස්තකාලය වෙනුවෙන් සකස් කරන ලද අතර, නාමාවලි දත්ත පරිගණක දත්ත බවට පත්කිරීමේ සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. කුඩා පරිගණක භාවිතා කර පුද්ගල තොරතුරු තබාගැනීමේ ක්‍රමයක් සහ සේවක නිවාඩු සහ පැමිණීම්

වාර්තා සකස් කිරීමේ ක්‍රමයක් පරිපාලනමය කටයුතු වලදී භාවිතා කිරීම සඳහා නිර්මාණය කර සියළුම දෙපාර්තමේන්තුවල ස්ථාපනය කරන ලදී.

ශ්‍රී ලංකා ස්වයංක්‍රීය චෙක්පත් නිෂ්කාශනාගාරය

විමර්ශනයට ලක්වූ වර්ෂය තුළදී ශ්‍රී ලංකා ස්වයංක්‍රීය චෙක්පත් නිෂ්කාශනාගාරයේ දිනකට චෙක්පත් 150,000 - 300,000 අතර ප්‍රමාණයක් සඳහා නිෂ්කාශන පහසුකම් සැලසිය හැකි නවීන යන්ත්‍ර පද්ධතියක් සවිකරනු ලැබිය. මෙම නව යන්ත්‍රවල අවශ්‍යතාවය ඇති වූයේ, දිනකට 40,000 - 50,000 ක පමණ චෙක්පත් ප්‍රමාණයක් නිෂ්කාශනය සඳහා සැකසුණු පරණ යන්ත්‍ර වලින් සාමාන්‍ය වශයෙන් දිනකට 100,000 කට අධික ප්‍රමාණයක් නිෂ්කාශනය කිරීමට සිදුවී තිබීමයි. නිෂ්කාශනාගාරය මගින් දෛනිකව නිෂ්කාශනය වන චෙක්පත් ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් නිරතුරුවම ඇතිවූ යාන්ත්‍රික දෝෂයන් නිසා නිෂ්කාශන කටයුතු වලට බාධාවීම හේතුවෙන් බැංකුවලට නොයෙක් අපහසුතා ඇතිවූ අතර එමගින් සේවක ප්‍රශ්න ද උද්ගත විය. නව යන්ත්‍ර පද්ධතිය 1995 ජූනි මස සිට ක්‍රියාත්මක විය.

කොළඹ පිහිටි නිෂ්කාශනාගාරයේ නවීකරණ කටයුතු වලින් පසු එහි පරණ යන්ත්‍ර එතැනින් ඉවත් කොට මහනුවර නගරයේ ස්ථානයක සවිකෙරෙන අතර එමගින් හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනවත් විය හැකි අතිරේක නිෂ්කාශනාගාරයක පහසුකම් මෙන්ම අඩු චෙක්පත් සංඛ්‍යාවක් නිෂ්කාශනය කළ හැකි ප්‍රාදේශීය නිෂ්කාශනාගාරයක් ද ඇතිවනු ඇත. මෙම කර්තව්‍ය 1996 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය.

ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශනාගාරය මගින් එයට සම්බන්ධ නොවූ අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය, සෘජු හර ගෙවීම් ක්‍රමය ද ඇතුලත් වන සේ පුළුල් කරනු ලැබිණි. සෘජු හර ගෙවීම් ක්‍රමය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සහ රක්ෂණ සමාගම් වැනි බිල්පත් නිකුත් කරන ආයතන වලට සිය මාසික ලැබීම් කෙලින්ම පාරිභෝගිකයන්ගේ ගිණුම් වලින් හර කරගෙන බිල්පත් නිකුත්කල ආයතනයට එම මුදල පියවා දැමීමට බලය දීමට පාරිභෝගිකයාට හැකිවෙයි. මේ ක්‍රමය මගින් දැනට පවත්නා ක්‍රමයට අනුව මාසිකව හෝ සමීප කාලාන්තරව සිදුවිය යුතු ලිපි ගණුදෙනු, ලියකියවිලි කටයුතු ආදිය අවම කෙරෙන අතර බිල්පත් නිකුත් කරන ආයතන වල ලය එකතු කිරීමේ පිරිවැය අවම වනවා මෙන්ම පාරිභෝගික පහසුකම් වැඩි කිරීමට උපකාරී වේ. මේ නිසා බැංකු අරමුදල් හුවමාරු කටයුතු වලදී දියුණුවක් ඇතිවන අතර හුවමාරු වේගය හා නිරවද්‍යතාවය වැඩිවීම එයට හේතුවෙයි.

සෘජු හර ගෙවීම් ක්‍රමයේ සාර්ථකත්වය බොහෝදුරට රැඳී පවත්නේ බිල්පත් නිකුත් කරන ආයතනවල උනන්දුව සහ සිය පාරිභෝගිකයින් වෙත නොයෙක් වාසි සැලසීම් මගින් ඔවුන් මෙයට සම්බන්ධ කර ගැනීමට උනන්දුවීමෙන් මෙම ක්‍රමය වෙළෙඳපොළට හඳුන්වා දෙන ආකාරයන් අනුවය.

පුහුණු කිරීම්

මහ බැංකුවේ නිලධාරීන් අධ්‍යාපනික හා අධ්‍යාපනික නොවන ක්ෂේත්‍ර වල පුහුණු කිරීමේ කටයුතු 1995 වර්ෂය තුළදී ද පුහුණු වැඩකටයුතු දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරන ලදී. අධ්‍යාපනික පුහුණු කිරීම් පිළිගත් විශ්ව විද්‍යාලවල දී ආර්ථික විද්‍යාව හා ඊට සමාන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට අදාල විය. ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි සඳහා නිලධාරීන් ලියාපදිංචි කිරීම මෙම වර්ෂය තුල ද සිදු කෙරිණි. මෙම වර්ෂය තුළදී ශාස්ත්‍රපති පාඨමාලාවන් සඳහා නිලධාරීන් 8 දෙනෙකුද ආචාර්ය උපාධි සඳහා එක් නිලධාරියෙකුද එතෙර යන ලදී. ශ්‍රී ලංකාවේ පවත්වන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා නිලධාරීන් 9 දෙනෙකු සඳහා අධ්‍යයන නිවාඩු 1995 වර්ෂය තුළදී ලබාදෙන ලදී. ව්‍යාපාර කටයුතු හා මූල්‍ය සහ පරිපාලන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ජනමාධ්‍ය සහ ජනසන්නිවේදන ඩිප්ලෝමාව සහ බැංකු කටයුතු හා කළමනාකරණ ඩිප්ලෝමාව මෙම දේශීය පාඨමාලාවන් විය.

අධ්‍යාපනික නොවන දේශීය මෙන්ම විදේශීය කෙටිකාලීන පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදී පුහුණු කටයුතු, බැංකුවේ විශේෂිත ක්ෂේත්‍රයන්ට අදාල විය. 1995 වර්ෂය තුළදී කෙටිකාලීන පුහුණු පාඨමාලාවන් සඳහා බැංකු නිලධාරීන් 76 දෙනෙකු එතෙර, ගිය අතර, නිලධාරීන් 263 දෙනෙක් මෙරට ආයතන මගින් පවත්වන ලද පුහුණු වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගි වූහ. නිලධාරීන් 583 දෙනෙක් ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වන ලද පුහුණු වීම් සඳහා සහභාගී වූහ.

මාණ්ඩලික පංතියේ ශිෂ්‍යත්ව සඳහා විභාග සහ සමහර සේවක කාණ්ඩ උසස් කිරීම් පරීක්ෂණ පැවැත්වීම තවදුරටත් මෙම දෙපාර්තමේන්තුව මගින් කරගෙන යන ලදී. මාණ්ඩලික පංතියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය 1995 දෙසැම්බර් මසදී පැවැත්විණි.

කළමණාකාරිත්ව විගණන

කළමණාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව සිය වැඩසටහන්වලට අනුකූලව 1995 වර්ෂය තුළදී මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තුවල විගණන කාර්යයන්හි නිරත විය. මෙම විගණන කාර්යයන් ඉටුකිරීමේදී අභ්‍යන්තර පාලන ක්‍රම තුල ඇති දුර්වලතා හුවා දැක්වීමට හා ක්‍රම විගණන පිළිබඳ අවධානය යොමු කරන ලදී.

සාමාන්‍ය විගණන කාර්යයන්ට අමතරව මෙම වර්ෂය තුලදී බැංකු කළමනාකාරිත්වය විසින් පවරන ලද විශේෂ අධ්‍යයන හා සමීක්ෂණ කටයුතු ද කරන ලදී. මෙම අධ්‍යයනයන් පහත සඳහන් වේ.

(අ) බැංකු රියදුරු සේවක සංඛ්‍යාව පිළිබඳව සමාලෝචනය කිරීම

(ආ) I හා II සුළු සේවක ශ්‍රේණිවල සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම.

(ඇ) බැංකුවේ දුරකථන සේවක සේවිකාවන්ගේ සේවක සංඛ්‍යාව තීරණය කිරීම.

(ඈ) බැංකුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් තක්සේරු කිරීම.

(ඉ) ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ වැඩ කටයුතු පරීක්ෂා කිරීම.

(ඊ) මහ බැංකුවේ පර්යේෂණ පුස්තකාලයේ පොත්පත් භෞතික පරීක්ෂණයට ලක් කිරීම.

(උ) ආරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගිනි අවි හා පතරොම් ආදිය භෞතික පරීක්ෂණයට ලක් කිරීම.

පරිශ්‍ර

මහ බැංකු පරිශ්‍ර උසස් මට්ටමකින් පවත්වාගෙන යාමට අවශ්‍ය එදිනෙදා සිදුකෙරෙන සාමාන්‍ය නඩත්තු වැඩවලට අමතරව, පරිශ්‍ර දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ඉදිකිරීම් ව්‍යාපෘති, 1995 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලදී.

මහ බැංකුවට යාබද නව ගොඩනැගිල්ල

1994 අගෝස්තු මස අරඹන ලද මහ බැංකු නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 1995 වර්ෂය තුළදී ද තවදුරටත් කරගෙන යන ලදී. මෙම නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 1997 අවසන් වීමට පෙර නිම කිරීමට අදහස් කෙරේ. ඉදිකිරීම් කටයුතු අවසන්වූ පසු දැනට කුලියට ගෙන ඇති ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන මහ බැංකුවේ දෙපාර්තමේන්තු සියල්ලම මෙම නව ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාමට හැකිවනු ඇත.

රාජගිරියෙහි නව දෙමහල් ගොඩනැගිල්ල

ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවලට නේවාසිකව සහභාගිවන අයට නැවතීමේ පහසුකම් සැපයීම සඳහා ඉදිකරන, ආසන්න වශයෙන් වර්ග අඩි 7,725 ක මුළු බිම් ප්‍රමාණයකින් යුත් මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියර කරා ලඟා වී ඇත.

වන්දනා නිකේතනය - කතරගම

කතරගම පිහිටුවීමට අදහස් කරන කාමර 20 කින් යුත් වන්දනා නිකේතනයේ ඉදිකිරීමේ මූලික කටයුතු, 1995 වර්ෂය තුල ක්‍රියාත්මක විය.

සුභසාධන

1995 වර්ෂය තුලදී සුභසාධන දෙපාර්තමේන්තුව විසින් විවිධ සුභසාධන පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින්ට තවදුරටත් ලබා දෙන ලදී. මෙම පහසුකම් වලට නිවාස ණය, කාර්ය මණ්ඩල සුභසාධන ණය, වාහන ණය, අර්ථ සාධක අරමුදල් ණය, අනුමත සීමාවන් යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම, සහනදායි මිලට ආපනශාලා පහසුකම් සැපයීම, බැංකු පරිශ්‍රය තුලදී වෛද්‍ය සායන සේවාවන් සැපයීම, බස් සහ දුම්රිය වාර ප්‍රවේශපත්‍ර වෙනුවෙන් වැය වන මුදලෙන් සියයට 75 ක් ගෙවීම ආදී සහනදායි ණය යෝජනා ක්‍රමයන් සහ සේවාවන් ඇතුලත්ය. 1995 වර්ෂය තුලදී මෙම සුභසාධන පහසුකම් සමහරක් සැළකිය යුතු ප්‍රමාණයකට පුළුල් කරන ලදී. මහ බැංකු ආපන ශාලාව මගින් සේවකයින් සඳහා සහනදායි මිලට ආහාර පාන සැපයීමට අමතරව නොමිලයේ තේ පැන් සැපයීමද කරන ලදී. එසේම, මහ බැංකු නිල උත්සව සඳහා ආහාර පාන සැපයීමද ආපන ශාලාව මගින් කරන ලදී.

බැංකු වෛද්‍ය සායනය සඳහා වෛද්‍යවරයෙක් සහ සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් සිටී. රෝග හඳුනා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වන වෛද්‍ය පරීක්ෂණ මහ බැංකු වෛද්‍ය පරීක්ෂණාගාරයේදී කරන ලද අතර, අත්‍යවශ්‍ය බෙහෙත් තොග මහ බැංකු ඖෂධාගාරයේ තබා ගනිමින්, පිරිවැය මිලට සේවකයනට අලෙවි කරන ලදී.

ආරක්ෂක සේවා

1995 වර්ෂය තුල මෙම දෙපාර්තමේන්තුව විසින් කරන ලද කාර්යය වූයේ බැංකු ප්‍රධාන ගොඩනැගිල්ලට හා රාජගිරියේ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයීය ගොඩනැගිල්ලටත්, කාගෝ බෝට් ඩිවලොප්මන්ට් කම්පැණි ගොඩනැගිල්ලේ, සෙලින්කෝ මන්දිරයේ සහ ෂාලිමාර් ගොඩනැගිල්ලේ පිහිටුවා ඇති බැංකුවේ දෙපාර්තමේන්තුවලටත් ආරක්ෂාව සැපයීමයි. මීට අමතරව, අනුරාධපුරය, මාතර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාලවලටද, කැළණියේ හා ලෙයාඩ්ස් බ්‍රෝඩ්වේහි පිහිටා ඇති ගබඩා වලටද, කතරගම සංචාරක බංගලාවටද, නුවරඑළියේ නිවාඩු නිකේතනයටද, මහනුවර මෙන්ම නව ගොඩනැගිල්ල ඉදි කරන බිම් කොටස් වලටද ආරක්ෂාව සපයන ලදී. අධිපතිතුමාගේ නිල නිවාසයට ද ආරක්ෂාව සපයනු ලැබිය. අධිපතිතුමාට සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විසිත්ත කළ විදේශීය නියෝජිතයින්ට පෞද්ගලික ආරක්ෂාව සැපයීමද දෙපාර්තමේන්තුවේ වගකීම විය.

මෙම දෙපාර්තමේන්තුව විසින් මුදල් හා රත්තරන් ගෙන යැමේදී ඒවා භාරව යැමේ රාජකාරිය පොලිසියේද සහයෝගය ඇතිව ඉටු කරන ලදී.

දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන්ගේ දැනුම හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම පිණිස, ආරක්ෂක හා ගිනි නිවීමේ කටයුතු සම්බන්ධව පුහුණු පාඨමාලා කීපයක් කොළඹ ගිනි නිවීමේ හමුදාවේ සහය ඇතිව පැවැත්වීම පිණිස ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයට මෙම දෙපාර්තමේන්තුව මගින් සහාය දෙන ලදී.

කාර්ය මණ්ඩල පුවත්

1995 වර්ෂයේදී අධිපති එච්. බී. දිසානායක මහතා පහත සඳහන් රැස්වීම්වලට සහභාගි විය.

1) මැලේසියාවේ පවත්වන ලද 32 වැනි ඇප්‍රිකා විධායක මණ්ඩල රැස්වීම සහ 10 වැනි ඇප්‍රිකා අධිපතිවරුන්ගේ රැස්වීම.
2) ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් නුවර පවත්වන ලද ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්ෂික රැස්වීම.
3) පිලිපිනයේ මැනිලා නුවර පවත්වන ලද අග්නිදිග ආසියානු මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය.
4) ජැමෙයිකාවේ කිංස්ටන් නුවර පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩල මුදල් ඇමතිවරුන්ගේ රැස්වීම.

පත්වීම්

1 මුදල්, ක්‍රමසම්පාදන, ජනවාර්ගික කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් එම අමාත්‍යාංශයට මුදාහැර සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ඒ. එස්. ජයවර්ධන මහතා 1995 නොවැම්බර් 15 දින මහ බැංකු අධිපති පදවියට පත් කරන ලදී.

2. එස්. ඊස්පරදාසන් සහ පී. අමරසිංහ යන මහත්වරුන් 1995 පෙබරවාරි 09 දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධිපතිවරුන් වශයෙන් පත් කරන ලදී.

3. එස්. පට්ටිවිදාන මහතා 1995 පෙබරවාරි 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

4. ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ, ආචාර්ය එල්. එල්. ගුණරත්න මහතා 1995 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිපති විසින් නම් කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ විශේෂ නිලධාරි වශයෙන් පත් කරන ලදී.

5. නියෝජ්‍ය ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ, ආර්. ඒ. ජයතිස්ස මහතා 1995 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

6. නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී, ඒ. ෂන්මුගසාමි මහතා 1995 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

7. ආර්ථික පර්යේෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආචාර්ය ඩී. එස්. විජේසිංහ මහතා 1995 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක සංඛ්‍යාන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

8. ආර්ථික පර්යේෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආචාර්ය ශ්‍රී. විදානපතිරණ මහතා 1995 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

9. මූල්‍ය අංශ මෙහෙයුම් ඒකකයට අනුයුක්තව සිටි නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධාන, වයි. එම්. ඩබ්ලිව්. බී. වීරසේකර මහතා 1995 අගෝස්තු මස 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

10. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ඩී. බෝයගොඩ මහතා 1995 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

11. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අතිරේක අධ්‍යක්ෂ, ජේ. ට්. ඩී. කරුණාරත්න මහතා 1995 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

12. වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී, එම්. රාමනාදන් මහතා 1995 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ආයතන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

13. වැඩ බලන අතිරේක ආයතන අධ්‍යක්ෂ, එම්. එස්. සිරිපාල මහතා 1995 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී වශයෙන් පත් කරන ලදී.

14. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂ, එම්. ඩී. ඩී. ගුණතිලක මහතා 1995 සැප්තැම්බර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී වශයෙන් පත් කරන ලදී.

15. නියෝජ්‍ය ලේකම් (නීති), පී. ටී. පෙරේරා මහත්මිය 1995 සැප්තැම්බර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

16. ආර්ථික පර්යේෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආචාර්ය ඒ. ජී. කරුණාසේන මහතා 1995 සැප්තැම්බර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

17. ආර්ථික පර්යේෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආචාර්ය පී. බී. ජයසුන්දර මහතා 1995 සැප්තැම්බර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

18. වැඩබලන අතිරේක සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී, එම්. එස්. සිරිපාල මහතා 1995 සැප්තැම්බර් 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක සුභසාධන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

විශ්‍රාම ගැනීම් / ඉල්ලා අස්වීම්

1. දෙපාර්තමේන්තු ප්‍රධාන, ආචාර්ය ඒ. සී. රන්දෙණි මහතා 1995 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවයෙන් ඉල්ලා අස්විය.

2. විධායක අධ්‍යක්ෂ, ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු මහතා 1995 අප්‍රේල් 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවයෙන් ඉල්ලා අස්විය.

3. නියෝජ්‍ය අධිපති, ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු මහතා 1995 අප්‍රේල් 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

4. විධායක අධ්‍යක්ෂ, ආචාර්ය ඩබ්. හෙට්ටිආරච්චි මහතා 1995 සැප්තැම්බර් 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

5. එච්. බී. දිසානායක මහතා 1995 නොවැම්බර් 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිපති පදවියෙන් ඉල්ලා අස්විය.

6. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, ඒ. එස්. ජයවර්ධන මහතා 1995 නොවැම්බර් 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

මුදාහරිනු ලැබ සිටි නිලධාරීන්
(1995 දෙසැම්බර් 31 වන දිනට)

අමාත්‍යාංශවල, රජයේ දෙපාර්තමේන්තුවල හා රාජ්‍ය සංස්ථාවල තනතුරු සඳහා පහත නම් සඳහන් නිලධාරීහු මුදාහරිනු ලැබ සිටියහ.

1. ආචාර්ය ඩී. ජේ.ජී. ප්‍රනාන්දු - මහජන බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂ වශයෙන් මුදල් අමාත්‍යාංශය වෙත.

2. ඩබ්. ඒ. ඩී. ඊ. වීරසිංහ මහතා සහ සී. ද. එස්. ජයවර්ධන මහතා - මුදල් අමාත්‍යාංශය වෙත.